2024

# වාර්ෂික කාර්යසාධන වාර්තාව



රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2024

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

*අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වන 130 ට අදාළ සමස්ත මූල්‍ය වාර්තාව රාජ්‍ය පරිපාලන අංශයෙහි (පරිච්ඡේද 03) පිටු අංක **30-36** යටතේ ඇතුළත් කර ඇති අතර විගණන වාර්තාව අවසානයෙහි අමුණා ඇත.*


| | රාජ්‍ය පරිපාලන අංශය | ස්වදේශ කටයුතු අංශය | පළාත් සභා සහ පළාත් පාලන අංශය |
|---|---|---|---|
| | නිදහස් චතුරස්‍රය කොළඹ 07<br>ශ්‍රී ලංකාව | “නිල මැදුර”<br>ඇල්විටිගල මාවත<br>නාරාහේන්පිට<br>කොළඹ 05<br>ශ්‍රී ලංකාව | අංක 330<br>ආචාර්ය ද කොල්වින් ආර්.ද සිල්වා මාවත<br>(යූනියන් පෙදෙස)<br>කොළඹ 02<br>ශ්‍රී ලංකාව |
| | 011-2696211/13,<br>011- 2166000 | 011 - 2050450 | 011 – 2 305326 / 327,<br>2303280 |
| | 011–2695279 | 011 - 2551071 | 011 - 2 699 720 |
| | information@pubad.gov.lk | info@moha.gov.lk | info@pclg.gov.lk |
| | www.pubad.gov.lk | www.moha.gov.lk | www.mpclg.gov.lk |

## <u>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය</u>



ශ්‍රී ලංකාවේ සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය ලෙස දැයට විශිෂ්ට රාජ්‍ය සේවයක් ලබාදීමේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ඉතා කැපවීමෙන් කටයුතු කරමින් පවතී. එමෙන්ම මෙරට රාජ්‍ය සේවයට අදාල ජාතික ප්‍රතිපත්ති සම්පාදනයෙන් සහ එම ප්‍රතිපත්ති නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීමේ ප්‍රධාන වගකීම දරන්නේ ද අප අමාත්‍යාංශයයි. එහිදී සමස්ත රාජ්‍ය සේවකයන් විසින් සිදුකරනු ලබන කාර්යය ප්‍රශංසනීයව සිහිපත් කළ යුතුය.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, මානව සම්පත් කළමණාකරණය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව යන අප අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු සහ ආයතන මෙන් ම එවකට අමාත්‍යාංශයට අයත්ව තිබූ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිසම සහ ජාතික භාෂා අධ්‍යයන පුහුණු ආයතනය යන ආයතනද විශිෂ්ට සහ පුළුල් රාජ්‍ය සේවාවක් සැපයීමට නිරන්තරයෙන් මැදිහත්වී කැපවෙයි. විශේෂයෙන්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සංස්කෘතික වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම සිදුකෙරුණේ කාර්යක්ෂම සහ ඵලදායි සේවා සැපයීම ප්‍රධාන අරමුණ බවට පත්කරගනිමිනි. එහි ලා රාජ්‍ය සේවක බලකායේ සාධනීය දායක්තවයක් ලැබුණු බව සඳහන් කළ යුතුමය. තවද රාජ්‍ය සේවා සැපයීම් තවදුරටත් කාර්යක්ෂම කරගැනීම පිණිස ගතවූ වසරේදී ඒකාබද්ධ සේවා සහ දීප ව්‍යාප්ත සේවාවන්හි වූ පුරප්පාඩු සඳහා නව රාජ්‍ය සේවකයන් 1,312 ක් බඳවා ගැනීම සිදුකරන ලදී. එතැනින් නොනැවතී ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති හා කළමනාකරණ සේවාවන්හි III ශ්‍රේණියේ නවක නිලධාරින් සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට මෙම වසරේදී බඳවාගත් නවක නිලධාරින් සඳහා සේවාරම්භක පුහුණු පැවැත්වීමට ද අමාත්‍යාංශයට හැකියාව ලැබිණ. කාර්යක්ෂම, පාරදෘශ්‍ය සහ ඵලදායි රාජ්‍ය සේවාවක් ගොඩනැගීමටද එම පුහුණු වීම් සහ කාර්ය සාධන ව්‍යාපෘති ඉවහල් වෙයි. තවද අප විසින් රාජ්‍ය සේවක ආරවුල් විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සමඟ එක්ව බේරුම්කාරක යාන්ත්‍රණයක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ. සේවා ස්ථානවල කාර්යය ප්‍රතිසංස්කරණය කරමින් උසස් ගුණාත්මකභාවයකින් යුත් රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම මෙහි අපේක්ෂාවයි.

පොදු ජනතාවට කාර්යක්ෂම හා ගුණාත්මක රාජ්‍ය සේවාවක් බිහිකිරීමේ අරමුණින් ඇපකැපවී කටයුතු සිදුකරන අමාත්‍යාංශ ලේකම්තුමන් ඇතුළු සමස්ත රාජ්‍ය සේවක බලකායට හෘදයාංගම ස්තුතිය පුදකර සිටින අතර පසුගිය වර්ෂයේදී අමාත්‍යාංශයේ කාර්යයන් වෙනුවෙන් උරදුන් එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශයන්හි රාජ්‍ය අමාත්‍යවරුන් ද සිහිපත් කරනු කැමැත්තෙමි. හුදෙක් රාජ්‍ය සේවකයන් පමණක් නොවී ජනතාවගේ සිතුම් පැතුම් හඳුනාගත්තවුන් ලෙස නව සංකල්ප ඔස්සේ ජනතාවට ගරු කරන, ජනතාව ද ප්‍රිය කරන රාජ්‍ය සේවයක් තුළින් පොහොසත් රටක් ගොඩනැගීමට එක්වී කටයුතු කරමු.

**ආචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න (පා.ම.)**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය**

## පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය



ශ්‍රී ලාංකික ප්‍රජාවගේ ජීවන පැවැත්ම සඳහා පළාත් පාලන ආයතන විසින් සුවිශේෂී සේවාවන් රාශියක් මහජනතාව වෙත ළඟාකර දීමේ මෙහෙවර ඉටු කරනු ලබයි.

පළාත් පාලන ආයතන මහජනතාවට සුවිසල් සේවාවක් සලසන අතරම ආදායම් ඇතුළු විවිධ වත්කම් උපයමින් මහජන සේවාවන් පවත්වාගෙන යාමට ප්‍රයත්න දරයි. ඔවුන්ගේ ආදායම් මාර්ග තව දුරටත් විධිමත් හා පුළුල් කිරීමට, පොදු යටිතල පහසුකම් නඩත්තු කිරීමට සහ පොදු උපයෝගී සේවාවන් මැනවින් පවත්වා ගනිමින් ජනතා සේවය සැලසීමට නූතන තාක්ෂණය මුසුකොට ධාරිතා සංවර්ධනය කරමින් මහජනයාට සමීප සහ විනිවිදභාවයෙන් යුතුව සේවා සපයන ආයතන ලෙස ක්‍රියාකිරීම දිරි ගැන්වීමට අවශ්‍ය වැඩපිළිවෙල අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට වග බලාගැනීම අපගේ වගකීමයි.

"ක්ලීන් ශ්‍රී ලංකා" (Clean Sri Lanka) ව්‍යාපෘතිය යථාර්තයක් කරනු වස් පළාත් පාලන ආයතනවලට ඉමහත් කාර්යභාරයක් පැවරී ඇත. ඒ අනුව ඩිජිටල්කරණයට අවස්ථා සලසමින් ආදායම් ඉපයීමත්, සේවා සැපයීමත් විනිවිද භාවයෙන් යුතුව කාර්යක්ෂමව හා සමාජ, ආර්ථික හා පාරිසරික යහපැවැත්ම තහවුරු වන ආකාරයට පළාත් පාලන ආයතන කාර්යභාරය ඉටු කිරීම අපගේ අභිප්‍රායයි. කසල කළමනාකරණය, ග්‍රාමීය මාර්ග, ප්‍රජා ජලසම්පාදන කටයුතු සහ අනෙකුත් පළාත් පාලන සේවාවන්ට අදාල යටිතලපහසුකම් තිරසාරව පවත්වාගනිමින් ජනතාවට සමීපව ඔවුන්ද සහභාගී කරගෙන අනාගත සංවර්ධන තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේ යුගයක් කරා පළාත් පාලන ආයතන ප්‍රවිෂ්ඨ වී ඇත.

මේ වන විට සියලු පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්ගෙන් තොරව පවත්වාගෙන යනු ලැබුවද, ඒ වෙත පැවරෙන වගකීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට පළාත්සභා හා පළාත් පාලන ආයතනවල සියලු නිලධාරීන් ලබා දෙනු ලබන නොමඳ සහයෝගය පැසසුමට ලක් කරමි. එමෙන්ම අප අමාත්‍යාංශයේ සියලුම කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින් දේශයේ ජනජීවිතය ඉහල නැංවීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලය රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙත හා මා වෙත ලබා දෙනු ලබන සහයෝගය බෙහෙවින් අගය කරමි.

**පී. රුවන් සෙනරත් (පා.ම.)**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය**

**<u>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ</u>**
**<u>ලේකම්ගේ සුබ පැතුම් පණිවිඩය</u>**



2024 වර්ෂයට අදාළව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන සැලැස්ම ඉදිරිපත් කරන මෙම අවස්ථාවේදී, අප රට දැඩි ආර්ථික අභියෝගයකට මුහුණ දී සිටින බව අවධාරණය කළ යුතුය. මෙවැනි අභියෝගාත්මක පරිසරයකින් මිදීමට, රජය විසින් නාස්තිය හා දූෂණය අවම කරමින්, අනවශ්‍ය වියදම් සීමා කරමින්, දැඩි මූල්‍ය විනයක් යටතේ රාජ්‍ය වියදම් අඩු කිරීමට ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරයි.

මෙවැනි තත්ත්වයකදී, අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යභාර හා වගකීම් 2025 අයවැය යෝජනා සහ රජය විසින් ගන්නා ප්‍රතිපත්ති තීරණ අනුව ප්‍රමුඛතාවයට පත් කරමින් ක්‍රියාත්මක කළ බව සිහිපත් කරමි. පසුගිය වසරේ අග භාගයේ නව රජයක් පත් වීමත් සමඟ රට තුළ දේශපාලන ස්ථාවරතාවයක් ඇතිවී, අනාගතය පිළිබඳව සුබවාදී මාවතක් නිර්මාණය වී ඇත. ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය තුළ ජනතාව සහ රාජ්‍ය සේවකයන්ගේ අපේක්ෂාවන් නිවැරදිව අවබෝධ කරගෙන ක්‍රියා කිරීම අතිශයින් වැදගත්ය.

මෙම මූල්‍ය වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් ප්‍රතිපාදන දැඩි මූල්‍ය විනයක් සහිතව, ඵලදායීව හා කාර්යක්ෂමව අමාත්‍යාංශයේ කාර්යභාර සඳහා යොදවා ඇත. මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සැකසීම, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියක් සකස් කිරීම, රාජ්‍ය රාජකාරි ඩිජිටල්කරණය කිරීම, නිලධාරී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම, උසස් වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය හරහා සේවකයින්ට පාඨමාලා ලබාදීම, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ ලබාදීම හා චක්‍රලේඛ නිකුත් කිරීම, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුබසාධනය සඳහා කටයුතු කිරීම, පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතා සුබසාධනයට අදාල කටයුතු පවත්වාගෙන යාම යන කටයුතු 2024 වර්ෂය තුළ අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදි.

මෙම කාර්යභාර සාර්ථකව හා ඵලදායීව ඉටු කිරීම සඳහා මඟ පෙන්වීම හා උපදෙස් ලබාදුන් ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ආචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න මැතිතුමාටත්, සහයෝගය ලබාදුන් ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය පී.රුවන් සෙනරත් මැතිතුමාටත්, මාගේ ගෞරවය හා ස්තූතිය පළ කරමි.

එමෙන්ම, අමාත්‍යාංශයේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා කැප වූ අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල්වරු, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු, ප්‍රධාන මූල්‍ය නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත්, අමාත්‍යාංශයට අනුයුක්ත දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලයටත්, මාගේ හදපිරි ස්තූතිය පළ කරමි.

අනාගතයේදීම අමාත්‍යාංශයේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සමස්ත කාර්ය මණ්ඩලයේ සහයෝගය හා කැපවීම අපේක්ෂා කරමින්, සියළුදෙනාටම සුභ පැතුම් එක් කරමි.

**එස්. ආලෝකබණ්ඩාර**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

# පෙළගැස්ම



| # | අංශය | වර්ණය | පිටු අංක |
|---|---|---|---|
| 1. | රාජ්‍ය පරිපාලන | | 1 - 59 |
| 2. | ස්වදේශ කටයුතු | | 1 - 45 |
| 3. | පළාත් සභා සහ පළාත් පාලන | | 1 - 74 |

# රාජ්‍ය පරිපාලන අංශය

# පරිච්ඡේද


**1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය........................................................ 1**

1.1. හැඳින්වීම........................................................................................................................ 1

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ ........................................................................ 2

1.3. රාජ්‍ය පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන් ................................................................ 2

1.4. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන ........................................ 2

1.5. සංවිධාන සටහන ........................................................................................................ 3

**2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........................................................................................5**

2.1. ඒකාබද්ධ සේවයේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි බඳවා ගැනීම් ........................................................ 5

2.2. 2024 දෙසැම්බර් 31 වන දිනට දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් ................................................ 6

2.3. 2024 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ සේවයේ නිලධාරින් ..................................................... 7

2.4. 2024 වර්ෂයේදී අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ............................ 8

2.5. 2024 වර්ෂයේදී ආයතන අංශය මඟින් නිකුත් කරන ලද සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ............ 9

2.6. ආයතන අංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි .......................................10

2.7. 2024 වර්ෂයේ දී රාජ්‍ය පරිපාලන අංශයේ විවිධ අංශයන් විසින් සිදු කළ සුවිශේෂ කාර්යය භාරයන් ...10

**3. පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය...............................................................30**

3.1. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය...............................................................................30

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.......................................................................................31

3.2.1. අක්මුදල් ගැලපුම් ගිණුම.........................................................................................32

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය..........................................................................................33

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්.......................................................................................................34

3.5. ආදායම් එකතු කිරිමේ කාර්ය සාධනය...............................................................................35

3.6. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.............................................35

3.7. ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය................................................................36

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..........................................................36

**4. පරිච්ඡේදය - 2024 වර්ෂයේ අමාත්‍යාංශයීය කාර්යසාධන දර්ශක ...................................................37**

**5. පරිච්ඡේදය - 2024.12.31 දිනට තිරසර සංවර්ධන අරමුණු (SDG) ලගා කරගැනීමේ ප්‍රගතිය.................38**

**6. මානව සම්පත් පැතිකඩ.........................................................................................................40**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.........................................................................................41

6.2. කාර්ය මණ්ඩල විස්තරය..................................................................................................41

6.3. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය ............................................................................44

**7. අනුකූලතා වාර්තාව..............................................................................................................53**

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1.හැඳින්වීම

සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වෙමින් ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් වෙනුවෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, රාජ්‍ය යාන්ත්‍රණය තුළ ප්‍රමුඛතම කාර්යභාරයක් සිදු කරනු ලබයි. එහිදී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය පෙරදැරි කොට ගෙන ක්‍රියාත්මක වන පුළුල් විෂය පථයක් සහිත සුවිශාල කාර්යය භාරයක් අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය තුළින් ඉටු වේ. ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ත ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික පරමාර්ථය වේ.

මහජනතාවට තෘප්තිමත් රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා සාධාරණත්වය, සමරූපිතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වෙමින්, පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සකස්කිරීම මෙම අමාත්‍යාංශය සතු මූලික වගකීමකි. ඒ අනුව ආයතන සංග්‍රහය හා අදාළ නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සකස්කරමින්, සංශෝධනය කරමින්, අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි. රාජ්‍ය සේවා කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, අර්ථකථනය හා ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සැපයීම, රාජ්‍ය සේවයේ කාර්යය මණ්ඩල නිපුණතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීමද මෙම අමාත්‍යාංශය වෙතින් ඉටුවන තවත් සුවිශේෂී කාර්යයකි. එමඟින් වඩා ඵලදායී සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සමස්ත රාජ්‍ය සේවයෙහි ම ක්‍රියාකාරීත්වය ගොඩනැගීම හා පාලනය සිදුකරනු ලබයි.

## 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

**" දැයට විශිෂ්ඨ රාජ්‍ය සේවයක් "**

**මෙහෙවර**

**"මානව සම්පත නිසි පරිපාලනය, කළමනාකරණය හා ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම "**

**අරමුණු**

1. රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණ පිලිවෙතට අනුගත වෙමින් බඳවා ගැනීම්, පාරිශ්‍රමික සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ ඵලදායී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
2. මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී දැනට රාජ්‍ය සේවයේ සිටින සේවකයින්ගේ සිතුම් පැතුම් සහ ආකල්ප නව මානයන් කරා මෙහෙයවීම.
3. රාජ්‍ය සේවයේ ඵලදායීතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම උදෙසා නව කළමනාකරණ ව්‍යුහයක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
4. හර පද්ධතියක් ස්ථාපිත කොට බෙදා හදා ගැනීම (ප්‍රතිඵලාභිමුඛ ආකල්ප, වගවීම, සම්පත් විචක්ෂණයෙන් ලෙස යොදා ගැනීම, අපක්ෂපාතිත්වය, පාරදෘශ්‍යබව ආදියෙන් සමන්විතව)
5. රාජ්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට ඇවැසි පහසුකම් සැපයීම.
6. විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටළුවලට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම වැටුප් වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
7. රජයේ සංවර්ධන ඉලක්ක සහ ප්‍රමුඛතා සපුරාලීමේ හැකියාව සහිත රාජ්‍ය අංශයේ ආයතනික සංවර්ධනය සඳහා රාමුවක් සකස් කරගැනීම.
8. සේවා සැපයුමේ ඵලදායීතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.
9. රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම.
10. වෙනස් වෙමින් පවතින තත්ත්වයන්ට අනුව කටයුතු කිරීම පිණිස පද්ධති සරල කිරීම සහ ක්‍රියාදාම යළි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම, වර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

## 1.3 රාජ්‍ය පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන විෂයයන්ට සහ මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ත, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. රාජ්‍ය සේවයට අදාළව පවත්නා නීති රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක්කර සරල කිරීම
4. රාජ්‍ය සේවයේ ආරවුල් විසඳීම සඳහා බේරුම්කරණ ක්‍රියාවලියක් හඳුන්වා දීම
5. සේවා ව්‍යවස්ථාවන්හි ගැටලු නිරාකරණය කර ඒවා සංශෝධනය කිරීම
6. දෙපාර්තමේන්තු සහ එහි කාර්ය මණ්ඩලය නියමිත ඉලක්කයන් සාක්ෂාත් කරන බව සහතික කිරීම සඳහා කාර්ය සාධන කළමනාකරණ ක්‍රියා පටිපාටියක් හඳුන්වා දීම
7. ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බහු සේවා සැපයුම් මධ්‍යස්ථාන ලෙස උත්ශ්‍රේණිගත කිරීම
8. රජයේ සේවයේ සියලුම සේවාවන් සඳහා නිලධාරීන් පත්කිරීම් සහ උසස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නීති රීති නිශ්චිත කාල රාමුවක් තුල සංශෝධනය කිරීම
9. රාජ්‍ය අංශයේ කුසලතා මත පදනම් වූ උසස්වීම් ක්‍රියාත්මක කිරීම
10. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය.
11. ඒකාබද්ධ සේවා පරිපාලනය කිරීම
12. ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්
13. රාජ්‍ය සේවා පුහුණුව
14. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාම වැටුප් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
15. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු
16. රාජ්‍ය උත්සව සංවිධානය කිරීම
17. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටු කරනු ලබන ජනතා කේන්ද්‍රීය සේවාවන් ශක්තිමත් කිරීම

## 1.4 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
2. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල
3. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
4. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්
5. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව *
6. රාජ්‍ය භාෂා කොමිසම *
7. මානව සම්පත් සංවර්ධන කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
8. භාෂා අධ්‍යාපන හා පුහුණු පිළිබඳ ජාතික ආයතනය *

* 2024.11.25 දිනැති අංක 2412/08 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් මෙම ආයතන මෙම අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් කර ඇත.

## 1.5 සංවිධාන සටහන - රාජ්‍ය පරිපාලන අංශය



# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ඒකාබද්ධ සේවයේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි බඳවා ගැනීම්

ඒකාබද්ධ සේවයේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2024 වසරේදී නිලධාරින් දෙනෙක් රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලදී .

| බඳවා ගන්නා ලද සේවය | බඳවා ගන්නා ලද සේවක සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III ශ්‍රේණිය | **20** |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය III ශ්‍රේණිය - සීමිත | **50** |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය III ශ්‍රේණිය | **62** |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III ශ්‍රේණිය - විවෘත | **61** |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය III ශ්‍රේණිය - විවෘත | **08** |
| කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණිය සේවය - කුසලතා පදනම | **05** |
| කළමනාකරණ සේවා නිලධාරී සේවය - සීමිත | **62** |
| රජයේ පුස්තකාලයාධිපති සේවය III ශ්‍රේණිය -සීමිත | **38** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය I ශ්‍රේණිය -සීමිත | **09** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය II ශ්‍රේණිය -සීමිත | **88** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය III ශ්‍රේණිය -සීමිත | **227** |
| රියදුරු සේවය | **83** |
| කාර්යාල කාර්ය සහායක සේවය | **599** |
| **එකතුව** | **1312** |

**2.2. 2024 දෙසැම්බර් 31 වන දිනට දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්.**

| කාර්යයන් | දීපව්‍යාප්ත සේවාවන් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ලං.ග.සේ | ශ්‍රී.ලං.ක්‍ර.සේ | ශ්‍රී.ලං.ඉ.සේ | ශ්‍රී.ලං.ප.සේ | ශ්‍රී.ලං.වි.සේ | ශ්‍රී.ලං.වා.වි.සේ | ශ්‍රී.ලං.තා.සේ |
| <u>කාර්යය මණ්ඩලය</u> | | | | | | | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා බඳවාගැනීම් සහ ආයතනික කටයුතු ඊට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන අතර, ප්‍රතිපත්ති තීරණ ගැනීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. |
| අනුමත සංඛ්‍යාව | 2,065 | 1,299 | 1,527 | 3, 231 | 649 | 69 | |
| තත්‍ය සංඛ්‍යාව | 1,572 | 986 | 1,083 | 2,486 | 472 | 56 | |
| නව බඳවාගැනීම් | 20 | 50 | - | 62 | 61 | 08 | |
| ස්ථිර කිරීම් | 56 | 24 | 44 | 131 | 31 | 05 | |
| <u>උසස් කිරීම්</u> | | | | | | | |
| III සිට II | 65 | 26 | 49 | 19 | 23 | 03 | |
| II සිට I | 16 | 88* | 43 | 279 | 18 | 02 | |
| I සිට විශේෂ/අධි ශ්‍රේණියට | 24 | 05 | 14 | 75 | 04 | - | |
| විශ්‍රාම යාම් | 35 | 58 | 34 | 68 | 09 | 02 | |
| වාර්ෂික නොවන ස්ථාන මාරු | 174 | 74 | 13 | 486 | 05 | 01 | |
| වාර්ෂික ස්ථාන මාරු | 21 | 11 | - | 39** | - | - | |
| මුදාහැරීම් | 22 | 04 | 04 | 81 | - | - | |
| <u>විනය කටයුතු</u> | | | | | | | |
| විනය කටයුතු ආරම්භ කරන ලද සංඛ්‍යාව | 40 | 04 | 07 | 110 | 03 | - | |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම/නිදහසට කරුණු විමසීම | 17 | 05 | 06 | 20 | - | - | |
| විනය නියෝග නිකුත් කිරීම | 20 | 01 | 07 | 14 | 01 | - | |
| සේවා අත්හැරයාමේ නිවේදනවලට එරෙහිව කරන ලද අභියාචනා | 02 | - | 07 | 01 | 01 | - | |

**** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයට අනුව ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධව ඉදිරි ක්‍රියා මාර්ග ගනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව රාජකාරි ආවරණය කිරීම සඳහා I ශ්‍රේණියේ තනතුරු 88ක් පදනම් කරගෙන නිලධාරීන් 88ක් සඳහා දැනට සුදුසුකම් අනුව පූර්ණකාලීනව රාජකාරී ඉටු කිරීම යන පදනම මත නිලධාරීන් පත් කර ඇත.***

*****2025 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු චක්‍ර 39 ක් යටතේ ස්ථාන මාරුවීම් ලබා දී ඇති අතර, විශේෂයෙන් සඳහන් කර ඇති දිනයන් හැර 2025.03.02 දින සිට එම ස්ථාන මාරු ක්‍රියාත්මක වේ.***

## 2.3. 2024 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ සේවයේ නිලධාරින්

| කාර්යය | භාෂා පරිවර්තක සේවය | පුස්තකාලයාධිපති සේවය | කළමනාකරණ (අධි) ශ්‍රේණිය | සංවර්ධන නිලධාරි සේවය | කළමනාකරණ සේවා නිලධාරි සේවය | රියදුරු සේවය | කාර්යාල කාර්ය සහයක සේවය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය 1 පන්තිය | 2 පන්තිය | 3 පන්තිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **කාර්යය මණ්ඩලය** | | | | | | | | | | |
| අනුමත සංඛ්‍යාව | 636 | 618 | | ** | 29,785 | 9,443 | 17,218 | 130 | 524 | 2,766 |
| තත්‍ය සංඛ්‍යාව | 295 | 136 | | 79,443 | 24,629 | 8,521 | 15,035 | 90 | 279 | 1,549 |
| නව බඳවාගැනීම් | - | 38 | | - | - | 83 | 599 | 09 | 88 | 227 |
| ස්ථිර කිරීම් | 01 | 15 | | 2,089 | 1,035 | 184 | 846 | - | 16 | 57 |
| **උසස් කිරීම්** | | | | | | | | | | |
| III සිට II | - | 08 | | 12,100 | 1,589 | 259 | 428 | 01 | - | 31 |
| II සිට I | - | 02 | | 70 | 319 | 42 | 153 | 02 | - | 39 |
| I සිට විශේෂ/ අධි ශ්‍රේණියට | - | - | | - | 170 | 62 | 379 | 01 | - | - |
| විශ්‍රාම යාම් | 03 | 10 | | 55 | 518 | 158 | 237 | 06 | 02 | 13 |
| වාර්ෂික නොවන ස්ථාන මාරු | 15 | 05 | | 1,806 | 1,223 | 300 | 312 | - | 16 | 51 |
| වාර්ෂික ස්ථාන මාරු | 09 | 03 | | 1,621 | 3,433 | 235 | 978 | - | 21 | 176 |
| මුදාහැරීම් | 07 | 01 | | 527 | 210 | 02 | 250 | 01 | 08 | 24 |
| **විනය කටයුතු** | | | | | | | | | | |
| විනය කටයුතු ආරම්භ කරන ලද සංඛ්‍යාව | 01 | - | 04 | 54 | 27 | 17 | 33 | - | 02 | - |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම්/නිදහසට කරුණු විමසීම | 01 | - | 02 | 32 | 24 | 08 | 07 | - | 02 | - |
| විනය නියෝග නිකුත් කිරීම | - | - | | 35 | 11 | 15 | 18 | - | - | - |
| සේවා අත්හැරයාමේ නිවේදනවලට එරෙහිව කරන ලද අභියාචනා | 01 | - | - | 51 | 21 | 10 | 33 | - | 02 | - |

** * කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරමින් පවතී.*

## 2.4 . 2024 වර්ෂයේදී අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| අනු අංකය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය | යොමුව |
|---|---|---|---|---|
| 01 | 01/2024 | 2024.01.03 | ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන | - |
| 02 | 02/2024 | 2024.01.10 | 2023 වර්ෂයේ නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ [illegible] | - |
| 03 | 03/2024 | 2024.01.10 | 2024 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ ජීවන වියදම් දීමනාව සහ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම සංශෝධනය කිරීම | 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/2013<br><br>2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 |
| 04 | 04/2024 | 2024.02.02 | 2024 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම | - |
| 05 | 11/2024 | 2024.11.12 | රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා යුනිකේත හා අනුකූල අක්ෂර (Unicode Compatible Fonts) භාවිතා කිරීම | ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති 2007.03.14 දිනැති චක්‍රලේඛ අංක SP/SB/01/07<br><br>එවකට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවි බල ගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MWCA&SE/NSPD/Legal CC 1/SC-FR-177-2023 හා 2024.08.30 දිනැති ලිපිය |
| 06 | 12/2024 | 2024.07.23 | ජල ගැලීම්/ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයන් සඳහා නිවාඩු ලබාදීම 2024 මැයි සහ ජූනි | - |
| 07 | 15/2024 | 2024.09.06 | අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට විධිමත් අනුමතියකින් තොරව විදේශගතව සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම | 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදය<br><br>ආයතන සංග්‍රහයේ පළමු වැනි කාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ 7 වන වගන්තිය<br><br>ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 37 වගන්තිය |
| 08 | 21/2024 | 2024.12.24 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2025 වසර | 2015.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 |
| 09 | 22/2024 | 2024.12.30 | "ක්ලීන් ශ්‍රී ලංකා (Clean Sri Lanka)" ජාතික වැඩසටහන සමග 2025 වසරේ රාජකාරී කටයුතු ඇරඹීම | - |

## 2.5. 2024 වර්ෂයේදී ආයතන අංශය මඟින් නිකුත් කරන ලද සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| # | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය | යොමුව |
|---|---|---|---|---|
| 01 | 03/2019(V) | 2024.02.09 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උපවගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 සහ 19:14 උපවගන්ති<br>2019.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ |
| 02 | 22/99(XL) | 2024.04.25 | රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන් /අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම් | 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 හා ඊට ආනුෂංගිකව නිකුත් කර ඇති චක්‍රලේඛ<br><br>2022.01.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2022<br><br>2022.09.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2022<br><br>අංක අමප/24/0433/605/016 සහ 2024.03.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය |
| 03 | 02/2021(IX) | 2024.05.07 | COVID – 19 වසංගත සමය තුළ විදේශගතව සිට පැවති තත්ත්වය හමුවේ නැවත සේවයට වාර්තා කිරීමට අපොහොසත්ව සිටි රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම | ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XII පරිච්ඡේදය |
| 04 | 14/2022(IV) | 2024.06.07 | ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම | 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ<br><br>ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XII පරිච්ඡේදය |
| 05 | 18/2015(V) | 2024.06.27 | රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම | 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ<br><br>2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2011<br><br>2013.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013<br><br>අංක අමප/13/1466/533/016 හා 2013.10.31අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි අංක 41.07 තීරණය |

## 2.6. ආයතන අංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි

| # | චක්‍රලේඛ ලිපි අංකය | නිකුත් කළ දිනය | කාරණය | යොමුව |
|---|---|---|---|---|
| 01 | 01/2024 | 2024.04.16 | වයස අවුරුදු 45 න් පසුව පත්වීම ස්ථිර කරන ලද සේවකයින් වෙත විශ්‍රාම වැටුප් ලබා දීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014, 25/2014 (I) සහ 29/2019 සම්බන්ධයෙනි. | අමප/23/0136/620/003-I හා 2024.03.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය<br>2024.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014<br>2014.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 (I)<br>2019.09.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 |

## 2.7. 2024 වර්ෂයේ දී රාජ්‍ය පරිපාලන අංශයේ විවිධ අංශයන් විසින් සිදු කළ සුවිශේෂ කාර්යය භාරයන්

### 2.7.1 ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

1. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පැවති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) ,සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය **2024.03.23** වන දින පැවැත්වීම.
2. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2024.06.10 වන දින පවත්වන ලදී.
3. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා එම ශ්‍රේණියේ සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2024.08.30 වන දින පවත්වන ලදී.
4. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම
5. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කිරීම සම්බන්ධ වැඩමුළුවක් පවත්වන ලදී.
6. 2024 වර්ෂයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විවෘත හා සීමිත පදනමින් බඳවා ගන්නා ලද නිලධරයන් 98 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් සේවාරම්භක පුහුණුව පවත්වන ලදී.
7. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා විද්‍යාත්මක පර්යේෂණ නිබන්ධනයක් හෝ පත්‍රිකාවක් සකස් කිරීම සම්බන්ධයෙන් වූ පුහුණු වැඩසටහන් මාලාවේ පළමු වැඩසහටනේ අවසන් අදියර 2024.08.29 හා 2024.08.30 යන දිනවල හා දෙවන වැඩසටහන 2024.12.03 දින පැවැත්වීම
8. 2024 වර්ෂයේ විවෘත හා සීමිත පදනමින් බඳවාගත් නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව පිළිවෙලින් 2024.08.15 හා 2024.08.26 දින වලදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී කඩින් කඩ පවත්වන ලදී.
9. 2024 වර්ෂයේදී නිලධාරීන් 50 දෙනෙකු සඳහා විද්‍යාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහනේ 1 හා 2 අදියර යටතේ පැවැත්වීම

### 2.7.2. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

1. 2024 වර්ෂයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට විවෘත හා සීමිත පදනමින් බඳවාගත් නිලධාරීන්ට සේවාරම්භක පුහුණු වැඩසටහන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී 2024.08.26 දින සිට කඩින් කඩ පැවැත්වීමට කටයුතු සිදුකරන ලදී.

2. 2024 වර්ෂයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට විවෘත පදනමින් බඳවා ගන්නා ලද නිලධරයන් 08 දෙනෙකු සඳහා 2024.09.18 දින පත්වීම් ලිපි ප්‍රදානය කරන ලදී.

### 2.7.3. ශ්‍රී ලංකා තාක්ෂණ සේවය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා අංශය මගින් එම සේවයේ ඒකීය ස්වරූපය පවත්වා ගෙන යාමේ අරමුණින් තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එම සේවයේ ප්‍රතිපත්තිමය තීරණයන්ට අදාළව කටයුතු ද කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමේ කටයුතු ද සිදු කරනු ලබයි.

**කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීම පිළිබඳ තොරතුරු - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය**

| ශ්‍රී.ලං තා.සේ. කාර්යක්ෂමතා කඩඉම් විභාග | *ගැසට් පත්‍රයේ පල කළ දිනය* | *අයදුම්පත් භාරගැනීම අවසන් වූ දිනය* | *විභාගය පැවැත් වූ දිනය* | *විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිඵල නිකුත් කළ දිනය* |
|---|---|---|---|---|
| ශ්‍රී.ලං තා.සේ. III ශ්‍රේණිය - 2018 (II) | *2022.10.21* | *2022.11.21* | *2023 .07.15* | **2024.03.28** |
| ශ්‍රී.ලං තා.සේ. II ශ්‍රේණිය - 2018 (II) | | | | **2024.02.27** |
| ශ්‍රී.ලං තා.සේ. III ශ්‍රේණිය - 2019 (I) | *2024.08.09* | *2024.09.09* | *2025.01.26 විභාගය පැවැත්වීමට නියමිතය* | |
| ශ්‍රී.ලං තා.සේ. II ශ්‍රේණිය - 2019 (I) | | | *2025.01.19 විභාගය පැවැත්වීමට නියමිතය* | |
| ශ්‍රී.ලං තා.සේ. I ශ්‍රේණියේ නිලධරයින් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 7 කණ්ඩායම | *2022.06.10* | *2022.12.31* | **2024.09.14 2024.09.21** | |
| ශ්‍රී.ලං තා.සේ. I ශ්‍රේණියේ නිලධරයින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2020 | *2022.05.06* | *2022.06.03* | **2023.07.09** | **2024.02.27** |
| ශ්‍රී.ලං තා.සේ. I ශ්‍රේණියේ නිලධරයින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2020/2022/2023 | *2024.07.12* | *2024.08.15* | | |

## 2.7.4. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා අංශය

1. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට සීමිත හා විවෘත පදනමින් නිලධාරීන් බඳවා ගැනීම සඳහා 2023.07.29 දින පවත්වන ලද දීප ව්‍යාප්ත සේවා සඳහා බඳවා ගැනීමේ පොදු තරඟ විභාගයේ විවෘත පදනමින් විභාගයට පෙනී සිටි අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල විභාග අනුව විවෘත පදනමින් පුරප්පාඩු 144 ක් පිරවීම සඳහා මූලික කටයුතු 2024 වර්ෂයේ ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමේ 2017/2018 (2020) තරඟ විභාගයේ ප්‍රතිඵල මත සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් කිහිප දෙනෙකු හා විනය කටයුතු පැවති අපේක්ෂකයින් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් පැන නැගී තිබූ ගැටළු නිරකරණය කර ගැනීමටත් එමගින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය සඳහා 18 දෙනෙකු බඳවා ගන්නා ලදී.

3. නිලධාරීන් 314 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණුව සඳහා මූලික කටයුතු සංවිධානය කර ඇත.

4. 2025 වර්ෂයේ මුල් මාස කිහිපය තුළ ආරම්භ කල හැකි වන පරිදි ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා I ශ්‍රේණියේ නිලධාරීන් 30 දෙනෙකු සහ III ශ්‍රේණියේ නිලධාරීන් 180 දෙනෙකු වශයෙන් වර්ෂය තුළ නිලධාරීන් 210 දෙනෙකු යොමු කිරීම සඳහා කටයුතු කර ඇත. දෙනෙකු වශයෙන් වර්ෂය තුළ නිලධාරීන් 210 දෙනෙකු යොමු කිරීම සඳහා කටයුතු කර ඇත.

5. මෙම වසර තුළදී විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන් 35 ක් සඳහා අදාළ සියලුම ආයතන කටයුතු නිමකර ඇත.

6. තවද වැඩි නිලධාරීන් ප්‍රමාණයකට අවස්ථාව ලබාදීමේ අරමුණින් ගණකාධිකාරී සේවාව ඇතුලු දීපව්‍යාප්ත සේවාවන් සඳහා අනුමතව ඇති ප්‍රියමනාප සේවා ස්ථාන වලට අදාල ආයතන පිළිබඳව නැවත සමාලෝචනය කිරීම් කමිටුවේ අවසන් වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම

7. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 හි සඳහන් විධිවිධාන අනුව I ශ්‍රේණියේ තනතුරු නොලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ සංචිතය පිහිටුවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර සම්මුඛ පරීක්ෂණ ලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

### 2.7.5 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය

- ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්, එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ විධිමත් සම්මුඛ පරීක්ෂණය 2023.04.30 පැවැත්වූ අතර, පැවැති පුරප්පාඩු සංඛ්‍යාව අනුව නිලධාරීන් 02 දෙනෙකු 2022.07.01 දිනට හා නිලධාරීන් 16 දෙනෙක් 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 (I) සහ 2020 (II) විභාග නිවේදන නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2024.04.08 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ඇත.

### 2.7.6 ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් 75 දෙනෙකු විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ
කටයුතු සිදු කිරීම
2. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් 279 දෙනෙකු I ශ්‍රේණියට උසස් කිරීමේ කටයුතු සිදු කිරීම
3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් 19 දෙනෙකු II ශ්‍රේණියට උසස් කිරීමේ කටයුතු සිදු කිරීම
4. ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් 131 දෙනෙකුගේ ස්ථිර කිරීමේ කටයුතු සිදු කිරීම
5. 2024 වසරේ වාර්ෂික ස්ථාන මාරු සහ වාර්ෂික නොවන ස්ථාන මාරු 525 කට ආසන්න ප්‍රමාණයක් ලබා දීමට කටයුතු කිරීම
6. ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ ඉල්ලීම් සඳහා අනුමැතීන් ලබා දීමට කටයුතු කිරීම
7. ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් නියමිත දිනට විශ්‍රාම යාමට අනුමැතීන් ලබා දීමට කටයුතු කිරීම
8. ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි ද ඇතුළත් ව ආරම්භ කරන ලද විනය ගොනු 110ක්ද චෝදනා පත්‍ර නිකුත් කිරීම් 20ක්ද විනය නියෝග නිකුත් කිරීම් 14ක්ද වේ.

### 2.7.7. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා අංශය

අමාත්‍යාංශය වෙත පැවරෙන ක්‍රමසම්පාදන කාර්යභාරයට අයත් වන්නා වූ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මාර්ගෝපදේශයන් හා ක්‍රමෝපායන් සකස් කිරීම, වැඩසටහන්, ව්‍යාපෘති, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම මෙන්ම ඒ හා සම්බන්ධ වන්නා වූ සේවාවන් ඉටු කිරීම සඳහා ක්‍රමසම්පාදන අංශය ස්ථාපිත කොට ඇත.

**2024 වර්ෂයේ සුවිශේෂී කාර්ය සාධනයන්**

1. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් 07 දෙනෙකු 2024.07.15 දින සිට සහ නිලධාරීන් 43 දෙනෙකු 2024.10.14 දින සිට සේවාරම්භක පුහුණුව ලබමින් සිටී.
2. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීම සඳහා 2018.04.08 දින පැවති විභාගයේ ප්‍රතිඵල මත නිලධාරීන් 08 දෙනෙකු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කළ අතර, ඉන් එක් නිලධාරියකු සහභාගි නොවූ බැවින්, නිල ධාරීන් 07 දෙනෙකු පමණක් 2024.07.15 දින බඳවා ගැනීමට කටයුතු කිරීම හා එම නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව ආරම්භ කිරීම.
3. ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවට අනුව 2013 හා 2015 කණ්ඩායම්වල II ශ්‍රේණියේ නිලධාරීන්ට දින 60ක ක සේවාස්ථ පුහුණුව ලබා දීම 2024.09.06 දින ආරම්භ කරන ලදී.

### 2.7.8 ඒකාබද්ධ සේවා අංශය

**2024 වර්ෂයේ සුවිශේෂී කාර්ය සාධනයන්**

- කළමනාකරණ සේවා නිලධාරි සේවයට සීමිත පදනමින් බඳවාගත් නිලධාරීන් 755ක් සඳහා සේවාරම්භක පුහුණුව ලබා දීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් සීමිත පදනමින් බඳවාගත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව පෙබරවාරි මස පැවැත්වීම.
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ ,ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ, නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010(I) සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(II) විභාග නිවේදන නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2024.04.08 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ඇත.
- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2019(I)2023 විභාග නිවේදන නිරීක්ෂණ 2024.09.04 දින ලැබී ඇති අතර 2024.10.19 දින සිට 2024.10.27 දින දක්වා පැවැත්වීමට නියමිතය.
- රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016(2024) සැප්තැම්බර් මස පැවැත්වීමට නියමිතය.
- රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණිය සහ II ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග 2018(II)2022 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පැවැත්වීම සඳහා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා යොමු කර ඇත.
- කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 විභාගයට අදාළ විභාග නිවේදනය නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2024.06.11 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ඇත.
- කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024, 2024.07.27 දින පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත.
- සංවර්ධන නිලධාරි සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024, 2024.06.30 දින පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත.

### 2.7.9. අභ්‍යන්තර විගණන අංශය

අංක: 2403/53 හා 2024.09.27 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කිරීමට පෙර පැවති රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය හා ඒ යටතේ පැවති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, බහුකාර්යය සංවර්ධන කාර්යය සාධක බලකා

දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තු කටයුතු අංශය, ජාතික භාෂා අංශය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය (DLC), රාජ්‍ය භාෂා කොමිෂන් සභාව (OLC), මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC), භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය (NILET) යන ආයතනයන්ට අදාළව අනුමත වාර්ෂික අභ්‍යන්තර කොමිෂන් සභාව (OLC), මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC), භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය (NILET) යන ආයතනයන්ට අදාළව අනුමත වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුව විගණන කටයුතු සිදු කළ අතර, අවශ්‍යතාව අනුව විශේෂ විගණන පරීක්ෂණ හා විමර්ශන සිදුකිරීම ද අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයට අදාළ වේ.

- 2024 වර්ෂයේ පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තුවලට අදාලව විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් පිළිවෙලින් 2024.03.26, 2024.07.04, 2024.10.21 හා 2024.12.26 යන දිනයන්හිදී පවත්වා ඇත.

| **සිදු කරන ලද විගණන විමසුම් සහ විශේෂ විගණන** | |
|---|---|
| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **විෂයය (සංක්ෂිප්තව)** |
| **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය** | අමාත්‍යාංශයේ භූගත ජල ටැංකිය වෙනුවට ලීටර් 10000 ප්‍රමාණයේ අලුතින් ප්ලාස්ටික් ජල ටැංකි යෙදීමේ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2023 |
| | 2023 අමාත්‍යාංශයීය වාර්ෂික මානව සම්පත් සංවර්ධන සැලැස්ම ප්‍රකාරව පුහුණු පාඨමාලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම්වලට අදාළ හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ පවිත්‍රතා සේවය හා ආරක්ෂක සේවයට අදාළ ගිවිසුම් පවත්වාගෙන යාම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි අන්තර්ගත තොරතුරු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ මූල්‍ය ශාඛාවේ සරප් අංශයේ කාර්යභාරය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සතු සංචිත වාහන රාජකාරි කටයුතු සඳහා භාවිතා කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2024 |
| | අමාත්‍යාංශයේ තැපැල් අංශයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ දෛනික ධාවන සටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ විදුලිය හා ජලය පරිභෝජනය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | මහියංගණය, කතරගම හා මොණරාගල නිවාඩු නිකේතන පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව හා ගම්පහ නිල පියස නිවාස පිළිබඳ විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශය යටතේ පවතින නිවාඩු නිකේතන හා සංචාරක බංගලා වෙන් කිරීමේ ක්‍රියාවලිය හා ඉන් ලැබෙන ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2023 |
| | රාජ්‍ය පරිපාලන අංශයේ වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව 2023/2024 අමාත්‍යාංශයේ දුරකථන සම්බන්ධතා හා දුරකථන වියදම් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව** | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවෙහි අත්තිකාරම් බී ගිණුම, අමාත්‍යාංශයේ අත්තිකාරම් බී ගිණුමට ඒකාබද්ධ කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව** | විශ්‍රාම වැටුප් විගණන පරීක්ෂාව - 2024 (මහරගම ප්‍රාදේශීය ලේකම් |

**සිදු කරන ලද විගණන විමසුම් සහ විශේෂ විගණන**

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂයය (සංක්ෂිප්තව) |
|---|---|
| | කාර්යාලය හා මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) |
| | විශ්‍රාම වැටුප් දත්ත පද්ධති විගණන පරීක්ෂාව 2024 පෙබරවාරි (හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) 2024 ජූලි (කළුතර දිස්ත්‍රික්කය) |
| **ජාතික භාෂා අංශය** | ජාතික භාෂා අංශයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව 2022/2023 |
| **පාර්ලිමේන්තු කටයුතු අංශය** | පාර්ලිමේන්තු කටයුතු අංශයේ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| **රාජ්‍ය භාෂා කොමිෂන් සභාව** | රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සම්බන්ධයෙන් සිදුකළ පසු විපරම් පරීක්ෂාව - 2024 |
| | රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මුල්‍ය අංශයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව** | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි බැංකු ගිණුම් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංචිත සහ වෙන්කළ වාහනවල දෛනික ධාවන සටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව (2023/2024 ජූලි දක්වා) |
| | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය** | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ බැංකු ගිණුම් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරීක්ෂාව 2023 |
| | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ වෙබ් අඩවියෙහි අන්තර්ගත තොරතුරු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද විශේෂ විගණන පරීක්ෂාවන්** | පොළොන්නරුව නිවාඩු නිකේතනයේ පරිපාලන කටයුතු හා නඩත්තු කටයුතු පිළිබඳව සිදුකළ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 හා කූට ලේඛන උපයෝගී කර ගනිමින් රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම - කේ.ඒ. ඩොනල්ඩ් ප්‍රනාන්දු මහතා (වි.වැ.අංක: 01-1026289 පිළිබඳව සිදුකළ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |

- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් මහියංගණය, මොණරාගල, කතරගම, බණ්ඩාරවෙල හා දියතලාව යන නිවාඩු නිකේතන 7ක ලිපිගොනු පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව සහ මහරගම, මහියංගණය හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධ දත්ත පද්ධතිය, ලිපිගොනු පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව සිදුකරන ලදී.
- මීට අමතරව, සෑම මාසයකම හත්ලක්ෂ දසදහසකට ආසන්න විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය විගණනය කිරීම මගින් හඳුනාගනු ලබන වැරදි හා අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විගණන වාර්තා යොමු කරනු ලැබේ.

රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් සහ රාජ්‍ය සේවයේ යහපැවැත්ම සහතික වන අයුරින් ඊට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රජයට සහය වීම ආයතන අංශයේ ප්‍රධාන කාර්යය වන බැවින්, ඊට අදාළ කටයුතු ඉටු කිරීමේදී හා බලතල ක්‍රියාත්මක කිරීමේදී ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි ප්‍රධාන වශයෙන්ම ආධාර කර ගනී.

**රාජ්‍ය සේවයේ ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙතින් සපයන ලද දායකත්වය පිළිබඳ සමස්ත සමාලෝචනය**

| සිදු කරන ලද කාර්යයන් | සංඛ්‍යාව |
|---|---|
| නිකුත් කරන ලද චක්‍රලේඛ සංඛ්‍යාව | 12 |
| නිකුත් කරන ලද චක්‍රලේඛ ලිපි සංඛ්‍යාව | 00 |
| යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 13 |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා සකස් කරන ලද නිරීක්ෂණ ගණන | 173 |
| සේවා ව්‍යවස්ථා සඳහා ලබා දුන් නිර්දේශ ගණන | 08 |
| බඳවා ගැනීම් පරිපාටි සඳහා ලබා දුන් නිර්දේශ ගණන | 106 |

- **තොරතුරු පනතට අදාළව යොමු කරන ලද ගැටලු**

මෙම වර්ෂය තුළ ඉල්ලීම් 201 ක් ලැබී ඇති අතර, ඉල්ලීම් 200 සඳහා පිළිතුරු ලබා දී ඇත.

- **වන්දි අනුමත කිරීම**

මෙම වර්ෂය තුලදී 2024.12.31 දක්වා වන්දි අනුමත කරන ලද වන්දි ගොනු 140 ක් සඳහා රු.මිලියන 144.00 ක වන්දි මුදලක් ප්‍රදානය කර ඇත.

- **උපදේශන හා පැහැදිලි කිරීම්**

ආයතන අංශය වෙත මෙම වර්ෂය තුළදී ගැටලු 3,600 ක් යොමු කර ඇති අතර, ඉන් ගැටලු 3,305ක් සඳහා පිළිතුරු ලබා දී ඇත. මීට අමතරව වාචික විමසීම් සඳහා ද පිළිතුරු ලබා දෙනු ලැබේ.

රජයේ නිලධරයන්ට තම රැකියා සුරක්ෂිතතාව සහ විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කර ගනිමින් වැටුප් රහිත නිවාඩු මත රටේ දළ ජාතික නිෂ්පාදනයට දායක වීමට අවස්ථාව ලබාදුන් රා.පරි.ච. 14/2022 හි විධිවිධාන මගින් රජයේ නිලධාරීන් නිවාඩු ලබා ගැනීම හේතුවෙන් ඇති වූ ගැටලු නිරාකරණය සඳහා 2024.06.07 දිනැති රා.පරි.ච. 14/2022 (Iv) නිකුත් කර ඇත.

### 2.7.11 අභ්‍යන්තර පාලන අංශය

එක් එක් අංශ අතර මනා සම්බන්ධතාවක් ගොඩනගමින් ඔවුන්ගේ කාර්යය මණ්ඩලය වෙත අවශ්‍ය යටිතල පහසුකම් ලබාදෙමින් හා ආයතන පරිශ්‍රයේ යහපැවැත්ම ඇති කරමින්, අමාත්‍යාංශය වෙතින් මහජනතාවට හා සේවාවන් බලාපොරොත්තුවෙන් පැමිණෙන පාර්ශවයන්ට සුදුසු මඟපෙන්වීම හා සහයෝගය ලබා දීමට හැකි පරිසරයක් සකස් කිරීම මෙම අංශය වෙතින් ඉටු කරනු ලබයි.

### 2024 වර්ෂයේ අත්පත් කර ගන්නා ලද සුවිශේෂ ඉලක්ක සහ ජයග්‍රහණ

- ගුවන් හමුදාවේ ශ්‍රමදායකත්වය සහිතව අමාත්‍යාංශ ප්‍රධාන ගොඩනැගිල්ලේ පිටත අලුත්වැඩියා කිරීම සහ තීන්ත ආලේප කිරීමේ කටයුතු අර්ධයක් අවසන් කිරීම
- 2024 වෙසක් උත්සවය වෙනුවෙන් අමාත්‍යාංශ පරිශ්‍රය තුළ සහ අවට පරිශ්‍රය වෙසක් පහන් කූඩු මගින් ආලෝකකරණය කිරීම
- අමාත්‍යාංශයේ පිවිසුම් කොටසෙහි ක්ලැඩින් යොදා නවීකරණ කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ අංශ සඳහා වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම.
- අමාත්‍යාංශ පරිශ්‍රය ආලෝකකරණ කටයුතු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන් සඳහා නව දත්ත පද්ධතියකින් යුත් ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කිරීම.
- අභ්‍යන්තර පාලන අංශයේ භාවිතයට ගත් පැරණි කබඩ් වෙනුවට ලිපි ගොනු ගබඩා කිරීම සඳහා බිත්ති කබඩ් සවි කිරීමේ කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ එක් එක් අංශ සඳහා බලයින්ඩර්ස් යෙදීම තුළින් එම අංශයන්හි සූර්යාවරණ පහසුකම් සැලසීම
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර මල අපවහන පද්ධතිය නවීකරණ කිරීම.
- ප්‍රධාන ගොඩනැගිල්ලේ වහලය අළුත්වැඩියා කිරීම.

- ප්‍රධාන ගොඩනැගිල්ලේ 08 වන මහල නවීකරණය හා අවශ්‍ය අලුත්වැඩියා කිරීම් සිදු කිරීම.
- ලේකම් කාර්යාලයේ නවීකරණ කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශය සතු වාහන සඳහා ඉන්ධන භාවිතයට රු.මිලියන 17.17 ක් වැය කර ඇත.

- 2024 වර්ෂයේ අමාත්‍යාංශයේ ගොඩනැගිලි නඩත්තු වියදම හා ආරක්ෂක වියදම පහත ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ.




- **2024.11.30 දින දක්වා අමාත්‍යාංශයීය ජල, විදුලි, දුරකථන පවිත්‍රතා සේවා වෙනුවෙන් දැරූ පිරිවැය**




- 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ 2024.01.01 දින සිට 2024.12.31 දක්වා මෙම අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කරන ලද තොරතුරු හා ඒ සඳහා ලබා දී ඇති පිළිතුරු සම්බන්ධ ප්‍රගතිය පහත පරිදි වේ.

| කරුණ | සංඛ්‍යාව |
|---|---|
| **2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති ලිපි ප්‍රමාණය** | 415 |
| **ලියාපදිංචි මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව** | 363 |
| **දැනට පිළිතුරු යවා ඇති තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව** | 227 |
| **තවදුරටත් ඉල්ලුම්කරුවන් වෙත පිළිතුරු යොමු කළ යුතු ලිපි** | 136 |
| **ප්‍රතික්ෂේප කළ මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව** | 03 |
| **ලියාපදිංචි මුළු අභියාචනා සංඛ්‍යාව** | 35 |
| **අභියාචනා විභාග - තොරතුරු කොමිසම වෙත** | - |
| **තොරතුරු පනතට අදාල නොවන ලිපි ( අප අමාත්‍යාශයේ විෂය පථයට අයත් නොවන වෙනත් අමාත්‍යාංශ වලට අදාල තොරතුරු ඉල්ලීම්)** | 52 |

## 2.7.12 නිවාස සංවර්ධන අංශය

රාජ්‍ය නිලධාරීන්ට නිල නිවාස පහසුකම් සැපයීමේ අරමුණ පෙරදැරිව, රජයේ නිල නිවාස වෙන් කිරීම හා පරිපාලනය, දිවයින පුරා නව නිල නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, රජයේ නිවාඩු බංගලා හා නිකේතන වෙන් කිරීම හා පරිපාලනය සහ නිවාස හිමි නොවූ රජයේ නිලධාරීන් වෙත මහල් නිවාස ලබා දීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මූලික කාර්යයන් හා ඊට අදාළ සෙසු සියලු රාජකාරි කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

### නිල පියස නිල නිවාස ව්‍යාපෘති

මෙම අංශය මඟින් පහත සඳහන් නිල නිවාස ව්‍යාපෘතීන්හි කටයුතු සම්පූර්ණයෙන් නිමකොට රාජ්‍ය නිලධාරීන්ගේ නිල නිවාස පහසුකම් වෙනුවෙන් වෙන්කර ඇත.

- කොළඹ නිල පියස
- මහනුවර නිල පියස
- මොණරාගල නිල පියස
- ගම්පහ නිල පියස

එහිදී මහනුවර නිල පියස හා මොණරාගල නිල පියසයන්හි පරිපාලන කටයුතු අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබා දී ඇති අතර, කොළඹ නිල පියස හා ගම්පහ නිල පියසයන්හි පරිපාලන කටයුතු මෙම අමාත්‍යාංශය යටතේ සිදු වේ.

තවද, පොළොන්නරුව දිස්ත්‍රික්කය කේන්ද්‍රීය කර ගනිමින් අරඹන ලද නිවාස ඒකක 32 කින් සමන්විත නිල පියස නිල නිවාස ව්‍යාපෘතිය

මොරටුව විශ්ව විද්‍යාලයීය උපදේශන සේවය යටතේ සෙන්ට්‍රල් ඉංජිනියරින් පුද්ගලික සමාගම විසින් ඉදි කිරීම් කටයුතු සිදු කරන ලද ව්‍යාපෘතියකි. රජයේ පවතින මූල්‍ය තත්ත්වය මත රාජ්‍ය වියදම් කළමනාකරණය හමුවේ මෙම ව්‍යාපෘතියෙහි ඉදි කිරීම් කටයුතු අංක: අමප/23/0942/605/036 හා 2023.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තාවකාලික පදනම මත නවතා දමන ලදී.

**රජයේ නිල නිවාස**

මෙම අමාත්‍යාංශය මඟින් පාලනය වන පහත නිල නිවාස ගරු අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, රජයේ මාණ්ඩලික නිලධාරීන් සහ රජයේ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ පදිංචිය සඳහා වෙන්කර දීමට කටයුතු කරනු ලබයි.

- කැප්පෙටිපොල මාවත සමුළු නිවාස (නිවාස 104)
- බංගලා නිවාස (නිවාස 52)
- ජයවඩනගම නිවාස (නිවාස 18)
- ලොරිස් පටුමඟ නිවාස සංකීර්ණය (නිවාස 20)
- කොළඹ 08, ගෝතමී පාර නිවාස (නිවාස 02)
- කොළඹ 07 "නිල පියස" නිවාස සංකීර්ණය (නිවාස 40)

- **නිවාඩු බංගලා හා නිවාඩු නිකේතන**

දිවයින පුරා විසිරී සිටින රාජ්‍ය නිලධරයන්ගේ රාජකාරි හා පෞද්ගලික සංචාරක අවශ්‍යතා සපුරාලීම සඳහා නිවාඩු බංගලා 08ක් ද, රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු මහජනතාවගේ සංචාරක අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් නිවාඩු නිකේතන 07 ක්ද මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

**2024 වර්ෂයේ අත්පත් කර ගන්නා ලද සුවිශේෂී ඉලක්ක සහ ජයග්‍රහණ**

- රුපියල් මිලියන 7.9 ක් සහ රුපියල් මිලියන 17.4 ක මුදලක් වැය කරමින් පිළිවෙළින් පොළොන්නරුව හා මහියංගනය නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය කිරීම.
- මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා වෙන් කරනු ලබන ජයවඩනගම නිවාස සංකීර්ණයේ නිවාස ඒකක රාජ්‍ය පරිපාලන අංශයේ සුදුසු නිලධාරීන් සඳහා ලබා දීමට 02/2024 අභ්‍යන්තර චක්‍රලේඛය හඳුන්වා දීම සහ සුදුසු නිවාසලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- මේවනවිට ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොමැති සංචාරක බංගලා සහ නිවාඩු නිකේතනයන්හි ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීම.
- නුවරඑළිය (පැරණි) නිවුරඑළිය නව A1, නුවරඑළිය A2, නුවරඑළිය නව B දියතලාව A හා B, බණ්ඩාරවෙල 1 හා 2, මිහින්තලය, යාපනය, මුලතිව්, කතරගම සහ මොණරාගල යන සංචාරක බංගලා හා නිවාඩු නිකේතන නව සංචාරක ආකර්ෂණයක් ඇති වන පරිදි ප්‍රතිසංස්කරණය කිරීම.
- මිලියන 7.9ක් සහ මිලියන 17.4ක මුදලක් වැය කරමින් පිළිවෙළින් පොළොන්නරුව හා මහියංගනය නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය කිරීම.
- 2023.09.20 දිනැති 20/2023 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ගම්පහ නිල පියස නිල නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 2024.03.14 දින විවෘත කරන ලද අතර එදින සිට නිවාස වෙන් කිරීම ආරම්භ කරන ලදී.
- මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා වෙන්කරනු ලබන ජයවඩනගම නිවාස සංකීර්ණයේ නිවාස ඒකක රාජ්‍ය පරිපාලන අංශයේ සුදුසු නිලධාරීන් සඳහා ලබා දීමට 02/2024 අභ්‍යන්තර චක්‍රලේඛය හඳුන්වා දීම සහ සුදුසු නිවාසලාභීන් තෝරාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

### 2.7.13. විශ්‍රාම වැටුප් අංශය

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය පරිපාලන ලේකම් වෙත බලතල පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම, විශ්‍රාම වැටුප් සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු සම්පාදනය කිරීම, විශ්‍රාමිකයන්ගේ හා විශ්‍රාමික සංගම්වලින් ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු සම්බන්ධීකරණය කිරීම විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදු කෙරේ.

1. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 හා 15 වගන්ති යටතේ විශ්‍රාම ගැන්වූ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විනය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ගොනු සංඛ්‍යාව පහත පරිදි වේ.




**2. විශ්‍රාමික නිලධාරීන් සහ විශ්‍රාමික සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහිත ලිපි සම්බන්ධ ප්‍රගතිය**

| මාසය | ලැබුණු ලිපි සංඛ්‍යාව | ගොනු කරන ලද ලිපි සංඛ්‍යාව | කටයුතු කළ ලිපි සංඛ්‍යාව |
|---|---|---|---|
| ජනවාරි | 247 | 64 | 183 |
| පෙබරවාරි | 209 | 43 | 166 |
| මාර්තු | 249 | 54 | 195 |
| අප්‍රේල් | 188 | 24 | 164 |
| මැයි | 272 | 43 | 229 |
| ජූනි | 231 | 40 | 191 |
| ජූලි | 353 | 45 | 308 |
| අගෝස්තු | 270 | 27 | 243 |
| සැප්තැම්බර් | 239 | 48 | 191 |
| ඔක්තෝබර් | 240 | 50 | 190 |
| නොවැම්බර් | 201 | 17 | 184 |
| දෙසැම්බර් | 293 | 37 | 256 |

3. මෙම අංශය විසින් 2024 වර්ෂය තුළදී විශ්‍රාම වැටුප් වලට අදාළව චක්‍රලේඛ 01 ක්ද, චක්‍රලේඛ ලිපි 02 ක්ද, ගැසට් නිවේදන 01 ක්ද, අමාත්‍ය මණ්ඩල සංදේශ 02 ක් සහ අමාත්‍ය මණ්ඩල සටහන් එක බැගින් නිකුත් කර ඇත.

**4. විශ්‍රාම වැටුප් අංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, චක්‍රලේඛ ලිපි, අමාත්‍ය මණ්ඩල සංදේශ සහ අමාත්‍ය මණ්ඩල සටහන්**

| චක්‍රලේඛ / සංදේශ අංකය | කරුණ |
|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 | සියලුම රජයේ විශ්‍රාමිකයින් වෙත අන්තර්කාලීන දීමනාවක් ගෙවීම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2024<br><br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 02/2024 | වයස අවුරුදු 45 න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයින් වෙත විශ්‍රාම වැටුප් ලබාදීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014, 25/2014 (1) සහ 29/2019 සම්බන්ධයෙනි)<br>සියලුම රජයේ විශ්‍රාමිකයින් වෙත අන්තර්කාලීන දීමනාවක් ගෙවීම |
| අති විශේෂ ගැසට් නිවේදන අංක: 2415/61 (2024.12.20) | "විශේෂඥ වෛද්‍යවරුන්ගේ, ශ්‍රේණිගත වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ, වෛද්‍ය පරිපාලන ශ්‍රේණිවල සියලුම නිලධාරීන්ගේ, විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ගේ සහ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63 විය යුතුය" ලෙස සංශෝධනය කර ඇත. |
| සංදේශ අංකය: PA/Pns-01/74/2024 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ඒ.ජගත් ඩී. ඩයස් මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම |

### 2.7.14. රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අංශය

2024 වර්ෂයේ සුවිශේෂී කාර්ය සාධනයන් සහ ජයග්‍රහණ මෙන්ම ඉදිරි මාසවල ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන්

**1. අමාත්‍යාංශයීය කාර්යයන් ඩිජිටල්කරණය හා අථත්‍යකරණය සඳහා වන උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම**

අමාත්‍යාංශයීය කාර්යයන් ඩිජිටල්කරණය හා අථත්‍යකරණය සඳහා වන උපාය මාර්ගික සැලැස්ම මේ වන විට සකස් කර ඇති අතර, එය ඉදිරියේදී වෙබ් අඩවියෙහි භාෂා ත්‍රිත්වයෙන්ම පළ කිරීමට නියමිතය. එම උපාය මාර්ගික සැලැස්ම මගින් අමාත්‍යාංශය තුළ ඉදිරි වසර 05 තුළ දී ක්‍රියාත්මක

කිරීමට නියමිත ඩිජිටල්කරණ උපාය මාර්ග හඳුනා ගෙන එම උපාය මාර්ග පාදකව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ඇති අතර, රාජ්‍ය පරිපාලන අංශයට අදාළ සැලසුම්ගත ක්‍රියාවලි මේ වන විට ආරම්භ කර ඇත.

**2. රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් (HRMIS) සහ ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) සකස් කිරීම.**

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් (HRMIS) සහ ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) සකස් කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. මේ සඳහා අභිලාෂය පළ කිරීමේ ආරාධන EXPRESSIONS OF INTEREST (EOI) ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇගයීම් කටයුතු සිදු කර අවසන් අතර, ඉහත පද්ධති ද්විත්වය සඳහා සුදුසු උපදේශන සේවා සැපයුම්කරුවන් ද්විත්වයක් තෝරා ගැනීම මේ වන විට අවසන් කර ඇත.

**3. අමාත්‍යාංශ ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන සකස් කිරීම (BPR)**

අමාත්‍යාංශ ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන සකස් කිරීමට අදාළව දැනට රාජ්‍ය සේවයට මාණ්ඩලික නිලධාරීන් සහ ඒකාබද්ධ සේවා තුනකට අයත් නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා වන ක්‍රියාවලි අධ්‍යයනය කිරීම උපදේශන ආයතනයක් මගින් සිදු කරමින් පවතී. ඒ සඳහා UNDP ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය අනුග්‍රහය මත KPMG Consultancy Pvt Ltd උපදේශන ආයතනය තෝරා ගෙන ඇත. එම ආයතනය මේ වන විට අමාත්‍යාංශය සමග එක්ව ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම ක්‍රියාවලිය අදියර 04 කින් යුක්ත වේ. එහි පළමු අදියරේදී සැලසුම් කිරීමත්, දෙවන අදියරේදී දැනට පවතින ක්‍රියාවලීන් එලෙසම හඳුනා ගැනීමත්, තෙවන අදියරේදී අදාළ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කොට දැනට පවතින ක්‍රමවේදයෙහි අඩුපාඩු විශ්ලේෂණය කිරීමත්, සිව්වන අදියරේදී ඩිජිටල්කරණ පද්ධතියක් තුළ ක්‍රියාත්මක කළ හැකි නව ක්‍රමවේදයන් හා ක්‍රියාවලීන් හඳුන්වා දීමටත් අපේක්ෂිත අතර, මේ වන විට අවසන් අදියරේ කටයුතු සිදු වෙමින් පවතී.

**4. ආකෘති පත්‍ර සරල කිරීම**

ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමට අදාළව දැනට අමාත්‍යාංශයේ අභ්‍යන්තර හා බාහිර භාවිතා කරන ආකෘති පත්‍ර වෙනුවට රාජ්‍ය සේවාවන් ඩිජිටල්කරණයට සමගාමීව ඊට අනුරූපී පොදු ආකෘති පත්‍ර හඳුන්වා දීමට මූලික කටයුතු ආරම්භ කර කමිටුවක් පිහිටුවා ඇත.

**5. කාර්යය සහ සේවක සංඛ්‍යා අධ්‍යයනය**

ඉහත අමාත්‍යාංශ ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහනට සමගාමීව දැනට අමාත්‍යාංශ කාර්යයන් හා වැඩ ප්‍රමාණය අධ්‍යයනය කිරීමට ද එමගින් අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය තීරණය කිරීමට ද වැඩසටහන් ආරම්භ කිරීමට නියමිතව ඇත. ඒ සඳහා අවශ්‍ය සංකල්ප හඳුනා ගෙන සුදුසු පරිදි සකස් කර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් නිර්මාණය කිරීමට නියමිතය

### 2.7.15. මූල්‍ය අංශය

මූල්‍ය අංශය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනවල මූල්‍ය කළමනාකරණය හා පාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම උසුලන අතර මෙම අංශය ප්‍රසම්පාදන, මූල්‍ය වාර්තාකරණ, ගෙවීම් හා මානව සම්පත් ගෙවීම් යන ශාඛා 04 කින් සමන්විත වේ.

**2024 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්**

1. රාජ්‍ය පරිපාලන අංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා 2024 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 12,346 සහ 1,062 ක මුදලක් වෙන් කර ඇති අතර, 2024.12.31 දිනට දරන ලද සම්පූර්ණ වියදම රු. මිලියන 4,392 කි.
2. වර්ෂය සඳහා සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25% ක්ද, පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් 33% ක්ද වියදම් කර ඇත.

### 2.7.16. තොරතුරු තාක්ෂණ අංශය

**1. අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ ආරක්ෂාව පවත්වාගෙන යාම සහ වෙබ් අඩවියේ නව යාවත්කාලීන කිරීම් සිදු කිරීම.**

අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ අරක්ෂාව තහවුරු කිරීම සහ අනෙකුත් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වෙබ් අඩවිය සංවර්ධනය කරන ලද ආයතනය සමඟ එළඹි සේවා ගිවිසුම හා SSL සහතිකය ස්ථාපනය කිරීම මෙම වසරේදී ද සිදු කරන ලදි. මෙමගින් අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ ආරක්ෂණ දෝෂ නිවැරදි කර ගනිමින් ආරක්ෂාව තහවුරු කිරීම සිදු කරනු ලබයි.

**2. මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතිය (HRMIS) සහ ලේඛණ කළමණාකරණ පද්ධතිය (DMS) නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය**

වර්තමාන ඩිජිටල්කරණ සන්දර්භය තුළ කඩිනමින් රාජ්‍ය ආයතන හරහා ලාභදායී හා සතුටුදායක සේවා සැපයීම සඳහා ඉතා නිවැරදි මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට අමාත්‍යාංශය මඟින් තීරණය කරන ලදි. සියලුම රාජ්‍ය ආයතන එක් ඩිජිටල්කරණය වූ වේදිකාවකට සම්බන්ධ කිරීම සඳහා ඒකාබද්ධ විස්තීරණ මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් පිහිටුවීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංහ විෂය පථය යටතේ ඇති රාජ්‍ය නිලධාරීන්ගේ දත්ත ඇතුළත් මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමේ මූලික පියවරක් ලෙස ආරම්භ කරන ලද HRMIS ව්‍යාපෘතියට අවශ්‍ය උපදේශන හා තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදි.

**3. තොරතුරු තාක්ෂණික සහය ලබාදීම සඳහා යෙදවුමක් නිර්මාණය කිරීම. (IT Support App)**

අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා තොරතුරු තාක්ෂණික ගැටලු සහ අවශ්‍යතාවලදී සහය ලබා දීම සඳහා මෘදුකාංග යෙදවුමක් නිර්මාණය කිරීම සිදු කරන ලදි. එම යෙදවුම මඟින් අදාළ අංශවල පරිගණක ඉන්වෙන්ට්‍රිය පවත්වාගෙන යාම සහ එක් එක් පරිගණකයේ මතුවන ගැටලු සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ අංශය දැනුවත් කිරීම සිදු කළ හැකිය.

**4. රජයේ නිවාස හා ගොඩනැගිලි කුලී ආදායම් මෘදුකාංගය සංවර්ධනය කිරීම. (Ministerial Rental Information System)**

රජයේ නිවාස හා ගොඩනැගිලි කුළි ආදායම් ගණනය කිරීම සඳහා මෙම මෘදුකාංගය සංවර්ධනය කිරීම සිදු කරන ලද අතර, මූල්‍ය අංශය විසින් ඉදිරිපත් කරන ලද අවශ්‍යතා අනුව නිවාස කුළිය සහ හිඟ කුළිය අය කර ගැනීමට අදාළ තොරතුරු මෙම පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කරන ලද අතර, ඉදිරියටත් මෙම පද්ධතිය සංවර්ධනය කිරීමට නියමිතය.

**5. පරිගණක පද්ධති මෙහෙයුම් මැදිරිය නඩත්තු කිරීම.**

අමාත්‍යාංශයේ ප්‍රධාන මධ්‍ය ජාලකරණ ස්විචය මිලදී ගැනීම, සයිබර් ආරක්ෂාව සඳහා Firewall යන්ත්‍රයේ බලපත්‍ර කාලය තවත් වසරක් සඳහා දීර්ඝ කර ගැනීම, Active directory (Domain Server) හි සේවා ගිවිසුම තවත් වසරක් සඳහා දීර්ඝ කිරීමට කටයුතු කරන ලදි.

**6. ප්‍රති වෛරස පද්ධතිය ස්ථාපනය කිරීම.**

අමාත්‍යාංශය සඳහා නව ප්‍රතිවෛරස මෘදුකාංගයක් මිලදී ගැනීමට කටයුතු කරන ලද අතර, එම පහසුකම වසර 03ක් සඳහා මිලදී ගෙන ඇත. ප්‍රති වෛරස මෘදුකාංගය අමාත්‍යාංශ පරිගණක සඳහා ස්ථාපනය කිරීම මේ වන විට සිදු කර ඇත.

**7. තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

තොරතුරු තාක්ෂණ දැනුම වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රායෝගික භාවිතය, මයික්‍රොසොෆ්ට් පතුරුම්පත් සැකසීම (Microsoft excel), මයික්‍රොසොෆ්ට් දත්ත සමුදාය (Microsoft access), අන්තර්ජාල භාවිතය, තොරතුරු පද්ධති කළමණාකරණය, දත්ත හා තොරතුරු ඵලදායීව ඉදිරිපත් කිරීම වැනි මාතෘකා යටතේ පුහුණු වැඩසටහන් සිදු කරන ලදී.

අමාත්‍යාංශයෙන් බැහැර බාහිර ආයතනයන්හි සේවය කරන නිලධාරීන් වෙත දැනුම සම්ප්‍රේෂණය සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයන් වශයෙන් සහය ලබා දෙන ලදි. ඊට අමතරව අමාත්‍යාංශයේ විවිධ අංශයන්ට අදාළව පුහුණු සැසි සහ රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම (Zoom link සැකසීම වැනි) සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට සහය දක්වන ලදි.

**8. නිවාඩු නිකේතන හා නිවාඩු බංගලා මාර්ගගතව වෙන් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.**

මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන නිවාඩු නිකේතන හා නිවාඩු බංගලා වෙන් කිරීම මාර්ගගත ක්‍රමවේදය යටතේ සිදු කිරීමට අවශ්‍ය මාර්ගගත පද්ධතිය සංවර්ධනය සඳහා තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදි.

**9. නව ඇඟිලි සළකුණු යන්ත්‍ර මිලදී ගැනීම**

අමාත්‍යාංශයේ භාවිතා කළ ඇඟිලි සළකුණු යන්ත්‍ර 2016 වසරේ දී මිලදී ගත් යන්ත්‍ර වන අතර, මෙම යන්ත්‍රවල පැවති දෝෂ තත්ත්වයන් හේතුවෙන් නව යන්ත්‍ර 10ක් මිලදී ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදි.

**10. අමාත්‍යාංශය සඳහා තාක්ෂණික උපකරණ මිලදී ගැනීම**

අමාත්‍යාංශය තුළ දැඩි හිඟයක්ව පැවති පරිගණක, මොනිටර්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර සකස් කිරීම මෙන්ම එම උපකරණ මිලදී ගැනීමෙන් පසු ස්ථාපනය කිරීම ද සිදු කරන ලදි. ඒ අනුව පරිගණක 35ක් ද, මොනිටර් 20ක් ද, මුද්‍රණ යන්ත්‍ර 10ක් ද, ඡායා පිටපත් යන්ත්‍ර 05ක් ද මිල දී ගැනීමට කටයුතු කරන ලදි.

**11. ජාතික භාෂා අංශයේ ජාතික භාෂා ප්‍රතිපත්තිය නඟා සිටුවීම සඳහා පද්ධතියක් නිර්මාණය කිරීම.**
**(Monitoring and Evaluation and Learning System – MEL System)**

2024.09.27 දිනැති අංක: 2403/53 දරණ අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කිරීමට පෙර පැවති රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පැවති ජාතික භාෂා අංශය යටතේ ක්‍රියාත්මක වූ National languages Equality Advancement (NLEAP) ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ඇති විවිධ රාජ්‍ය ආයතනවල භාෂා ප්‍රතිපත්තිය නඟාසිටුවීම සඳහා දැනුම ලබා දීම, දත්ත ලබා ගැනීම සහ ඇගයීම් සිදු කිරීම කරනු ලබන අතර, ඒ සඳහා Monitoring and Evaluation and Learning System (MEL System) යනුවෙන් පද්ධතියක් නිර්මාණය කිරීමට කටයුතු කරන ලදි. මෙය වෙබ් අඩවියේ යෙදවුමක් ලෙස සංවර්ධනය කිරීම සඳහා කටයුතු සැළසුම් කර ඇති අතර, එය නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

### 2.7.17. මානව සම්පත් සංවර්ධන අංශය

- **අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම**

මානව සම්පත් සංවර්ධන අංශය විසින් අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් සඳහා

ධාරිතා සංවර්ධන වැඩසටහන් සේවා ගණයන් අනුව විශේෂීකරණය වෙමින් භෞතික ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමට කටයුතු කර ඇත.

- **අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය**

| සේවා ගණය | දේශීය පුහුණු පාඨමාලා | | විදේශීය පුහුණු පාඨමාලා | |
|---|---|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන | කෙටි කාලීන | දිගු කාලීන |
| කළමනාකරණ | 11 | 06 | 11 | - |
| කළමනාකරණ නොවන | 72 | - | - | - |

**සේවාරම්භක පුහුණුව ලබා දීම.**

| සේවාව | සේවාරම්භක පුහුණුව ලබා දීම |
|---|---|
| **ඒකාබද්ධ සේවා** | |
| **පුස්තකාලයාධිපති සේවය** | III ශ්‍රේණියට බඳවාගත් නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව මැයි මස පවත්වා ඇත. |
| **කළමනාකරණ සේවා නිලධාරි සේවය** | සීමිත පදනමින් බඳවාගත් අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව පෙබරවාරි මස පවත්වන ලදී.<br>සීමිත පදනමින් III ශ්‍රේණියට බඳවාගත් නිලධාරීන් 729 ක් සඳහා සේවාරම්භක පුහුණුව පවත්වා ඇත. |

- **අමාත්‍යාංශයෙන් බැහැර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය**

2024 වර්ෂය සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවය 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවය නිදහස් කිරීම වෙනුවෙන් පවත්වනු ලබන දින 10 ක පුහුණු පාඨමාලාව පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලබා දීම සහ එහි ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. බදුල්ල, ගම්පහ, ත්‍රිකුණාමලය, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මොණරාගල, මඩකලපුව, ගාල්ල (මාතර), රත්නපුර, අනුරාධපුර, කිලිනොච්චි, කොළඹ, අම්පාර, මාතලේ යන දිස්ත්‍රික්ක මේ වන විට ප්‍රතිපාදන ලබා දී ඇති දිස්ත්‍රික්ක වේ.

රාජ්‍ය සේවයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් මාලාවෙහි කොළඹ, ගම්පහ, කළුතර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 05 ක් මේ වන විට පවත්වා ඇති අතර, නිලධාරීන් 1,012 දෙනෙක් පුහුණුව ලබා ඇත.

- **කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම**

අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුගත තනතුරු දරන ප්‍රාථමික, ශිල්පීය සේවා ගණයේ නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත.

- **දූෂණ විරෝධී පුහුණුකරුවන් හා සුපිළිපන්න නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන**

පළාත් නවය සහ රේඛීය අමාත්‍යාංශ ආවරණය කරමින් දිවයින පුරා දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ නේවාසික පුහුණු වැඩසටහන් 10 ක් සහ සුපිළිපන්න නිලධාරීන් පුහුණු කිරීමේ එක් දින පුහුණු වැඩසටහන් 10 ක් මානව සම්පත් සංවර්ධන අංශයේ සම්බන්ධීකරණ සහාය ඇතිව සංවිධානය කර පවත්වන ලදී.

2025 – 2029 සඳහා නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම සඳහා පළාත් නවයම ආවරණය වන පරිදි ජනතා අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වැඩසටහන් මාලාවක් අගෝස්තු මාසය පුරා සංවිධානය කර පවත්වන ලදී.

- **පුහුණුවීම් සඳහා දේශීය / විදේශීයව එළැඹ ඇති ගිවිසුම් පිළිබඳ තොරතුරු**

– **ශ්‍රී ලංකා මධ්‍යම සහ ඌව පළාත්වල කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය – (KOICA)**

මෙම ව්‍යාපෘතිය නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය, වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ සහ අඹන්ගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සහ බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය, රිදීමාලියද්ද, හල්දුම්මුල්ල, බදුල්ල, බණ්ඩාරවෙල හා වැලිමඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක අතර, එමඟින් තිරසාර සුරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සැපයීම, ජලය, සනීපාරක්ෂාව හා ස්වාස්ථ්‍යතාව ආශ්‍රිත රෝග අවම කිරීම, පුද්ගලික ස්වස්ථතාව සහ පාරිසරික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම, නිවාරක හා රෝගනාශක ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් වැඩිදියුණු කිරීම, යහපත් කෘෂිකාර්මික පහසුකම් හා ව්‍යාපෘති සේවා වැඩිදියුණු කිරීම, පසු අස්වනු හානි අවම කිරීම සහ තෝරාගත් ප්‍රදේශවල ආහාර සුරක්ෂිතතාව සහ ගෘහ ආදායම ඉහළ නැංවීම අරමුණු කර ඇත. ව්‍යාපෘතියේ 2024.11.30 දිනට ප්‍රගතිය 65% ක් වේ.

– **රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර යාන්ත්‍රණයක් හඳුන්වාදීම**

සේවාස්ථාන ප්‍රතිසංස්කරණ තුළින් ශ්‍රී ලංකාව තුළ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු රාජ්‍ය සේවයක් ගොඩනැගීම සඳහා මෙම අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) එක්ව රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර යාන්ත්‍රණයක් හඳුන්වාදීම සඳහා කටයුතු කරමින් පවතී.

මීට අදාළ ව්‍යාපෘති වාර්තාවට 2024.04.30 දින අත්සන් තබා ඇති අතර, රාජ්‍ය ආයතනවල සේවා ස්ථාන සංසද හා ආංශික සංසද පිහිටුවීමේ කටයුතු හා ඊට අදාළ දැනුවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එසේම පළාත් සමථකරණ මණ්ඩල පිහිටුවීමේ කටයුතු හා ජාතික බේරුම්කරණ සංචිතය පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

එසේම පළාත් සමථකරණ මණ්ඩල පිහිටුවීමට අදාල කටයුතු හා ජාතික බේරුම්කරණ සංචිතය පිහිටුවීමට අදාලද සංකල්ප පත්‍රිකා සකස් කර නීතිපතිතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- **අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

අමප/22/1049/605/017 හා 2022 සැප්තැම්බර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ - ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමක් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා UN Habitat ආයතන මගින් සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්මට (2022-2025) අනුව 65% ක ප්‍රගතියක් මේ වන විට ළඟා කරගෙන ඇත.

අමප/23/2138/605/068 හා 2023 නොවැම්බර් 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම යටතේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2024 නිකුත් කර ඇති අතර, ඒ අනුව අංශ 05 ක් සඳහා සේවාස්ථාන සංසද පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. රාජ්‍ය පරිපාලන අංශයේ සේවා ස්ථාන සංසද සහ ආංශික සංසද පිහිටුවා ඇත.

අමප/24/2087/816/003 හා 2024 දෙසැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව "දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් විධායක නිලධාරීන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ ඉන්දියානු ජනරජය වෙනුවෙන් යහපාලනය සඳහා වන ජාතික මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම" පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය ලබාදුන් අතර, ඒ අනුව උක්ත ගිවිසුමට අත්සන් තැබීම 2024 දෙසැම්බර් 10 වන දින කොළඹ දී සිදුවිණි.

- **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා 14/2022 (II) ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නිලධාරින්ගේ ඉල්ලීම් සඳහා කමිටු නිර්දේශ ලබාදීම.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හා 02/2018 (1) චක්‍රලේඛවලට අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය දැනුම ලබා දීමට අදාළ පුහුණු වැඩසටහන් දකුණ, බස්නාහිර, වයඹ, උතුරුමැද, සබරගමුව, බස්නාහිර පළාත් සභාව යන පළාත්වල නිලධාරීන් 923 ක් සඳහා පැවැත්වීම.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2024 අනුව අංශ 05 ක් සඳහා (සෞඛ්‍යය, ප්‍රවාහන, අධ්‍යාපන, විදුලිබල හා බලශක්ති, වරාය හා ගුවන්සේවා) සේවාස්ථාන සංසද පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. රාජ්‍ය පරිපාලන අංශයේ සේවා ස්ථාන සංසද සහ ආංශික සංසද පිහිටුවා ඇත.

| සේවා මට්ටම | පුහුණු පාඨමාලාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| **තෘතියික** | පැය 200 පාඨමාලාව ප්‍රවීණතාව | **02** |
| **ද්වීතියික** | පැය 150 පාඨමාලාව ප්‍රවීණතාව | **163** |
| **ප්‍රාථමික** | පැය 150 පාඨමාලාව ප්‍රවීණතාව | **88** |

- **දෙමළ භාෂා පුහුණු පාඨමාලාව**

  අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා දෙමළ භාෂා පුහුණු පාඨමාලාව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සම්පත්දායකත්වය යටතේ ප්‍රධානතම පුහුණු වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක කර ඇත.

## 2.7.18. පාර්ලිමේන්තු කටයුතු අංශය

පාර්ලිමේන්තු කටයුතු අංශය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භෞතික හා සේවා අවශ්‍යතා සපුරාලීම සහ ගරු මන්ත්‍රීවරුන්ගේ කාර්යමණ්ඩල වෙනුවෙන් නියමිත සේවා ලබා දීමට පිහිටුවා ඇති ආයතනයකි. මෙම ආයතනය හරහා මන්ත්‍රී කාර්යමණ්ඩලය පත් කිරීම, සේවය අවසන් කිරීම හා වැටුප් හා පාරිතෝෂික ලබා දීම, පුහුණු කිරීම, ගරු මන්ත්‍රීවරුන්ට තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර ලබාදීම, ගරු මන්ත්‍රීවරුන් සඳහා සමූහ රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් වසර 3කට වරක් කාර්යාල උපකරණ ලබාදීමේ ප්‍රධාන කාර්යයන් සිදුකෙරේ.

### 2024 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සුවිශේෂී වැඩසටහන්

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2022 අනුව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට තාවකාලිකව අනුයුක්ත කරන රජයේ නිලධරයින්ට නිවාඩු දුම්රිය බලපත්‍ර හා අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබා දීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2022(ii) කෙටුම්පත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

2. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩලය පත්කිරීම්, පත්කිරීම් පවත්වා ගෙන යාම සහ පත් කිරීම අවසන් කිරීම හා සම්බන්ධ කාර්ය පටිපාටිය උපදෙස් සංග්‍රහයක් ලෙස සකස් කිරීම හා එය 10 වන පාර්ලිමේන්තුවට තේරී පත් වූ නවක මන්ත්‍රීවරුන් වෙත ලබා දීම.

3. 10 වන පාර්ලිමේන්තුවට තේරී පත්වූ මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලය පත් කිරීම, රාජ්‍ය නිලධරයින් තාවකාලිකව මුදාහැර ගැනීම හා රාජ්‍ය ව්‍යවසායයන් හි සේවය කරන නිලධාරීන් වැටුප් රහිත පදනමින් අනියුක්ත කර ගැනීමට අදාළව විධිමත් ආකෘතිපත්‍ර කට්ටලයක් හඳුන්වාදීම.

4. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මන්ඩලයේ නිලධාරීන් ජාතික මැතිවරණ පැවැත්වීමේදී දැනුම්වත් විය යුතුම යාවත්කාලීන මැතිවරණ නීතිය හා නව ප්‍රවණතා පිළිබඳව රාජ්‍ය නිලධරයන්ට ද සහභාගි විය හැකි පරිදි දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ප්‍රමාණිත විද්වතුන්ගේ සම්පත්දායකත්වයෙන් පවත්වන ලදී.

5. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කෘත්‍රිම බුද්ධිය සහ රෝබෝ තාක්ෂණය පිළිබඳ නව ප්‍රවණතා සම්බන්ධව ලෝකයේම ගෞරවයට පත් විරලව සම්බන්ධ කරගත හැකි සම්පත්දායකයෙක් වන මහාචාර්ය ත්‍රිෂාන්ත නානායක්කාර (Director of Morph Lab Professor of Robotics, Imperial College Landon) මහතාගේ සම්පත්දායකත්වයෙන් මාර්ගගත පුහුණු වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

6. 2024.08.20 දින සිට ආරම්භ වන නව රක්ෂණ වර්ෂය සඳහා Soft logic Life Insurance PLC ආයතනය යටතේ රුපියල් මිලියනක ප්‍රතිලාභ හිමිවන සමූහ රක්ෂණ ක්‍රමවේදයක් ගරු පාර්ලිමේන්තු මන්තුවරුන් සඳහා ක්‍රියාත්මක කිරීම.

7. 2022 මාර්තු 31 වන දින සිට 2022 ජූලි 22 දින දක්වා වූ කාල සීමාව තුළ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගරු පාර්ලිමේන්තු

මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික දේපළවලට සිදු වූ අලාභ හානි වෙනුවෙන් මූල්‍යමය හානිපූරණය සිදු කර ඇත.

8. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන සමූහ රක්ෂණය මඟින් 2023.08.20 සිට 2024.08.19 දක්වා වන රක්ෂණ වර්ෂය තුළ රක්ෂණ ප්‍රතිලාභ ලෙස රුපියල් තිස් හත් මිලියන පන්සිය හැට හතර දහස් නවසිය පනස් පහයි ශත දහ තුන (රු. 37,564,955.13 ක) මුදලක් ලබා දී ඇත.

9. වසර 3 කට වරක් ක්ෂය පදනම මත ලබා දෙන කාර්යාලීය උපකරණ 2024 වර්ෂය තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 57 ක් වෙනුවෙන් ලබා දී ඇත.

## 2.7.19. ජාතික භාෂා අංශය

1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
2. රාජ්‍ය ආයතනවල ද්විභාෂා පරිසරයක් නිර්මාණය කිරීමට සුදුසු වටපිටාවක් ගොඩනැගීම.
3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව මහජනතාව බලාත්මක කිරීම.
4. භාෂා ප්‍රචාරණයට සහ ප්‍රවර්ධනයට අදාලව ශ්‍රී ලංකාවේ ජනයා අතර ධනාත්මක මානසිකත්වයක් උත්පාදනය කිරීම

**ජාතික භාෂා සංවර්ධන වැඩසටහන (2509) යටතේ ක්‍රියාත්මක වැඩසටහන්**

- **වාර්තාමය චිත්‍රපටයක් සකස් කිරීම**

සියළු ජන සංස්කෘතික අනන්‍යතාවයන් සුරකින සමගි සම්පන්න ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැගීම සාක්ෂාත් කර ගැනීම උදෙසා භාෂාව තුලින් සහජීවනය පිළිබිඹු වන පරිදි "ලෙන්ගතුකම" වාර්තාමය චිත්‍රපටිය (Documentary Film) ජාතික භාෂා අංශය හා අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය සමග එක්ව සකස් කරන ලද අතර, ඊට අදාළව රු. 487,000.00 වියදමක් දරා ඇත.



**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීම සඳහා දිවයින පුරා වැඩමුළු පැවත්වීම**

රාජ්‍ය නිලධාරීන් දිරිමත් කිරීම සඳහා රාජ්‍ය පුහුණු කිරීම ට අදාලව මාතලේ, අනුරාධපුර, කුරුණෑගල, මොණරාගල, යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්කයකට 01 බැගින් වැඩමුළු 04 ක් පවත්වා ඇත.

- **භාෂා සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් පසු විපරම් වැඩ සටහන් පැවැත්වීම**

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ආයතන දැනුවත් කරමින් භාෂා සැලසුම් සකස් කරන පුහුණු වැඩ සටහන් පවත්වන බැවින් එම කාර්යයන් ක්‍රියාවේ යෙදවීම පිළිබඳ පසුවිපරම් වලට අදාලව කෑගල්ල හා ගාල්ල දිස්ත්‍රික්කවල වැඩසටහන් 2ක් පවත්වන ලද අතර ඒ සඳහා රු.මි 12 ක් වියදම් දරා ඇත.

- **"MEL" පද්ධතිය හඳුන්වාදීම සහ "MEL" පද්ධතිය හඳුන්වාදීම සඳහා වැඩමුළු පැවැත්වීම**

මීට අදාල මෘදුකාංගය අවසන් කර ඇති අතර ජාතික භාෂා අංශය වෙත භාෂා සැලසුම් ඉදිරිපත් කර ඇති ආයතනවල තොරතුරු ඇතුලත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු තොරතුරු තාක්ෂණ අංශය මගින් සකස් කර දීමට නියමිතය.

- **පාසල් ළමුන් සඳහා දෙවන භාෂා සංගම් 04 පිහිටුවීම**

2024 වර්ෂයේ සංස්කෘතික හුවමාරු වැඩසටහන් සිදුකරන ලද රත්නපුර, මඩකලපුව, මාතලේ, යාපනය යන දිස්ත්‍රික්කවල පාසල් 04ක් තෝරා ගැනීම සිදු කරන ලදි. ඒ අනුව තෝරාගත් පාසල්වල මෙම සංගම් පිහිටුවීම සඳහා අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ලබා දෙන ලදී. මේ සඳහා රු.588,800.00ක් වියදමක් දරා ඇත.

- **සංස්කෘතික හුවමාරු වැඩසටහන් පැවැත්වීම**

විවිධ ජන කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය විශ්වාසය හා මිත්‍රත්වය ඇති කරමින් එකම ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැගීම, විවිධ සංස්කෘතික වටිනාකම් පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කිරීම තුළින් එකිනෙකාට ගරු කිරීමට පෙළඹවීමක් ඇති කිරීම, ඒ ඒ ජන කණ්ඩායම්හි භාෂාවන් පිළිබඳ ප්‍රායෝගික භාවිතාව පුළුල් කිරීම සහ අන්තර් සංස්කෘතික සහයෝගීතාව වර්ධනය වීම තුළින් තිරසාර සාමය ගොඩ නැගීමට අවශ්‍ය මංපෙත් විවර වීම යන කරුණු අරමුණු කරගනිමින් රත්නපුර, මඩකලපුව, මාතෙල් හා යාපනය යන දිස්ත්‍රික්ක වල සංස්කෘතික හුවාරු වැඩසටහන් මඟින් පවත්වා ඇත. මේ සඳහා රු.මි 02 ක් වියදම් දරා ඇත.

- **රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය සඳහා ඒකාංගික ටෙලිනාට්‍ය තරඟාවලියක් පැවැත්වීම**

මේ සඳහා 2024 වසර තුළදී භාෂාව හා සහජීවනය පිළිබඳ පණිවිඩය ජනතාව වෙත රැගෙන යාම සඳහා ඒකාංගික ටෙලි නාට්‍ය තරඟාවලියක් පවත්වා හොඳම ටෙලි නාට්‍ය තේරීමට කටයුතු සංවිධානය කරන ලද අතර,අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිර්මාණකරුවන්ගේ නිර්මාණ ගෙන්වා ගෙන ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චය සිදුකර, මුදල් ත්‍යාග, සම්මාන හා කුසලතා සහතිකපත් ජයග්‍රාහකයින් වෙත ප්‍රදානය කිරීම රාජ්‍ය භාෂා දිනයට සමගාමීව සිදුකරන ලදී. මේ සඳහා මේ සඳහා රු.589,960.00ක වියදමක් දරා ඇත.

- **රාජ්‍යභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම බලාත්මක කරනු වස් රාජ්‍ය භාෂා දිනය හා සමගාමී සතිය ක්‍රියාවට නැංවීම**

දිවයින පුරා ජාතික භාෂා දිනය හා සමගාමී සතිය සැමරීම සඳහා දිස්ත්‍රික්ක 24 ක රාජ්‍ය ආයතන, පොදු ජනතාව, පාසල්වල ගුරුවරුන් සහ ශිෂ්‍ය නායක නායිකාවන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීම මෙහිදී සිදුකරන ලද අතර රාජ්‍ය භාෂා දිනයේ සමාප්තිය උළෙල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී 2024.07.05 වන දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් සැමරූ අතර, අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය ද මේ සඳහා සහභාගී කර ගන්නා ලදි.

- **රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම උදෙසා කෙටි කථා**

**පොත් දෙකක් සිංහල භාෂාවට හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම**

රාජ්‍ය සම්මානලාභී ප්‍රවීණ ලේඛිකාවක් වන විරාජිනී තෙන්නකෝන් මියගේ “අන්ධයා සහ සුරුවටු න්‍යාය”කෙටි කතා සංග්‍රහය දෙමළ බසට පරිවර්තනය කිරීම හා ප්‍රවීණ දෙමළ ලේඛිකාවක් වන මන්ඩූර් අසෝකා මියගේ “එලුදප්පඩාද කවිදෙහල්” කෙටි කතා සංග්‍රහය සිංහල බසට පරිවර්තනය කිරීම සිදු කර ඇත.



“අන්ධයා සහ සුරුවටු න්‍යාය”කෙටි කතා සංග්‍රහයදෙමළ බසටපරිවර්තනයකිරීම

- **පාසල් තුල ඉංග්‍රීසි භාෂා සංගම් ඇති කිරීම (ආදර්ශ 02ක්)**

පාසල් සිසුන් අතර ඉංග්‍රිසි භාෂාව ප්‍රචලිත කිරීම සඳහා තෝරාගත් පාසල් දෙකක Gavel සංගම් ඇති කිරීම සඳහා නියමු ව්‍යාපෘතිය ලෙස බම්බලපිටිය ශාන්ත මරියා දෙමළ මහා විද්‍යාලය සහ හොරණ තක්ෂිලා මධ්‍ය මහා විදාලය යන පාසල් 02තෝරාගෙන, කටයුතු සිදු කරමින් පවතී.

- **පළාත් රාජ්‍ය සේවයේ ආයතන ප්‍රධානීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව දැනුවත් කිරීම සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය නිළධාරීන් දිරිමත් කිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහනක්ද වයඹ පළාත් සභාවේද වැඩමුළුවක් දකුණු පළාත් සභාවට අයත් රාජ්‍ය ආයතන සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත්භාවය සහ පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ වැඩමුළුවක් සහ ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන කරන ලදි. දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන කරන ලදි. පිළිබඳ දැනුවත්භාවය සහ පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ වැඩමුළුවක් සහ ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන කරන ලදි.

- **පළාත් රාජ්‍ය සේවයේ ආයතන සඳහා පසුවිපරම් වැඩසටහන් පැවැත්වීම**

ශ්‍රී ලංකාව පුරා පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය ආයතන දැනුවත් කරමින් භාෂා සැලසුම් සකස් කරන පුහුණු වැඩ සටහන් පවත්වන බැවින් එම කාර්යයන් ක්‍රියාවේ යෙදවීම පිළිබඳ පසුවිපරම් කිරීම සිදු කරනු ලබයි. ඒ සඳහා එක් දින වැඩ සටහන් 05 ක් පැවැත්වීමට සංවිධානය කර ඇති අතර, සබරගමුව පළාත් සභාවේ මෙම වැඩසටහන 2024.03.27 දින රු 19,810.00ක් වියදමක් දරා නිම කර ඇත.

- ධාරිතා වර්ධන වැඩ සටහන

ජාතික භාෂා අංශයේ නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම්කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර වරුන් සහ රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නිලධාරීන් පුහුණු කිරීම ජාතික අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේදී සිදුකරන ලදි.

මෙම වාර්තාවේ ඇතුළත් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.



එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

# 03. පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | 2024 | සත්‍ය 2,024 රු. | සත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 1,860,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 2,044,279,789 | 1,790,807,383 | ඒසීඒ-1 |
| **1,860,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **2,044,279,789** | **1,790,807,383** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 38,384,045,454 | 369,923,199,465 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 100,270,138 | 195,705,368 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 2,099,440,408 | 681,798,712 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **40,583,756,000** | **370,800,703,545** | |
| **1,860,000,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **42,628,035,788** | **372,591,510,929** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **39,752,202** | | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **42,588,283,586** | **372,591,510,929** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 10,390,889,610 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 3,684,639,778 | 12,667,148,342 | ඒසීඒ-2(II) |
| 1,147,758,040 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 887,151,650 | 1,077,028,132 | ඒසීඒ-2(II) |
| 723,395,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 596,242,596 | 1,433,956,887 | ඒසීඒ-2(II) |
| | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(II) |
| 2,973,350 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 1,371,550 | 1,320,605 | ඒසීඒ-2(II) |
| **12,265,016,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **5,169,405,574** | **15,179,453,968** | |
| | **මූලධන වියදම්** | | | | |
| 221,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 175,092,753 | 115,728,190 | ඒසීඒ(ii) |
| 641,286,077 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 93,153,804 | 126,340,821 | ඒසීඒ(ii) |
| 5,265,585,270 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 1,552,168,737 | 712,776,481 | ඒසීඒ(ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ(ii) |
| 135,010,000 | හැකියා වර්ධනය | 14 | 36,021,682 | 36,523,798 | ඒසීඒ(ii) |
| 28,463,298,653 | වෙනත් මූලධන වියදම් | 15 | 16,613,591,077 | 23,276,504,083 | ඒසීඒ(ii) |
| **34,726,780,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **18,470,028,053** | **24,267,873,373** | |
| | තැන්පතු ගෙවීම් | | 143,586,751 | 302,513,575 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 246,255,947 | 951,932,941 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **389,842,698** | **1,254,446,516** | |
| 46,991,796,000 | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **24,029,276,325** | **40,701,773,857** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **18,559,007,261** | **331,889,737,072** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 18,555,291,238 | (331,889,737,072) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 3,716,023 | - | ඒසීඒ-3 |
| | | | **18,559,007,261** | **331,889,737,072** | |

1

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සැබෑ 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 15,717,369,276 | 14,373,881,123 |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(අ) | 218,922,451 | 2,089,992,065 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 15,936,291,727 | 16,463,873,188 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 57,127,003 | 1,879,710,873 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 15,717,369,276 | 14,373,881,123 |
| කුලී සහ වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(ආ) | - | 17,885,153 |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 158,079,425 | 201,396,039 |
| අයිරා ශේෂය | ඒසීඒ-3 | 3,716,023 | - |
| මුළු වගකීම් | | 15,936,291,727 | 16,463,873,188 |

පිටු අංක ...[illegible]... සිට ...[illegible]... දක්වා ගිණුම් 1 සිට ගිණුම් 7 දක්වා වූ ප්‍රකාශ ප්‍රතිපත්තීන් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...[illegible]... සිට ...[illegible]... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අත්‍යවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2024 චක්‍රලේඛනයේ අනුකූලව සිදුකර ඇත. [illegible] ගිණුම් සටහන් හා [illegible] ගිණුම් තොරතුරු හා භාණ්ඩාගාර ගිණුම් [illegible] බවත් අපගේ [illegible] මෙයින් සහතික කරමු.

මූල්‍ය වාර්තාකරණය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ගිණුම්කරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමෙන් ඒ අනුව එම පද්ධති වල [illegible] ක්‍රියාත්මක කිරීමට [illegible] බවත් මෙයින් සහතික කරමු.

| | |
|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී |
| නම : එස්. ආලෝකබණ්ඩාර | නම : ශීලා හේමන්ති රණසිංහ |
| තනතුර : ලේකම් | දිනය : 2025.02.[illegible] |
| දිනය : 2025.02.27 | |

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ශීලා හේමන්ති රණසිංහ
ප්‍රධාන මූල්‍ය නිලධාරී
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

2

## 3.2.1. අක්මුදල් ගැලපුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| Add :- | වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආ | 2,005,739,299 | |
| | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් | 31,399,810,137 | |
| | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙ | 1,788,163,852 | |
| | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් | 255,599,627 | |
| | | | 35,449,312,915 |
| අඩු කළා : | අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කර | 150,641,997 | |
| | වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් | 16,559,651,875 | |
| | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙ | 39,478,680 | |
| | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් | 144,249,125 | |
| | | | 16,894,021,677 |
| | **2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය** | | **18,555,291,238** |

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

[illegible]

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සැබෑ 2024 රු. | 2023 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ ලාභාංශ | 38,540,489 | 26,136,215 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් භාණ්ඩාගාර තීරු වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 150,541,997 | 84,735,550 |
| අග්‍රිම ලැබීම් | 38,384,045,454 | 368,923,199,465 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 1,883,119,460 | 78,607,308 |
| වෙනත් ලැබීම් | 100,270,139 | 195,705,169 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 40,556,817,539 | 369,308,383,707 |
| **අඩු කළා : මුදල් වියදම් කිරීම** | | |
| පුද්ගල පඩිනඩි හා සේවානියුක්ත ප්‍රතිලාභ | 2,312,026,683 | 2,197,377,667 |
| සහනාධාර සහ මාරුකිරීම් | 387,365,062 | 110,841,453 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 31,399,810,137 | 362,889,261,910 |
| භාණ්ඩාගාරයට සිදු කරන ලද ගෙවීම් | 39,752,202 | |
| අත්තිකාරම් ගෙවීම් | 1,893,886,697 | 92,929,717 |
| වෙනත් ගෙවීම් | 143,586,751 | 302,513,576 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 36,176,427,532 | 365,592,924,323 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | 4,380,390,007 | 3,715,459,384 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| විශ්‍රාම ප්‍රතිපාදන හා ආයෝජන වත්කම් විකිණීම | - | - |
| ප්‍රාග්ධන ආදායම් ලැබීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| **අඩු කළා : මුදල් වියදම් කිරීම** | | |
| භෞතික වත්කම් අත්පත් කර ගැනීම හා වෙනත් ආයෝජන ඇතුළත් කිරීම | 4,380,390,007 | 3,715,459,384 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ඉ) | 4,380,390,007 | 3,715,459,384 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | (4,380,390,007) | (3,715,459,384) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ) | 0.00 | 0.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ලැබීම් | - | - |
| විදේශීය ණය ලැබීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| **අඩු කළා : මුදල් වියදම් කිරීම** | | |
| දේශීය ණය ආපසු ගෙවීම | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) + (ඒ) | 0.00 | 0.00 |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | 0.00 | 0.00 |

3

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

### වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

පුනරාවර්තන හා පුනරාවර්තන නොවන ආදායම් එය ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට සහතිකවක් ඇති විට හා එම වත්කමේ විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

6

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේත විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කළ ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් අගය | සංශෝධිත අගය | අගය (.රු) | සංශෝධිත ආදායම ඇස්තමේන්තු ප්‍රතිශතයක් ලෙස |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලියට දීම | 1,650,000,000 | 1,700,000,000 | 1,803,557,794.32 | 106% ඇස්තමේන්තුවට වඩා 6% ක් වැඩියෙන් ආදායම් එකතු කර ඇත. |

## 3.6. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදනය | | තථ්‍ය වියදම | ප්‍රතිපාදන භාවිතය සංශෝධිත ප්‍රතිපාදන ක් % ලෙස |
|---|---|---|---|---|
| | මුදල් ප්‍රමාණය | සංශෝධිත | | |
| පුනරාවර්ථන | 11,948,000,000 | 10,946,016,000 | 4,130,736,304.25 | 38% |
| ප්‍රාග්ධන | 1,020,000,000 | 1,061,780,000 | 264,100,721.61 | 25% |

## 3.7. මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිදාන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබාදුන් අවසාන ප්‍රතිපාදනව ල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| අදාල නොවේ | | | | | | |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය | 2024.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ක් ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | භාණ්ඩ සමීක්ෂණය මඟින් වටිනාකම තක්සේරු කිරීමක් සිදු නොවන බැවින් ශේෂයක් වාර්තා කළ නොහැක. | 9,156,152,247.66 | සියළුම වාර්තා වූ වත්කම් ගිණුම් ගතකර ඇත. වාර්තා කිරීමට නියමිත වත්කම් නොමැත. | 100% |
| 9152 | යන්ත්‍රෝකරණ සහ උපකරණ | | 1,797,625,433.22 | | 100% |
| 9153 | ඉඩම් | | 3,905,530,000.00 | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 48,865,317.63 | | 100% |
| 9155 | ජීව වත්කම් | | - | | 100% |
| 9160 | වැඩ කරමින් පවතින | | 714,196,277.38 | | 100% |
| 9180 | බදු වත්කම් | | 95,000,000.00 | | 100% |

## 04. පරිච්ඡේදය - 2024 වර්ෂයේ අමාත්‍යාංශයීය කාර්යසාධන දර්ශක

| # | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 75%-89% | 50%- 74% |
| 1 | රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක් " ඇති කිරීම පිණිස අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | | ✓ | |
| 2 | ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය. | | ✓ | |
| 3 | පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන්. | ✓ | | |

## 05. පරිච්ඡේදය - 2024.12.31 දිනට තිරසර සංවර්ධන අරමුණු (SDG) ළඟා කරගැනීමේ ප්‍රගතිය

| අනු අංකය | අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ළඟා කරගෙන ඇති ප්‍රගතිය 0%-49% | 50%-74% | 75%-100% | අදාල අංශය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 8. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.2 නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් ඵලදායී රාජ්‍ය සේවය ඇති කිරීම | අමාත්‍යාංශයේ මානව සම්පත් ඵලදායීතාවය වැඩිකිරීමට පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | | √ | මානව සම්පත් සංවර්ධන |
| | | | ජාත්‍යන්තර දැනුම පිරිපුන් නිලධාරීන් පිරිසක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන වල නිලධාරීන් වෙනුවෙන් ලබා දුන් කෙටිකාලීන/ දිගුකාලීන පුහුණු සංඛ්‍යාව | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලැබෙන විදේශ පුහුණු පාඨමාලා සඳහා 2024 වර්ෂය තුල නිලධාරින් 15 දෙනෙකු පුහුණු පාඨමාලා 11 සඳහා යොමු කර ඇත. | | | |
| 2 | 9. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම පූර්ණ සහ තිරසර කාර්මීකරණයේ ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම | 9.1 අමාත්‍යාංශය සතු යටිතල පහසුකම් ඉහළ ගුණාත්මකභාවයෙන් විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන පරිදි සංවර්ධනය කිරීම | වර්ෂය තුල වෙන්වූ ප්‍රතිපාදන අනුව අලුත්වැඩියා කලයුතු සංචාරක බංගලා අතුරින් අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා සංඛ්‍යාව | | √ | | අභ්‍යන්තර පාලන |
| | | 9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහ පැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහුසකම් ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | අමාත්‍යාංශ පරිශ්‍රයේ තීන්ත ආලේප කිරීමේ කටයුතුවලින් කොටසක් සම්පූර්ණ කිරීම | | √ | | |
| 3 | 12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් තහවුරු කිරීම | 12.7 ජාතික ප්‍රමුඛතාවයන් අනුව තිරසර මහජන ප්‍රතිසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම් සඳහා පූර්ණ ධාරිතාවයෙන් යුතුව පවත්වාගෙන යාම | ප්‍රසම්පාදන කටයුතු සඳහා අයවැය අරමුදල් උපයෝජන ප්‍රතිශතය | | √ | | ගිණුම් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | 16. තිරසර සංවර්ධනය සඳහා වූ සාමකාමී හා අන්තර්ග්‍රහණය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණත්වයේ සඳහා ප්‍රවේශයේ සැපයීම හා වගවීමක් සහිත හා අන්තර්ග්‍රහණය වූ ආයතන ඇති කිරීම | 16.6 සෑම මට්ටමකින්ම ඵලදායී, වගවීම සහ විනිවිදභාවයෙන් යුතු ආයතන සංවර්ධනය කිරීම | නියමිත කාලය තුළ අයවැය ඇස්තමේන්තු මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | | | √ | ගිණුම් |
| | | | පෙබරවාරි 28 දින හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | √ | | | |
| | | | පෙබරවාරි 28 දින හෝ ඊට පෙර අත්තිකාරම් බී ගිණුම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | √ | | | |
| | | | 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීම | | √ | | |
| | | 16.7 සියළුම මට්ටම වලදී ප්‍රතිචාරාත්මක, සියළුදෙනා අන්තර්ගත වූ සහභාගිත්වයෙන් යුතු සහ නියෝජනයෙන් යුතු තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම | රාජ්‍ය ආයතනවල ස්ත්‍රී පුරුෂ වශයෙන් සමාන සත්කාරයේ විධායක තනතුරු බෙදී ගොස් ඇති ප්‍රමාණය | | | √ | |
| | | | රාජ්‍ය ආයතනවල ස්ත්‍රී පුරුෂ වශයෙන් සමාන ආකාරයේ විධායක නොවන තනතුරු බෙදී ගොස් ඇති ප්‍රමාණය | | | √ | ඒකාබද්ධ |
| | | 16.10 ජාතික නීති පද්ධතියට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ කාර්යක්ෂම හා විනිවිද භාවයකින් යුතු රාජ්‍ය සේවයක් පවත්වාගෙන යාම | තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ලද ඉල්ලීම් අතුරින් තොරතුරු සපයන ලද ඉල්ලීම් සංඛ්‍යාව | | √ | | අභ්‍යාන්තර පාලන |
| | | | ලැබෙන ලද මහජන පැමිණිලි අතුරින් විසඳීම සඳහා මූලික පියවර ගන්නා ලද ඉල්ලීම් සංඛ්‍යාව | | | √ | |

# 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණ

| සේවක මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 81 | 66 | 14 | - |
| තෘතීයික | 15 | 10 | 05 | - |
| ද්විතීයික | 643 | 432 | 208 | - |
| ප්‍රාථමික | 187 | 161 | 27 | 01 |
| **එකතුව** | **926** | **669** | **254** | **01** |

6.2 කාර්යය මණ්ඩල විස්තරය

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාල වන සේවය | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය | *2024.12.31 දිනට* අනුමත | අනුයුක්ත | පුරප්පාඩු | අතිරික්ත | වෙනත් | රාව.ප. 14/2022 පරිදි නිවාඩු ලබා ඇති නිලධාරීන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ***සම්පූර්ණ තනතුරු සංඛ්‍යාව*** | | | | ***926*** | ***669*** | ***254*** | ***1*** | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | - | - | SL 4 | 1 | 1 | - | - | | - |
| | අතිරේක ලේකම් | ශ්‍රී.සේ.ප.ලං. | විශේෂ | SL 3 | 5 | 5 | - | - | | - |
| | ආයතන අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.සේ.ප.ලං. | විශේෂ | SL 3 | 1 | 1 | - | - | | - |
| | ඒකාබද්ධ අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.සේ.ප.ලං. | විශේෂ | SL 3 | 1 | 0 | 1 | - | | - |
| | අධ්‍යක්ෂ ජනරාල් (මසම්පාදනක්‍) | ශ්‍රී.සේ.ක්‍ර.ලං. | විශේෂ | SL 3 | 1 | 0 | 1 | - | | - |
| | ප්‍රධාන මූල්‍ය නිලධාරි | ශ්‍රී.සේ.ග.ලං. | විශේෂ | SL 3 | 1 | 1 | - | - | | - |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.සේ.ප.ලං. | 1 | SL 1 | 6 | 4 | 2 | - | | - |
| | ප්‍රධාන ඉංජිනේරු | ශ්‍රී.සේ.ඉ.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | | - |
| | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.සේ.ග.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | | - |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.සේ.ග.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | ▪ | - |
| | අධ්‍යක්ෂ (පරිපාලන) | ශ්‍රී.සේ.ප.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | | - |
| | අධ්‍යක්ෂ ත්මක විද්‍යා) සේවා,වාස්තු විද්‍යාත්මක හා තාක්ෂණ සේවා( | ශ්‍රී.සේ.ප.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | | - |
| | අධ්‍යක්ෂ මසම්පාදන ක්‍) ( සේවා | ශ්‍රී.සේ.ප.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | | - |
| | අධ්‍යක්ෂ ගණකාධිකාරි ) ( සේවා | ශ්‍රී.සේ.ප.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | | - |
| | අධ්‍යක්ෂ ඉංජිනේරු ) (සේවා | ශ්‍රී.සේ.ඉ.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | | - |
| | අධ්‍යක්ෂ | ශ්‍රී.සේ.ප.ලං. | 1 | SL 1 | 6 | 6 | - | - | | - |
| | | ශ්‍රී.සේ.ක්‍ර.ලං. | 1 | SL 1 | 1 | 1 | - | - | ▪ | - |
| | අධ්‍යක්ෂ | ශ්‍රීසේ.තො.ලං. | 1පන්තිය | SL 1 | 1 | 1 | - | - | ▪ | - |
| | ගණකාධිකාරී | ශ්‍රී.සේ.ග.ලං. | 1 | SL 1 | 2 | 1 | 1 | - | | - |
| | සහකාර ලේකම් | ශ්‍රී.සේ.ප.ලං. | 111/11 | SL 1 | 7 | 6 | 1 | - | | 1 |
| | සහකාර අධ්‍යක්ෂ / ක්ෂ අධ්‍යනියෝජ්‍ය | ශ්‍රී.සේ.ප.ලං. | 11/111 | SL1 | 27 | 23 | 4 | - | ● | 2 |
| | | ශ්‍රී.සේ.ක්‍ර.ලං. | 111/11 | SL 1 | 1 | 0 | 0 | - | | - |
| | | ශ්‍රී තො.ලං.සේ. | 1/111/11 | SL 1 | 2 | 1 | 1 | - | | - |
| | ගණකාධිකාරී | ශ්‍රී.සේ.ග.ලං. | 111/11 | SL 1 | 2 | 2 | - | - | | - |
| | අභ්‍යන්තර විගණක | ශ්‍රී.සේ.ග.ලං. | 111/11 | SL 1 | 2 | 0 | 2 | - | | - |
| | ඉංජිනේරු | ශ්‍රී.සේ.ඉ.ලං. | 111/11 | SL 1 | 1 | 0 | 1 | - | | 1 |
| | සහකාර අධ්‍යක්ෂ )අධි සේවක( | ශ්‍රී ලංසේ.ක්‍ර. | 111 | SL 1 | 3 | 3 | - | - | | - |
| | නීති නිලධාරී | දෙපා. | 111/11 | SL 1 | 1 | 1 | - | - | | - |
| | සහකාර අධ්‍යක්ෂ(මාධ්‍ය) | දෙපා. | 111 | SL 1 | 1 | 1 | - | - | ▪ | - |
| | **එකතුව** | | | | **81** | **66** | **14** | **0** | | 4 |

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාල වන සේවය | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය | 2024.12.31 දිනට | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අනුමත | අනුයුක්ත | පුරප්පාඩු | අතිරික්ත | වෙනත් | රාව.ප. 14/2022 පරිදි නිවාඩු ලබා ඇති නිලධාරීන් |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | ක.සේ.නි.සේ. | අධි පන්තිය | MN 7 | 4 | 2 | 2 | - | | - |
| | භාෂා පරිවර්තක | භාෂා පරි.සේ . | 11/1 | MN 6 | 7 | 4 | 3 | - | | 3 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රීහා.තො.ලං. සන්.සේ.තා. | 2 - 11/1 | MN 6 | 4 | 4 | - | - | | 1 |
| | **එකතුව** | | | | 15 | 10 | 5 | 0 | | 4 |
| ද්විතීක මට්ටම | විමර්ශන නිලධාරී | ආශ්‍රිත සේවා | 111/11/1 | MN 4 | 10 | 7 | - | - | * | - |
| | සංවර්ධන නිලධාරී | සං. නිසේවය . | 111/11/1 | MN 4 | 218 | 169 | 49 | - | | 25 |
| | කාර්මික නිලධාරි | ශ්‍රී ලං.සේ.තා. | 111/11/1 | MN 3 | 3 | 0 | 3 | - | | - |
| | සැලසුම් ශිල්පී | ශ්‍රී ලං.සේ.තා. | 111/11/1 | MN 3 | 1 | 0 | 1 | - | | - |
| | කළමනාකරණ සේවා නිලධාරි | ක සේවය.නි.සේ. | 111/11/1 | MN 2 | 363 | 221 | 14 2 | - | | 26 |
| | කළමනාකරණ සහකාර )MN 2) | දෙපාර්තමේන් තුගත | 111/11/1 | MN 2 | 8 | 7 | 1 | - | | 1 |
| | කළමනාකරණ සහකාර )MN 1) | දෙපාර්තමේන් තුගත | 111/11/1 | MN 1 | 21 | 14 | 7 | - | | 3 |
| | කළමනාකරණ සහකාර )MN 2) | ජනාධිපති කාර්යාලයීය සෘජු පත්වීම්ලාභී | 111/11/1 | MN 1 | 3 | 3 | - | - | | - |
| | නිවාඩු නිකේතන පරිපාලක | දෙපාර්තමේන් තුගත | 111/11/1 | MN 1 | 5 | 4 | 1 | - | | - |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රීහා.තො.ලං. සන්.සේ.තා. | 3 පන්තිය - 111/11/1 | MT 1 | 5 | 4 | 1 | - | | 2 |
| | දත්ත සටහන් ක්‍රියාකරු | දෙපාර්තමේන් තුගත (25/2014) | 111/11/1 | MN 1 | 3 | 1 | 2 | - | | 1 |
| | දත්ත සටහන් ක්‍රියාකරු | දෙපාර්තමේන් තුගත | III/II/I | MN 1 | 1 | 1 | - | - | | - |
| | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | _ | රාව.ප. 03/2016 හි උපලේඛණ iv අනුව | 1 | 1 | - | - | | - |
| | වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | _ | රු 29,840 /= +7,800 /= | 1 | 0 | 1 | - | | - |
| | **එකතුව** | | | | **643** | **432** | **208** | **0** | | 58 |

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාල වන සේවය | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය | 2024.12.31 දිනට | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අනුමත | අනුයුක්ත | පුරප්පාඩු | අතිරික්ත | වෙනත් | රාව.ප. 14/2022 පරිදි නිවාඩු ලබා ඇති නිලධාරීන් |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 111/11/1 / විශේෂ | PL 3 | 40 | 35 | 6 | - | | |
| | | ජනාධිපති කා. සෘජු පත්වීම්ලාභී | | | 3 | 2 | | | | 2 |
| | ජල නල කාර්මික | දෙපා. | 111/11/1 / විශේෂ | PL 3 | 1 | 0 | 1 | - | | - |
| | | 25/2014 | | | 3 | 3 | - | - | | - |
| | විදුලි කාර්මික | දෙපා. | 111/11/1 / විශේෂ | PL 3 | 1 | 0 | 1 | - | | - |
| | | 25/2014 | | | 2 | 2 | - | - | | - |
| | නිශ්චල ඡයාරූප ශිල්පී | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 3 | 1 | 1 | - | - | | - |
| | ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් ශිල්පී | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 3 | 1 | 0 | 1 | - | | - |
| | පෙදරේරු | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 2 | 1 | 0 | 1 | - | | - |
| | වඩුකාර්මික | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 2 | 1 | 0 | 1 | - | | - |
| | | 25/2014 | 111/11/1 / විශේෂ | PL 2 | 1 | 1 | - | - | | - |
| | බංගලා භාරකරු / අරක්කැමි | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 2 | 6 | 0 | 6 | - | | - |
| | සහකාර බංගලා භාරකරු | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 1 | 8 | 8 | - | - | | - |
| | සහකාර බංගලා භාරකරු * | දෙපා. | 111/11/1 / විශේෂ | PL 1 | 2 | 2 | - | - | | - |
| | සහායක අරක්කැමි | දෙපා. | 111/11/1 / විශේෂ | PL 1 | 6 | 5 | 1 | - | | - |
| | කාර්යාල කාර්ය සහායක | කා. සේ.සේ. | 111/11/1 / විශේෂ | PL 1 | 83 | 73 | 9 | - | | 9 |
| | | ජනාධිපති කාර්යාලයීය සෘජු පත්වීම්ලාභී | | | 9 | 10 | | | | - |
| | පොම්පාගාර කම්කරු | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 1 | 3 | 3 | - | - | | - |
| | කම්කරු | දෙපාර්තමේන් තුගත | 111/11/1 / විශේෂ | PL 1 | 13 | 14 | (1) | 1 | | - |
| | | 25/2014 | | | 2 | 2 | - | - | | - |
| | **එකතුව** | | | | **187** | **161** | **27** | **1** | | 11 |
| | ▪ පූර්ණ කාලීනව /● නිත්‍ය තනතුරට අමතරව වැඩ බලන ලබන තනතුරු වේ. | | | | | | | | | |
| | * තනතුර දරන්නාට පෞද්ගලික වන සේ පවතින්නා වූ තනතුරු වෙිපුරප්පාඩු වන තනතුරු . .අහෝසි වේ | | | | | | | | | |

## 6.3. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මූල්‍ය ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන (150h) | 163 | ජනවාරි - ජූලි | 225,000.00 | _ | දේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| 2 | අනියම් දීමනා - ඉන්දියා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන - ( Digitalization and Human Resource Management) - | 1 | ජනවාරි 12 | _ | 124,464.38 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 30,501.12 | | |
| 3 | නායකත්වය, කණ්ඩායම්ගතව වැඩ කිරීමේ හැකියාව හා අන්තර් පුද්ගල සබඳතාව පිළිබඳ දැනුම | 30 | පෙබ. 13 | 11,600.00 | _ | දේශීය | |
| 4 | ගිණුම්කරණය හා මූල්‍ය කටයුතු පිළිබඳ මූලික දැනුම | 70 | මාර්තු 14 | 16,670.00 | _ | දේශීය | |
| 5 | පර්යේෂණ ක්‍රමවේද හා පර්යේෂණ යෝජනා සකස් කිරීම | 15 | පෙබ. 16 | 8,870.00 | _ | දේශීය | |
| 6 | කාර්යාල ක්‍රම හා තැපැල කළමනාකරණය | 101 | පෙබ. 20 | 23,870.00 | _ | දේශීය | |
| 7 | අනියම් දීමනා - ඉන්දියාව - ITEC පුහුණු වැඩසටහන | 3 | පෙබ. 22 | _ | 336,243.93 | විදේශීය | |
| 8 | රැකියාව හා ජීවිතය සමබර කර ගැනීම | 86 | පෙබ. 22 | 21,270.00 | _ | දේශීය | |
| 9 | ලිපි ලිවීම හා සටහන් ලිවීම පිළිබඳ දැනුම | 80 | පෙබ. 29 | 20,570.00 | _ | දේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| 10 | තොරතුරු තාක්ෂණය හා පරිගණක පිළිබඳ මූලික දැනුම - I | 57 | පෙබ. 29 | 14,270.00 | _ | දේශීය | |
| 11 | රාජ්‍ය ආයතන සඳහා තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය | 81 | මාර්තු 05 | 19,880.00 | _ | දේශීය | |
| 12 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - බදුල්ල | 45 | මාර්තු 13 | 218,000.00 | | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මුලු ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වාභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 13 | ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය | 59 | මාර්තු 19 | 15,170.00 | _ | දේශීය | |
| 14 | සේවාලාභී සත්කාරය, ආචාර ධර්ම හා යහපත් සන්නිවේදනය | 36 | මාර්තු 20 | 11,170.00 | _ | දේශීය | |
| 15 | තොග පාලන, ගබඩා පාලන, ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තුව හා භාණ්ඩ සමීක්ෂණයපිළිබඳ දැනුම | 46 | මාර්තු 21 | 11,970.00 | _ | දේශීය | |
| 16 | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම | 22 | මාර්තු 22 | 12,530.00 | _ | දේශීය | |
| 17 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - ගම්පහ | 104 | මාර්තු 25 | 215,000.00 | _ | දේශීය | |
| 18 | අනියම් දීමනා - චීන සම්මන්ත්‍රණය (Enhancing Performance of Young Officials in Developing Countries) - 01 | 1 | මාර්තු 26 | _ | 116,031.25 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 28,714.50 | | |
| 19 | විශ්‍රාම වැටුප් සම්බන්ධ ප්‍රායෝගික දැනුම | 67 | මාර්තු 26 | 15,710.00 | _ | දේශීය | |
| 20 | අනියම් දීමනා - චීන සම්මන්ත්‍රණය(Govt. effectiveness & Efficiency for Developing Countries) | 1 | අප්‍රේල් 04 | _ | 115,140.00 | විදේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 28,388.25 | | |
| 21 | ධනාත්මක චින්තනය හා ආකල්ප සංවර්ධනය | 39 | අප්‍රේල් 05 | 12,220.00 | _ | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මුලු ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 22 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - ත්‍රිකුණාමලය | 85 | අප්‍රේල් 10 | 526,000.00 | _ | දේශීය | |
| 23 | දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - බස්නාහිර පළාත | 400 | අප්‍රේල් 18 | 27,000.00 | _ | දේශීය | |
| 24 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන - දකුණු පළාත | 120 | අප්‍රේල් 26 | - | | දේශීය | |
| 25 | රාජ්‍ය ආයතන සඳහා තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය | 29 | මැයි 03 | 10,770.00 | _ | දේශීය | |
| 26 | ඵලදායිතාව පිළිබඳ පුහුණු වැඩසටහන - 1 | 36 | මැයි 04 | 11,280.00 | _ | දේශීය | |
| 27 | දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන වයඹ පළාත | 72 | මැයි 07 | 28,200.00 | _ | දේශීය | |
| 28 | අනියම් දීමනා - ඉන්දියාව - ITEC පුහුණු වැඩසටහන | 1 | මැයි 09 | _ | 99,460.00 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 28,026.96 | | |
| 29 | අනියම් දීමනා - ඉන්දියාව - ITEC පුහුණු වැඩසටහන | 1 | මැයි 09 | _ | 99,475.00 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 28,026.96 | | |
| 30 | නායකත්ව පුහුණු වැඩසටහන | 41 | මැයි 09 | 12,720.00 | _ | දේශීය | |
| 31 | තොරතුරු තාක්ෂණය හා පරිගණක පිළිබඳ මූලික දැනුම - II | 51 | මැයි 10 | 12,460.00 | _ | දේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| 32 | රජයේ ඉඩම් කළමනාකරණය | 12 | මැයි 14 | 6,900.00 | _ | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මූල්‍ය ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වාභාවය (දේශීය/විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 33 | වෙසක් බැති ගී සරණිය | 150 | මැයි 28 | 17,352.50 | _ | දේශීය | |
| 34 | සේවාරම්භක පුහුණුව- පුස්තකාලයාධිපති සේවය | 25 | මැයි 27 - 31 | 68,655.00 | _ | දේශීය | |
| 35 | දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන උතුරු මැද පළාත / ඌව පළාත | 83 | ජුනි 06 | 27,900.00 | _ | දේශීය | |
| 36 | විශ්‍රාම වැටුප් සකස් කිරීම - Online | 385 | ජුනි 18 | 3,000.00 | _ | දේශීය | |
| 37 | ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහය, හා රාජ්‍ය සේවා කොමිෂන් සභා සහ කාර්ය පටිපාටික රීති - Online | 490 | ජුනි 19 | 3,000.00 | _ | දේශීය | |
| 38 | තොරතුරු පද්ධති කළමනාකරණය - Online | 380 | ජුනි 20 | 1,800.00 | _ | දේශීය | |
| 39 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන (200h) | 2 | ජුනි 24 | 10,000.00 | _ | දේශීය | |
| 40 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - කුරුණෑගල | 133 | ජුනි 27 | 271,150.00 | _ | දේශීය | |
| 41 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - පුත්තලම | 30 | ජූලි 15 | 105,250.00 | _ | දේශීය | |
| 42 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - මොණරාගල | 31 | අගෝ. 07 | 185,760.00 | _ | දේශීය | |
| 43 | අනියම් දීමනා - ඉන්දියාව - ITEC පුහුණු වැඩසටහන | 1 | අගෝ. 19 | _ | 107,022.13 | විදේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 28,604.58 | | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මූලූ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වාභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 44 | කළමනාකරණ සේවා නිලධාරීන් (සීමිත) සඳහා සේවාරම්භක පුහුණුව පැවැත්වීම - ශ්‍රී ලංකා දුම්රිය දෙපා. - කොළඹ දිස්ත්‍රික්කය | 102 | අගෝ. 10 | 159,939.00 | _ | දේශීය | |
| 45 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති | 22 | අගෝ. 27 | 12,480.00 | _ | දේශීය | |
| 46 | මූලික විමර්ශන ක්‍රියාවලිය | 50 | අගෝ. 28 | 13,530.00 | _ | දේශීය | |
| 47 | පුරවැසි සේවාව පිළිබඳ අවබෝධය | 37 | අගෝ. 29 | 12,330.00 | _ | දේශීය | |
| 48 | පරිගණක තාක්ෂණය පිළිබඳ මූලික දැනුම | 35 | අගෝ. 30 | 9,630.00 | _ | දේශීය | |
| 49 | අනියම් දීමනා - චීන සම්මන්ත්‍රණය(Seminar on Developing countries sustainable development capacity & south - South coperation for sustainable development) | 1 | අගෝ. 30 | _ | 115,234.69 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 29,758.50 | | |
| 50 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන - බස්නාහිර පළාත | 111 | සැප්. 03 | 24,650.00 | | දේශීය | |
| 51 | අනියම් දීමනා - චීන සම්මන්ත්‍රණය( Seminar on Governance capability for China belt and road Countries) | 1 | සැප්. 17 | - | 115,708.13 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 29,759.29 | | |
| 52 | ඵලදායීතා පුහුණු වැඩසටහන - II | 38 | සැප්. 25 | 10,740.00 | | දේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| 53 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - ගාල්ල | 106 | සැප්. 26 | 355,950.00 | | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මූලු ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වාභාවය (දේශීය/විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 54 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා එහි ප්‍රයෝගික භාවිතය | 60 | සැප්. 27 | 19,260.00 | | දේශීය | |
| 55 | පරිගණක දෘඩාංග සහ දෝෂ සමනය | 32 | සැප්. 30 | 9,090.00 | | දේශීය | |
| 56 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - රත්නපුර | 50 | ඔක්. 02 | 271,100.00 | | දේශීය | |
| 57 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - අනුරාධපුර | 15 | ඔක්. 02 | 108,900.00 | | දේශීය | |
| 58 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - කොළඹ | 96 | ඔක්. 03 | 421,070.00 | | දේශීය | |
| 59 | කළමනාකරණ සේවා නිලධාරීන් (සීමිත) සඳහා සේවාරම්භක පුහුණුව - ඌව/සබරගමුව/උතුරු මැද/වයඹ/මධ්‍යම/නැගෙනහිර පළාත් සඳහා - මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ | 243 | ඔක්. 07 | 28,500.00 | | දේශීය | |
| 60 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන - වයඹ පළාත | 242 | ඔක්. 08 | 48,000.00 | | දේශීය | |
| 61 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - කිලිනොච්චි | 17 | ඔක්. 11 | 192,000.00 | | දේශීය | |
| 62 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - මාතලේ | 20 | ඔක්. 11 | 181,000.00 | | දේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| 63 | ඵලදායිතා පුහුණු වැඩසටහන - 03 | 24 | ඔක්. 23 | 9,520.00 | | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මූල්‍ය ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වාභාවය (දේශිය/විදේශිය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 64 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන (Physical) | 88 | ඔක්. 28 | 24,590.00 | | දේශීය | |
| 65 | නව විගණන පනත පිළිබඳ දැනුම | 30 | ඔක්. 29 | 9,860.00 | | දේශීය | |
| 66 | අනියම් දීමනා - චීන සම්මන්ත්‍රණය ( Seminar on China's Poverty Alleviation Experience for Sri Lanka) | 1 | ඔක්. 30 | - | 112,583.44 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 28,563.75 | | |
| 67 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - කෑගල්ල | 9 | නොවැ. 04 | 125,370.37 | | දේශීය | |
| 68 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - මඩකලපුව | 35 | නොවැ. 04 | 203,550.00 | | දේශීය | |
| 69 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා එහි ප්‍රයෝගික භාවිතය | 18 | නොවැ. 06 | 11,930.00 | | දේශීය | |
| 70 | කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - අම්පාර | 57 | නොවැ. 11 | 405,000.00 | | දේශීය | |
| 72 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ප්‍රගති වාර්තා සකස් කිරීම | 40 | නොවැ. 20 | 12,740.00 | | දේශීය | |
| 73 | රාජ්‍ය සේවකයෙකුගෙන් අපේක්ෂිත විනය හා හැසිරීම පිළිබඳ මූලික දැනුම | 27 | නොවැ. 21 | 8,160.00 | | දේශීය | |
| 74 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන - කොළඹ නගර සභාව | 103 | නොවැ. 21 | - | | දේශීය | |
| 75 | ඵලදායීතාවය - සැසිය 04 | 28 | නොවැ. 22 | 8,670.00 | | දේශීය | |
| 76 | ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව | 8 | නොවැ. 22 | 240,000.00 | | දේශීය | දැනුම, කුසලතා, |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මූල්‍ය ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වාභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 77 | දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 04 - සිංහල මාධ්‍යය | 169 | නොවැ. 26 | 27,300.00 | | දේශීය | ආකල්ප වර්ධනය වීම |
| 78 | සේවා ස්ථාන සංසද පිහිටුවීම පිළිබඳව රාජ්‍ය පරිපාලන අංශයේ නිලධාරීන් හා රාජ්‍ය පරිපාලන අංශයේ සේවා ස්ථාන සංසදයේ සමාජිකයන් දැනුවත් කිරීම | 45 | නොවැ. 26 | 9,230.00 | | දේශීය | |
| 79 | ව්‍යාපෘති කළමනාකරණය හා අධීක්ෂණය | 20 | නොවැ. 27 | 20,380.00 | | දේශීය | |
| 80 | විගණනය | 52 | නොවැ. 28 | 12,780.00 | | දේශීය | |
| 81 | අනියම් දීමනා - ඉන්දියාව - ITEC පුහුණු වැඩසටහන | 1 | නොවැ. 29 | - | 102,266.50 | විදේශීය | |
| | උණුසුම් ඇඳුම් දීමනාව | | | | 27,696.75 | | |
| 82 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන (Online- 100h) | 88 | දෙසැ. 04 | 75,000.00 | | දේශීය | |
| 83 | යතුරු රාජකාරී ඇතුළු කාර්යාලීය දෛනික කටයුතු පිළිබඳ දැනුම | 40 | දෙසැ. 05 | 10,170.00 | | දේශීය | |
| 85 | ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය - III පන්තිය III ශ්‍රේණිය (දින 05 - SLIDA) | 250 | දෙසැ. 09 | 255,000.00 | | දේශීය | |
| 86 | කළමනාකරණ සේවා නිලධාරීන් (සීමිත) සඳහා සේවාරම්භක පුහුණුව - දෙමළ මාධ්‍යය (දින 05) | 64 | දෙසැ. 09 | 25,500.00 | | දේශීය | |
| 87 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන - උතුරු මැද පළාත | 149 | දෙසැ. 09 | - | | දේශීය | |
| 88 | ඵලදායීතා පුහුණු වැඩසටහන - V | 24 | දෙසැ. 10 | 8,520.00 | | දේශීය | |
| 89 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන - සබරගමුව පළාත | 240 | දෙසැ. 11 | - | | දේශීය | |
| 90 | ඉදිරිපත් කිරීමේ කුසලතා (Presentation Skills) | 21 | දෙසැ. 12 | 12,680.00 | | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | මූල්‍ය ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 91 | දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 05 - දෙමළ මාධ්‍යය | 288 | දෙසැ. 16 | 27,600.00 | | දේශීය | |
| 92 | කළමනාකරණ සේවා නිලධාරීන් (සීමිත) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) | 320 | දෙසැ. 16 | 27,600.00 | | දේශීය | |
| 93 | ශ්‍රී.ලං.වි.සේ. නිලධාරී පර්යේෂණ පත්‍රිකා ලිවීම ප්‍රායෝගික වැඩසටහන | 58 | දෙසැ. 17 | 310,297.75 | | දේශීය | |
| 94 | විවෘත හා වගකිව යුතු රජයක් සඳහා රජයේ නිලධාරීන්ගේ වගකීම කඩිනමින් ක්‍රියාවට නැංවීම | 67 | දෙසැ. 18 | 17,340.00 | | දේශීය | |
| 95 | අනියම් දීමනා - ඉන්දියාව - ITEC පුහුණු වැඩසටහන | 2 | දෙසැ. 20 | - | 188,721.00 | විදේශීය | |
| 96 | වාර්ෂික කාර්යසාධන සැලැස්ම ක්‍රියාවට නැංවීම - ඒකාබද්ධ සේවා අංශය | 75 | දෙසැ. 20 | 282,128.00 | | දේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| 97 | ප්‍රසම්පාදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 1 | දෙසැ. 26 | 75,000.00 | | දේශීය | |
| 98 | වෘත්තීය ඉංග්‍රිසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - SLIDA | 3 | දෙසැ. 27 | 276,000.00 | | දේශීය | |
| 99 | රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - කොළඹ විශ්වවිද්‍යාලය | 2 | දෙසැ. 26 | 360,000.00 | | දේශීය | |
| **සහභාගී වූ නිලධාරී සංඛ්‍යාව** | | **7390** | **වැය වූ මුදල** | **6,973,052.62** | **1,920,391.11** | | |
| * | විදේශීය පුහුණු සඳහා ප්‍රතිපාදන මූල්‍ය අංශය විසින් වෙනත් වැය විෂයක් යටතේ දරනු ලැබේ. | | | | | | |

## 07. පරිච්ඡේදය - රාජ්‍ය පරිපාලන අමාත්‍යාශයේ අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1. | **පහත මූල්‍ය ප්‍රකාශන/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත** | | | |
| 1.1. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ | | |
| 1.2. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3. | ව්‍යාපාර සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4. | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5. | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6. | වෙනත් | අදාල නොවේ | | |
| 2. | **පොත් සහ ලේඛන නඩත්තුකිරීම (FR445)** | | | |
| 2.1. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2. | පුද්ගලික පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කිරීම පවත්වා ගැනීම | අනුකූල වේ | | |
| 2.3. | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4. | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5. | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6. | චෙක් පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ | | |
| 2.7. | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ | | |
| 2.8. | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ | | |
| 2.9. | හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ | | |
| 2.10. | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **03.** | **මූල්‍ය පාලනය ආශ්‍රිත ක්‍රියාකාරීත්වය පැවරීම (FR 135)** | | | |
| 3.1. | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2. | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3. | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබිම. | අනුකූල වේ | | |
| 3.4. | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රාජ්‍ය පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4. | **වාර්ෂික සැලසුම් සැකසීම** | | | |
| 4.1. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සකසා ඇත | අනුකූල වේ | | |
| 4.2. | වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම සකසා ඇත | අනුකූල වේ | | |
| 4.3. | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4. | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5. | **විගණන විමසුම්** | | | |
| 5.1. | විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබිම | අනුකූල වේ | | |
| 6. | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1. | මුදල් රෙගුලාසි 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම | අනුකූල වේ | | |
| 6.2. | සෑම අභ්‍යන්තර විගණන වාර්තාකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය | අනුකූල වේ | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | | | |
| 6.4. | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7. | **විගණන සහ කළමනාකරණ කමිටුව** | | | |
| 7.1. | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8. | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1. | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් සහ අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජරනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු/රෙ/ 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරාව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුරෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කායී අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මුරෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීම පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවලංගු කරමින් රා.ප.ච අංක 02/2018 (i) දරන 2023/11/30 දිනැති චක්‍රලේඛය නිකුත් කර ඇත. | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# ස්වදේශ
# කටයුතු
# අංශය

# පරිච්ඡේද


**1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........................................................ 1**

1.1. හැඳින්වීම ........................................................................................................................ 1
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ........................................................................................ 2
1.3. ප්‍රධාන කාර්යයන්................................................................................................................ 3
1.3.1. පාලන අංශය ................................................................................................................... 3
1.3.2. ස්වදේශ කටයුතු අංශය ...................................................................................................... 4
1.3.2.1 දිස්ත්‍රික් පාලන අංශය ...................................................................................................... 4
1.3.2.2 ප්‍රාදේශීය පාලන අංශය...................................................................................................... 4
1.3.2.3 ග්‍රාම නිලධාරී පාලන අංශය................................................................................................. 4
1.3.3. සංවර්ධන අංශය ............................................................................................................... 5
1.3.4. මූල්‍ය අංශය ..................................................................................................................... 6
1.3.5. විමර්ශන අංශය.................................................................................................................. 6
1.3.6. අභ්‍යන්තර විගණන අංශය .................................................................................................... 7
1.3.7. ඉංජිනේරු අංශය ............................................................................................................... 8
1.3.8. ක්‍රමසම්පාදන අංශය ........................................................................................................... 8
1.3.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය................................................................................. 8
1.4. සංවිධාන සටහන ................................................................................................................ 9
1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන ............................................................... 11
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ................................................................................ 11

**2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක ............................12**

2.1. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ ................................................................................ 12
2.1.1. ස්වදේශ කටයුතු අංශය ...................................................................................................... 12
2.1.1.1 ප්‍රාදේශීය පාලන අංශය.................................................................................................... 12
2.1.1.2 ග්‍රාම නිලධාරී පාලන අංශය............................................................................................... 12
2.1.2. විමර්ශන අංශය................................................................................................................ 12
2.1.3. ඉංජිනේරු අංශය ............................................................................................................. 12
2.1.4. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය............................................................................... 13
2.1.5. ක්‍රමසම්පාදන අංශය ......................................................................................................... 13
2.2. අභියෝග ......................................................................................................................... 14
2.2.1. සංවර්ධන අංශය ............................................................................................................. 14
2.2.2. ස්වදේශ කටයුතු අංශය ...................................................................................................... 14
2.2.2.1 දිස්ත්‍රික් පාලන අංශය .................................................................................................... 14
2.2.3. විමර්ශන අංශය................................................................................................................ 14
2.2.4. ඉංජිනේරු අංශය ............................................................................................................. 14
2.2.5. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය............................................................................... 15
2.2.6. ක්‍රමසම්පාදන අංශය ......................................................................................................... 15
2.3. ඉදිරි ඉලක්ක .................................................................................................................. 15
2.3.1. සංවර්ධන අංශය ............................................................................................................. 15
2.3.2. ස්වදේශ කටයුතු අංශය ...................................................................................................... 15
2.3.2.1 දිස්ත්‍රික් පාලන අංශය .................................................................................................... 15
2.3.2.2 ප්‍රාදේශීය පාලන අංශය.................................................................................................... 15
2.3.2.3 ග්‍රාම නිලධාරී පාලන අංශය............................................................................................... 16
2.3.3. විමර්ශන අංශය................................................................................................................ 16
2.3.4. ඉංජිනේරු අංශය ............................................................................................................. 16
2.3.5. ක්‍රමසම්පාදන අංශය ......................................................................................................... 16

**4. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක ....................................................................................17**

**5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ....................................21**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.................................................................... 21
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග........................................................31
5.2.1. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ.............................................................. 31
5.2.1.1. සංවර්ධන අංශය ...............................................................................................................31
5.2.1.2. විමර්ශන අංශය.................................................................................................................31
5.2.1.3. ඉංජිනේරු අංශය ...............................................................................................................31
5.2.1.4. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය..............................................................................31
5.2.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග ....................................................................32
5.2.2.1. සංවර්ධන අංශය ...............................................................................................................32
5.2.2.2. විමර්ශන අංශය.................................................................................................................32
5.2.2.3. විමර්ශන අංශය.................................................................................................................32
5.2.2.3. ඉංජිනේරු අංශය ...............................................................................................................32
5.2.2.4. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය..............................................................................32

**6. මානව සම්පත් පැතිකඩ ..........................................................................................................33**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය..............................................................................................33
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය..............33
6.3. මානව සම්පත් සංවර්ධනය ......................................................................................................39

**7. අනුකූලතා වාර්තාව ...............................................................................................................41**

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

ප්‍රධාන අභ්‍යන්තර අංශ නවයකින් සමන්විත මෙම අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 341 ක හා ග්‍රාම නිලධාරී වසම් 14,022 ක සමස්ත කාර්යභාරය මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ වඩා කාර්යක්ෂම හා ඵලදායී මහජන සේවා සැපයීම උදෙසා අවශ්‍ය මානව හා භෞතික සම්පත් මෙන්ම අනෙකුත් පහසුකම් සැපයීම ද සිදුකරනු ලබයි.

### පසුබිම

**සිවිල් පරිපාලනය, පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණ කටයුතු වල කේන්ද්‍රස්ථානය වශයෙන් ඊට අදාළ සේවා සහ ඒවායේ ප්‍රධාන අංශ වන දිස්ත්‍රික් පරිපාලනය, සිවිල් ලියාපදිංචි කටයුතු සහ සේවක සුභ සාධනය යන කටයුතු ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ඉටු කෙරේ. රජයේ ජාතික ප්‍රමුඛතාවයන් හා සමගාමීව සමාජ හා ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් සංවිධානමය කාර්ය සාධනය සුවිශිෂ්ටත්වය උදෙසා වන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය, විද්‍යුත් තාක්ෂණික ක්‍රම භාවිතය හරහා විශිෂ්ඨ සේවයක් සැපයීම මඟින් සෞභාග්‍යමත් දේශයක් විනයානුකූල සමාජයක් සහ සතුටුදායක පවුලක් තුළ වෙසෙන ඵලදායී පුරවැසියන් බිහි කිරීමට සහයෝගය සහ දායකත්වය සැලසීම ප්‍රමුඛ කාර්යයන් වේ.**

### උප අංශ

- ප්‍රධාන අභ්‍යන්තර අංශ
  - පාලන අංශය
  - සංවර්ධන අංශය
  - මූල්‍ය අංශය
  - විමර්ශන අංශය
  - ස්වදේශ කටයුතු අංශය
  - අභ්‍යන්තර විගණන අංශය
  - ඉංජිනේරු අංශය
  - ක්‍රමසම්පාදන අංශය
  - ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය
- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම



"ජාතියේ උන්නතිය උදෙසා වන සුවිශේෂී සේවාවක් සැපයීම"

### මෙහෙවර



"භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත, ස්වෛරී රටක් තහවුරු කිරීම උදෙසා උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම."

### අරමුණු



- රට තුළ වඩාත් සංවේදී සහ ජනතා හිතවාදී රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට කැපවීම සහ කටයුතු කිරීම.
- ආයතනවල මානව සහ භෞතික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම.
- උප ජාතික මට්ටමේ දී රේඛීය අමාත්‍යාංශවල ක්‍රියාදාමය සඳහා ශක්තිමත් දායකත්වයක් ලබාදීම. ( දිස්ත්‍රික්ක /ප්‍රාදේශීය /ග්‍රාමීය මට්ටම).
- ප්‍රාදේශීයව ඇති සමාජ ආර්ථික යටිතල පහසුකම්වල අසමානතා අවම කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

### 1.3.1. පාලන අංශය

1. මානව සම්පත් කළමනාකරණය
2. කාර්යාල කළමනාකරණය.
3. ඵලදායිතා කළමනාකරණ ප්‍රවේශයන් ඔස්සේ කාර්යාල ක්‍රමවේද ඉහළ නැංවීම.
4. කළමනාකරණ කටයුතුවලට අදාළ වන උපාංග නඩත්තු කිරීම හා පාලනය කිරීම.
5. පහසුවෙන් වැඩකළ හැකි වැඩ පරිසරයක් ඇති කිරීම උදෙසා ගුණාත්මක සහ ඵලදායි ලෙස නවීන තොරතුරු තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම.
6. කාර්යක්ෂම හා ඵලදායිතාවයෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක් ඇති කිරීම සඳහා නිලධාරින් වෙත පුහුණු අවස්ථා ලබාදීම.
7. මනා සම්බන්ධීකරණය තුලින්, අන්තර් ආයතන අතර මිත්‍රශීලී සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
8. අමාත්‍යාංශය පිළිබඳව සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සේවාවන් පිළිබඳ තොරතුරු වෙත මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
9. තොරතුරු පනත යටතේ මහජනතාව වෙතින් ලැබෙන ඉල්ලීම් සඳහා වඩාත් පහසු ලෙස තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් පවත්වාගෙන යාම.
10. අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලිවලට කඩිනමින් විසඳුම් ලබාදීම සඳහා ක්‍රමවේදයක් පවත්වාගෙන යාම.
11. අමාත්‍යාංශයට අයත් සංචාරක බංගලා සම්බන්ධ කටයුතු අධීක්ෂණය කිරීම, සේවාලාභීන්ට ගැටලුවකින් තොරව සංචාරක බංගලා වෙන්කර ගැනීමට හැකිවන පරිදි කටයුතු සම්පාදනය කිරීම.
12. අමාත්‍යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාකාරී ප්‍රවාහන සංචිතයක් පවත්වාගෙන යාම.
13. අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා සහ අමාත්‍යාංශය යටතේ පාලනය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී නීතිමය කාර්යයන් ඉටුකර දීමට හැකියාව ඇති නීති ඒකකයක් පවත්වාගෙන යාම.
14. අනිකුත් අංශ වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත් කිරීම, සංශෝධනය කිරීම සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කිරීම .
15. අමාත්‍ය මණ්ඩලය වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල තීරණ සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීමට අදාළ අංශ වෙත යොමු කිරීම.
16. පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සකස් කිරීම හා එම පිළිතුරු වාර්තා ත්‍රෛයි භාෂාවෙන් සකස් කර පාර්ලිමේන්තුව වෙත ලබා දීම.
17. මහජන පෙත්සම් කාරක සභා, උපදේශක කාරක සභා, ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම් සම්බන්ධ කටයුතු කිරීම.
18. අමාත්‍යාංශය යටතේ පාලනය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් ලැබෙන දේශීය හා විදේශීය නිවාඩු අනුමත කිරීමේ කටයුතු සිදු කිරීම.
19. අමාත්‍යාංශයේ තැපැල් ඒකකයට සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.
20. මැතිවරණ සම්බන්ධ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
21. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු සම්බන්ධයෙන්

අමාත්‍යාංශය මඟින් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

### 1.3.2. ස්වදේශ කටයුතු අංශ

#### 1.3.2.1. දිස්ත්‍රික් පාලන අංශය

1. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ සියළුම ආයතන කටයුතු
2. දිස්ත්‍රික් පරිපාලන කටයුතු වලට අදාළව උපදෙස් / චක්‍රලේඛ නිකුත් කිරීම.
3. දිස්ත්‍රික් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලැබෙන පොදු ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ දේශීය පුහුණු අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම.
5. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මාසික සමුළු පැවැත්වීම.
6. රාජ්‍ය උත්සව සංවිධාන කටයුතු සිදු කිරීම.
7. වන්දනා ගමන් ආඥා පනතට අදාළ කටයුතු
8. 1971 අංක 29 දරණ නිවාඩු පනත අනුව පොහොය දින, රජයේ සහ බැංකු නිවාඩු සම්බන්ධව කටයුතු
9. සමාජ තෑගි තරග වලට අදාල සියළුම කටයුතු සහ ඊට සම්බන්ධ සියළු ලිපි හා ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යාම.
10. උත්සව භාණ්ඩ නිකුත් කිරීම සම්බන්ධ කටයුතු
11. ග්‍රාම නාම වෙනස් කිරීම.
12. ජනරජ ප්‍රමුඛතා ලේඛනය යාවත්කාලීන කිරීම.
13. පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධ කටයුතු (අදාල විෂය ලිපිකරුගෙන් පිළිතුරු ලබා ගෙන අවසාන පිළිතුරු යැවීම සහ ඒ සම්බන්ධව පොදු ගොනුවක් පවත්වා ගැනීම)
14. පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර පොත් නිකුත් කිරීම සම්බන්ධ කටයුතු
15. ශාඛාවට ලැබෙන පොදු ලිපි සම්බන්ධයෙන් කටයුතු
16. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල පුරප්පාඩු , සමාලෝචන වාර්තා සම්බන්ධ කටයුතු

#### 1.3.2.2. ප්‍රාදේශීය පාලන අංශය

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මානව සම්පත් කළමනාකරණය සහ අධීක්ෂණය
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භෞතික සම්පත් කළමනාකරණය
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගැටලු කළමනාකරණය
4. ප්‍රාදේශීය පරිපාලනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය

#### 1.3.2.3. ග්‍රාම නිලධාරී පාලන අංශය

පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ හා ග්‍රාම නිලධාරීන්ගේ ආයතනික කටයුතු සිදු කිරීම හා ග්‍රාම නිලධාරීන් විසින් ලබා දෙන මහජන සේවාවන්ට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දායක වීම මෙම අංශයේ විෂය පථයට අයත් වේ.

1. ඒ අනුව, ග්‍රාම නිලධාරීන් හා පරිපාලන ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම, ස්ථිර කිරීම, උසස් කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, ස්ථාන මාරු, විනය පාලනය හා විශ්‍රාම ගැන්වීම යන කාර්යයන් මෙම අංශයේ විෂය පථයට අයත් කාර්යයන් වේ.
2. ග්‍රාම නිලධාරීන්ගේ සේවා පහසුකම් වැඩිදියුණු කරමින් ග්‍රාම නිලධාරීන් මඟින් ලබා දෙන මහජන සේවය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කරමින් සිටියි.

### 1.3.3. සංවර්ධන අංශය

1. ස්වදේශ කටයුතු අංශයට අදාළ ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සම්බන්ධ ප්‍රසම්පාදන කළමනාකරණය.
2. ඉදිකිරීම් හා සම්බන්ධ ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂයට අදාළව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ එම සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා අරමුදල් වෙන් කිරීම.
3. ඉදිකිරීම් වැය ශීර්ෂය යටතේ අරමුදල් වෙන් කෙරෙන ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අවශ්‍ය මග පෙන්වීම් සිදු කරමින් මෙම ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් සිදු කිරීම.
4. ඉදිකිරීම් නොවන අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම
5. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම් හා යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වෙන් කර ඇති අරමුදල් උපරිම හා කාර්යක්ෂම අන්දමින් උපයෝගි වන බව සහතික කිරීම සඳහා එම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
6. මුදලට සරිලන වටිනාකම, විනිවිදභාවය ඇතුළු ප්‍රසම්පාදන මූල ධර්ම අනුගමනය කිරීම සහ රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිවලට අනුගතව කටයුතු කිරීම සහතික කරමින් මුළු පිරිවැය
7. ඇස්තමේන්තුව රුපියල් මිලියන 400 ඉක්මවන ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කාලීන හා ගුණාත්මක ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම.
8. සංවර්ධන අංශය මෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඍජුව ක්‍රියාවට නංවනු ලබන හෝ මෙහෙයවනු ලබන ඉදිකිරීම් හා සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ ප්‍රගති වාර්තා ප්‍රසම්පාදන වාර්තා සහ වෙනත් තොරතුරු භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය හා අගමැති කාර්යාලය වැනි අදාළ නියෝජිතායතන වෙත ඉදිරිපත් කිරීම.
9. ප්‍රසම්පාදන කටයුතු හා අරමුදල් වෙන්කිරීම සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ඉදිකිරීම් අවශ්‍යතා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලබාගැනීම සහ ඒවා ඇගයුමට ලක් කිරීම.
10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමා නිර්ණය කිරීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
11. අලුත් ගමක් අලුත් රටක් ජාතික ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ කාර්ය සාධන ගිවිසුම සම්බන්ධව වාර්ෂික ප්‍රගතිය කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම.
12. අලුත් ගමක් අලුත් රටක් ජාතික ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් සම්බන්ධව කටයුතු කිරීම
13. ආහාර ප්‍රතිපත්ති කමිටුව සඳහා සහභාගි වීම.
14. ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ රාජකාරි කටයුතු සම්බන්ධව කටයුතු කිරීම
15. සියලුම ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු (දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල/ ග්‍රාම නිලධාරි කාර්යාල/ සේවා පියස)
16. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් සංචාරක බංගලාවන් ස්ථාපිතව ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු
17. නිල සෙවන ව්‍යාපෘතියේ ඉදිකිරීම් ක්‍රියාවට නැංවීම සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීම.

18. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පවත්වන සංවර්ධන කමිටුවල ප්‍රතිපත්තිමය කටයුතු
19. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකරන වැඩපිළිවෙල සකස් කිරීම.
20. "පිබිදෙමු පොලොන්නරුව" වැඩසටහනට අදාල ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හා එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
21. රජයේ නිවාස සම්බන්ධව කටයුතු කිරීම, පොදු සේවා නිවාස හා උපලේඛනගත නිවාස පැවරීම, කාලය දීර්ඝ කිරීම, අලුත්වැඩියා කිරීම ආදී කටයුතු.
22. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත්වන රජයේ නිවාසවල ආර්ථික කුලිය අය කිරීම සම්බන්ධ කටයුතු
23. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිල නිවාස සම්බන්ධ කටයුතු කිරීම.
24. ස්වදේශ කටයුතු අංශයේ අධීක්ෂණය යටතේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් දිවයින පුරා ක්‍රියාත්මක කෙරෙන සියලුම සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීම, ඇගයීම, වාර්තාකරණය සහ සම්බන්ධීකරණය.

### 1.3.4. මූල්‍ය අංශය

1. ශක්තිමත් මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම.
2. කාර්යක්ෂම හා වගවීමෙන් යුතු ගෙවීම් පද්ධතියක් පවත්වාගෙන යාම.
3. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය කළමනාකරණය
4. ප්‍රසම්පාදන කටයුතු විනිවිද භාවයකින් හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම.
5. වත්කම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාම.
6. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා පසු විපරම් කිරීම
7. මූල්‍ය අංශයේ සියළුම පරිපාලන කටයුතු, මානව සංවර්ධන කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම.

### 1.3.5. විමර්ශන අංශය

1. 2016 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා විමර්ශන අංශයට විවිධ ආකාරයට රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජනාධිපති කාර්යාල, අග්‍රාමාත්‍ය කාර්යාල ආදි කාර්යාලවලින් ලැබෙන පැමිණිලි සහ දෛනික පුවත්පත්, රූපවාහිනී, 1905 මහජන පැමිණිලි ඒකකය මෙන්ම අන්තර්ජාලය ඔස්සේ ලද පැමිණිලි පරීක්ෂා කර බලා එම පැමිණිලි වලට අදාල ගැටළු පැන නැගී ඇති අංශ 07ක් හඳුනාගෙන ඇති අතර එම ගැටළු ඇති වීමට හේතු සහ එකී අඩුපාඩු මග හැරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගන ඇත.
(අදාළ අංශ 07 - ඉඩම් ගැටලු, රාජ්‍ය නිලධාරීන්ගේ අකටයුතුකම්, රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම, මූල්‍ය වංචා, නීති විරෝධී ව්‍යාපාර, යටිතල පහසුකම් අක්‍රමිකතා, මානව හිමිකම් කඩවීම්)
2. මෙම අඩුපාඩු මගහරවා ගැනීමේ එක් පියවරක් ලෙස අප අංශය මගින්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් (දිස්ත්‍රික් ලේකම්, අතිරේක දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශිය ලේකම්වරුන්, එම කාර්යාලවල පරිපාලන ග්‍රාම නිලධාරීන්, පරිපාලන නිලධාරීන්, හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරුන්, සහකාර අධ්‍යක්ෂ සැලසුම් දැනුවත් කිරීම සඳහා ROAD MAP FOR THE BETTER SERVICE වැඩසටහන් මාලාව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

ආයතනයේ දායකත්වය යටතේ තමන් අතින් සිදුවිය හැකි වැරදි අවම කර කාර්යක්ෂම සේවාව සපයා ගැනීම සඳහා රාජ්‍ය නිලධාරීන් 1850 දෙනෙකු පමණ මේ වන විට දැනුවත් කර ඇත.

3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී කාර්යාලවල හදිසි කාර්යාල පරීක්ෂණ පැවැත්වීම.
4. ඒඅනුව කොළඹ දිස්ත්‍රික්කය (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, කැස්බෑව, සීතාවක, කඩුවෙල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල) වව්නියා දිස්ත්‍රික්කය (වව්නියා නගරය, වව්නියා උතුර,වව්නියා දකුණ, වෙන්කලචෙට්ටිකුලම් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල) හා පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්යාල පරීක්ෂණ පවත්වා ඇත.
5. අමාත්‍යාංශයේ විෂය පථයට අයත් සියලුම ආයතනවල මූලික විමර්ශන කටයුතු සිදු කිරීම හා මූලික විමර්ශනයෙන් අනාවරණය වන කරුණු අනුව චෝදනාපත්‍ර කෙටුම්පත් අදාළ විනය බලධාරීන් වෙත යොමු කිරීම.
6. විධිමත් විනය පරීක්ෂණවලදී සාක්ෂි ලබා දීම.
7. විධිමත් විනය පරීක්ෂණවලදී පැමිණිල්ල මෙහෙයවීම.
8. මූලික විමර්ශන සිදු නොකරන පැමිණිලි සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/අදාළ පාර්ශව වෙතින් වාර්තා කැඳවා එමඟින් විසඳුම් ලබාදීමට කටයුතු කිරීම. (කාරණා ගොනු නඩත්තු කිරීම).
9. එක් එක් ආයතනවල ඇති නව නිර්මාණ ඉහළ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කිරීම තුළින් ඇගයීම් ලබාදීම.
10. පැමිණිලි පාර්ශවය හා පැමිණිල්ලේ සඳහන් කාරණාවලට අදාල රාජ්‍ය නිලධාරීන් විමර්ශන අංශය වෙත කැඳවා කඩිනමින් එම ගැටළු විසඳීමට කටයුතු කිරීම.
11. වෙනත් අමාත්‍යාංශවල ඉල්ලීම මත එම අමාත්‍යාංශවල පැවැත්වෙන විමර්ශන හා පැමිණිල්ල මෙහෙයවීමේ කටයුතු සඳහා විමර්ශන නිලධාරීන් යොමු කිරීම.

### 1.3.6. අභ්‍යන්තර විගණන අංශය

1. වාර්ෂික විගණන සැලැස්ම පරිදි අභ්‍යන්තර විගණන සිදු කර අනාවරණය කරගත් අඩුපාඩු හා නිර්දේශ සාකච්ඡා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019 ඡේද අංක 5.3 හි උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීම.
2. කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019 ඡේද අංක 5.3 හි උපදෙස් පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 තුල හා රෙජිස්ට්‍රාර් ජනාරල් දෙපාර්තමේන්තුවේ කාර්තුගතව පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 104 කට අමාත්‍යාංශ නියෝජිත ලෙස සහභාගී වීම.
3. රෙජිස්ට්‍රාර් ජනාරල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා අමාත්‍යාංශයේ එක් එක් අංශ වලට අදාල වන ලෙස මූල්‍ය විගණනය, කාර්යසාධන විගණනය, මුදලට අගය විගණනය, පද්ධති විගණනය ලෙස අභ්‍යන්තර විගණනයන් සිදු කිරීම මඟින් විගණන විමසුම් නිකුත් කිරීම.
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ විගණන වාර්තා පසුවිපරම් සිදු කිරීම තුලින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය තහවුරු කිරීම.
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්තු වාර්තා පදනම්ව කාර්තුගතව අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාව සකස්කර මහා අභ්‍යන්තර විගණකගේ වාර්තාව සකස්කර මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම.

### 1.3.7. ඉංජිනේරු අංශය

1. ඉංජිනේරු හා නඩත්තු අංශයේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය හා පාලනය
2. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය හා උපදේශනය ලබාදීමට උපදේශන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම.
3. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 200 ඉක්මවන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල සැලසුම් ඇස්තමේන්තු හා විචල්‍යතා වාර්තා නිර්දේශ කිරීම.
4. ප්‍රාදේශීය මට්ටමේ ඉදි කිරීම් අලුත්වැඩියාවන් සිදු කිරීම අධීක්ෂණය
5. ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම.
6. කවර හෝ ප්‍රතිපාදන ප්‍රභවයක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලට අදාල තාක්ෂණ සහාය ලබාදීම.
7. දිස්ත්‍රික් ඉංජිනේරු, තාක්ෂණික නිලධාරී, සහ තාක්ෂණ සහායක නිලධාරීන්ගේ වෘත්තීමය කාර්යභාරය අධීක්ෂණය.
8. අමාත්‍යාංශ/ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ උසස්වීම් හා වරලත් සුදුසුකම් තත්ව ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම සහ තාක්ෂණික කාර්යය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම.
9. ඉදිකිරීම් බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාට අවශ්‍ය ඉංජිනේරුමය උපදෙස් ලබා දීම.
10. අවස්ථානුකූලව විමධ්‍යගත අයවැය සම්බන්ධ ව්‍යාපෘති, වෙනත් අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ තාක්ෂණික සහ ඉංජිනේරුමය උපදේශන කටයුතු සිදු කිරීම.
11. ස්වදේශ කටයුතු අංශයට අයත් සියලුම සංචාරක බංගලාවල ඉදිකිරීම් ව්‍යාපෘති හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල තාක්ෂණික උපදේශනය ලබා දීම.
12. “නිල මැදුර” පරිපාලන සංකීර්ණයේ නඩත්තු කටයුතු පරිපාලනය හා තාක්ෂණික උපදේශනය හා ක්‍රියාත්මක කිරීම.

### 1.3.8.ක්‍රමසම්පාදන අංශය

1. අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති පාලනය.
2. අමාත්‍යාංශයීය වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
3. වාර්ෂිකව අයවැය කියවීමට අදාල ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම .
4. ජාතික මට්ටමේ සම්පත් පැතිකඩ සකස් කිරීම.

### 1.3.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

1. ඉ-ග්‍රාම නිලධාරි’ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
2. මහජන හිතකාමී අයුරින් වැඩ පියවර සරල කිරීමේ කටයුතු හා පුරවැසි ප්‍රඥප්ති සමාලෝචනය.
3. දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටම්වල ධාරිතා සංවර්ධන හා ආකල්ප ප්‍රවර්ධන කටයුතු සඳහා සහාය ලබා දීම.

## 1.4. සංවිධාන සටහන



ගරු ඇමැතිතුමා
ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
අතිරේක ලේකම් (විමර්ශන)
අතිරේක ලේකම් (ප්‍රා.පා.ප්‍රති.)
අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක

## 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන

**ස්වදේශ කටයුතු අංශය**

- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) **ව්‍යාපෘතියේ නම** : යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.

ආ) **දායක නියෝජිතායතනය** : ඉන්දියානු රජය (රු. මිලියන 250)

ඇ) **ඇස්තමේන්තුගත වියදම**: රු. මි. 307

ඈ) **ව්‍යාපෘති කාල සීමාව**: 2021- 2025

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

## 2.1. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ

### 2.1.1. ස්වදේශ කටයුතු අංශය

#### 2.1.1.1. ප්‍රාදේශීය පාලන අංශය

1. ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම.
2. සහකාර ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
3. ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
4. ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
5. පරිපාලන නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
6. භාෂා පරිවර්තක නිලධාරීන්ගේ පත්කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
7. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
8. රියදුරු,කාර්යාල කාර්යය සහයක,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
9. මාණ්ඩලික නිලධාරීන්ගේ දේශීය පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා ප්‍රතිපාදන අනුමත කිරීම.
10. විදේශ නිවාඩු ඉල්ලීම් නිර්දේශ කිරීම හා විදේශ පුහුණු නිර්දේශ කිරීම.
11. විශ්‍රාම ගැන්වීම් නිර්දේශ කිරීම හා විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වාහන බලපත්‍ර නිකුත් කිරීම.
12. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය පරිදි කාර්යය මණ්ඩල අනුමැතිය ලබාදීම.
13. අමාත්‍යාංශයට යොමුවන මහජන ගැටලු සම්බන්ධයෙන් අදාළ වාර්තා කැඳවීම හා විසඳුම් ලබාදීමට කටයුතු කිරීම.
14. ප්‍රාදේශීය පරිපාලනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය කිරීම.

#### 2.1.1.2. ග්‍රාම නිලධාරී පාලන අංශය

1. ග්‍රාම නිලධාරීන්ට අනන්‍ය වූ වැටුප් ව්‍යුහයක් සහිතව ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම.
- ** පූර්ණ කාලීනව රාජකාරී ආවරණය සිදු කරයි.
- *** දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇත.

## 6.3 .මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයොජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| බී.ඒ.ඩී.ඩී.සිරිවර්ධන මිය(ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 60,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| එම්.එස් දීප්තිකා මිය (ස්වදේශ කටයුතු) ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 1 | | 92,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| එන්.පොන්රානි මෙය (ස්වදේශ කටයුතු) සිංහල ඩිප්ලෝමාව | 1 | | 92,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| එන්.පොන්රානි මෙය (ස්වදේශ කටයුතු) පශ්චාත් උපාධි පාඨමාලාව | 1 | | 145,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| එච්.ඒ.ජී.නිසංසලා මෙය (ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 75,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| පී.ඩබ්.එන්.ඩී. පෙරේරා මිය (ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 75,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| ඩබ්ලිව්.ඒ.ඒ.ඒ.එම්. වීරසූරිය මෙය (ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 75,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| පී.ඩබ්.එන්.ඩී. පෙරේරා මිය (ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 75,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| පී.බී. ජයවර්ධන මෙය(ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 75,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |
| කේ.සී.කරුණාරත්න මෙය (ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 75,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු | පාඨමාලාව අවසන්ව නොමැත |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයොජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| | | | | | කෙරේ | |
| ඒ.ඩබ්.ඒ.සී.එන්.කේ.අ බේගුණසේකර මිය (ස්වදේශ කටයුතු) ප්‍රසම්පාදනඩිප්ලෝමාව | 1 | | 75,000.00 | | සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ | පාඨමාලාව අවසන්ව නොමැත |

# 07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශගිණුම් නියමිත දිනට ඉදිරිපත් / කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් වාණිජ ) (අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ස්ථාවර වත්කම් 2018/267 ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන පුද්ගල /පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | | අදාළ කරුණු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරිමට නියමිතයි. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරත් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව , වාහන වල ඉන්දන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව , සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | . | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලවරුස් කළ ආදායමෙන් ආපසු , ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්තැන්පතු ගිණුමට බැර නොකොට , වම ආදායමට බැර කර තිබීමසෘජු | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරිමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන සහ 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# පළාත් සභා
# හා
# පළාත් පාලන
# අංශය

## පරිච්ඡේද


**1. ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........................................................................ 1**

1.1. හැඳින්වීම ........................................................................................................................... 1
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ................................................................................ 2
1.3. පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යයන් ............................................................................... 2
1.4. සංවිධාන සටහන .................................................................................................................. 74
1.5. පළාත් සභා හා පළාත් පාලන අංශය යටතේ පවතින අංශ ..................................................... 2
1.6. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ආයතන/ රටවල් ................................................................................................................................ 3
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල මූලික තොරතුරු ............................................................... 3

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක ........................................ 4**

2.1. විශේෂ ජයග්‍රහණ .................................................................................................................. 4
2.2. මහජන දුක් ගැනවිලි කළමනාකරණය .................................................................................. 4
2.3. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ...................................................................................... 4
2.4. අභියෝග ................................................................................................................................ 5
2.5. ඉදිරි ඉලක්ක .......................................................................................................................... 6
2.6. දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල කාර්යසාධනය ..........................10
2.7. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය..................39
2.8. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDP..........................................................................50
2.9. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)..........................................................54

**3. වසරේ සමස්ථ මූල්‍ය කාර්සාධනය ..................................................................................60**

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය ........................................ 60
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය ............................................................ 60

**4. කාර්යසාධන දර්ශක ....................................................................................................61**

**5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය.............................................62**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ............................................................ 62
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ......................................... 63

**6. මානව සම්පත් පැතිකඩ .............................................................................................64**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය ........................................................................................... 64
6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ............................... 64
6.3. මානව සම්පත් සංවර්ධනය................................................................................................... 64

**7. අනුකූලතා වාර්තාව .....................................................................................................68**

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

මෙම වාර්තාව මඟින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, පළාත් සභා සහ පළාත් පාලන අංශයේ විෂයයන් හා කාර්යයන්වල 2024 වර්ෂයට අදාළ භෞතික හා මූල්‍ය කාර්යසාධනය සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි. මුදල් අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද උපදෙස් හා ආකෘතිය අනුව මෙම වාර්තාවේ ආකෘතිය හා පෙළගැස්ම සකස් කර ඇත.

2024 අයවැය මඟින් පළාත් සභා සහ පළාත් පාලන අංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා වෙන්වූ සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රු. 32,664,000,000.00 කි. එම ප්‍රතිපාදන වලින් රු. 18,245,982,000.03 ක් එනම්, 56% ක් 2024.12.31 දිනට ඵලදායීව වියදම් කිරීමට මෙම අංශයට හැකිවී තිබේ.

පළාත් සභා සහ පළාත් පාලන අංශයට වෙන්වූ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීමට, මෙම අංශයට හැකිවීම සුවිශේෂී කරුණකි. ඒ අනුව දිවයිනේ බොහෝ පළාත් පාලන ආයතන ආවරණය කරමින් දේශීය සහ විදේශීය අරමුදල් යටතේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමටත් ඉකුත් වර්ෂවල ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතිවල නොපියවූ බිල්පත් නිරවුල් කිරීමටත් හැකිවිය. තවද, පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ නීති අණපනත් සහ ජාතික ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම හා නියමිත සංශෝධන කටයුතු ඉටු කිරීම හා ඒ පිළිබඳ අවධානය යොමු කිරීම පළාත් සභා සහ පළාත් පාලන අංශය විසින් ඉටුකරන ලද තවත් මෙහෙවරකි. ඒ යටතේ මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත් තුළ පවත්නා යල්පැනගිය නීතීන් ජාතික ප්‍රතිපත්ති රාමුව හා සැසඳෙන පරිදි යාවත්කාලීන කිරීම, පළාත් පාලන ආයතනවල කාර්යයන් පහසු හා සුමට කිරීම සඳහා නව විද්‍යුත් මෙවලම් හඳුන්වා දීම විශේෂ වේ.

මෙම වාර්තාවේ ඉදිරි පරිච්ඡේද තුළින් 2024 වර්ෂයට අදාළ පළාත් සභා සහ පළාත් පාලන අංශයේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම, සමස්ත මූල්‍ය කාර්යසාධනය, කාර්යසාධන දර්ශක, තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය, මානව සම්පත් පැතිකඩ, විගණන මතය හා තවත් කරුණු පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි.

**"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්"** රජයේ දැක්මට අනුව පළාත් සභා සහ පළාත් පාලන අංශයේ විෂයය පථයට අයත් කාර්යයන් හා පළාත් සභා සහ පළාත් පාලන අංශයට නියමිත වූ සුවිශේෂී ප්‍රමුඛතා කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ නිසි නායකත්වය හා මඟපෙන්වීම, අමාත්‍යාංශ ලේකම්තුමාගේ මනා කළමනාකාරිත්වය, අතිරේක ලේකම්වරුන් මෙන්ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ, පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ, ආයතන සහ විදේශ ආධාර ව්‍යාපෘතිවල අධ්‍යක්ෂවරුන්ගෙන් ලද මහඟු දායකත්වය විශේෂයෙන් මෙහිලා සඳහන් කළ යුතුය.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර

### 1.2.1. දැක්ම

පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් සඳහා බලගැන්වීම

### 1.2.2. මෙහෙවර

ජනතා හිතවාදී නීතිරීති හා ප්‍රතිපත්ති සම්පාදනය මඟින් හා නූතන තාක්ෂණයේ සහාය ඇතිව දේශීය සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කරමින් විනිවිදභාවයෙන් හා වග වීමෙන් කටයුතු කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට මඟපෙන්වීම සහ සහායවීම

## 1.3. පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යයන්

2024.11.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා සහ පළාත් පාලන අංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්.

I. පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම.

II. පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම.

III. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අඩු පහසුකම් සහිත ක්ෂේත්‍ර/ අංශ හඳුනාගෙන අදාළ පහසුකම් ලබා දීම සඳහා විශේෂ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

IV. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.

V. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්.

VI. පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබා දීම.

VII. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන් නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.

## 1.4. සංවිධාන සටහන

කරුණාකර ඇමුණුම් අංක 1 බලන්න.

## 1.5. පළාත් සභා හා පළාත් පාලන අංශය යටතේ පවතින අංශ

1. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය
2. ලේකම් කාර්යාලය
3. පාලන හා පුහුණු අංශය
   i. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය
4. පළාත් සභා අංශය
5. පළාත් පාලන අංශය
6. සංවර්ධන අංශය
7. ව්‍යාපෘති අධීක්ෂණ අංශය
8. ක්‍රමසම්පාදන අංශය
9. නීති අංශය
10. මූල්‍ය අංශය
11. වියදම් විමංසන අංශය
12. අභ්‍යන්තර විගණන අංශය
13. ජාතික සන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
15. දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## 1.6. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ආයතන/ රටවල්

1. ශ්‍රී ලංකා රජය (GOSL)
2. ලෝක බැංකුව (WB)
3. ආසියානු සංවර්ධන බැංකුව (ADB)
4. යුරෝපා සංගමය (EU)
5. යුරෝපීය ආයෝජන බැංකුව (EIB)
6. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA)
7. නෙදර්ලන්තය

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල මූලික තොරතුරු

2024 වර්ෂය තුළදී විදේශ ආධාර ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක වූ අතර ඒවායේ මූලික තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | ව්‍යාපෘති කාලය |
|---|---|---|---|---|
| 1 | මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP) | දේශීය අරමුදල් | 6,200.00 | 2024 පෙබරවාරි - 2025 දෙසැම්බර් |
| 2 | මහකොළඹ ජල හා අපද්‍රව්‍ය ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) අදියර 3 | දේශීය අරමුදල් | 5,425.00 | 2025 සිට ආරම්භ වේ. |
| | | යුරෝපීය ආයෝජන බැංකුව (EIB) | 6,978.00 | 2024 පෙබරවාරි - 2025 ජූනි |
| 3 | පළාත් පාලන ආයතන නඟාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක මූල්‍යයනය | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 13,500.00 | 2017 අප්‍රේල් - 2023 සැප්තැම්බර් |
| 4 | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අදියර 5 | නෙදර්ලන්ත රබෝ බැංකුව | 14,112.00 | 2021 ජූලි - 2025 ජූලි |
| 5 | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) | ලෝක බැංකුව (WB) | 27,994.95 | 2018 ජූනි - 2024 ජූනි |
| 6 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM) | ලෝක බැංකුව (WB) | 15,505.00 | 2018 අප්‍රේල් - 2025 ජූනි |
| 7 | නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA) | 20,622.00 | 2017 ජූලි - 2028 අගෝස්තු |
| 8 | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP- PRDP) | ලෝක බැංකුව (WB) | 16,159.00 | 2019 මැයි - 2023 සැප්තැම්බර් |
| 9 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) | ලෝක බැංකුව (WB) | 18,016.00 | 2019 ජූනි - 2024 නොවැම්බර් |
| | **එකතුව** | | **144,511.95** | |

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1. විශේෂ ජයග්‍රහණ

සැලසුම්ගත ඉලක්කය අනුව 2024 දෙසැම්බර් මස 31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතියෙහි ප්‍රතිශතය

2024 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන = රු. 32,664,000,000.00

2024 වර්ෂය සඳහා සත්‍ය වියදම = රු. 18,245,982,000.03

මූල්‍ය ජයග්‍රහණයෙහි ප්‍රතිශතයක් ලෙස = 56%

**2024 වර්ෂයේදී දේශීය ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| අංකය | ව්‍යාපෘතියේ නම | මූල්‍ය ඉලක්කය 2024 (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) | 384,125,199.00 | 194,533,208.89 | 98% |
| 2 | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) | 16,000,000.00 | 7,362,313.99 | 100% |
| 3 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිඟ බිල්පත් නිරවුල් කිරීම | 972,039,928.69 | 972,039,928.69 | 100% |
| 4 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (130-2-21-016-2504) | 150,000,000.00 | 24,233,854.98 | 16.1% |
| 5 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම - අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රාදේශීය සභාවල යටිතල පහසුකම් සංවර්ධනය (130-2-21-019-2202) | 136,835,117.83 | 15,022,099.43 | 10.9% |
| 6 | Waste to Value ව්‍යාපෘතිය (130-2-21-026-2504) | 275,000,000.00 | 210,800,000.00 | 76.6% |
| 7 | පළාත් පාලන ආයතන ඩිජිටල්කරණය කිරීම | 30,000,000.00 | 15,981,715.30 | 53.27% |
| 8 | පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - 2024 අයවැය යෝජනා | 1000,000,000.00 | 453,106,022.22 | 84.44% |
| 9 | ස්වර්ණපුරවර සම්මාන උළෙල - 2023 | 5,000,000.00 | 4,900,000.00 | 100% |
|  | **එකතුව** | **2,969,000,245.52** | **1,897,979,143.50** |  |

### 2.2. මහජන දුක් ගැනවිලි කළමනාකරණය

දිවයිනෙහි ඕනෑම පළාත් පාලන ආයතනයක් විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවකදී, මහජනතාවගෙන් ලැබී ඇති එබඳු පැමිණිලි යොමු කිරීම සඳහා පළාත් පාලන අංශයට අනුයුක්තව විමර්ශන ඒකකයක් ස්ථාපිත කර ඇත. 2024 වර්ෂයේදී ජනතාවගෙන් ලද පැමිණිලි 3,655 ක් අදාළ පළාත් වෙත යොමු කොට සුදුසු පරිදි විසඳුම් ලබා දෙන ලදී. තවද, 2024 වර්ෂය සඳහා මහජන පෙත්සම් කාරක සභාව වෙතින් පෙත්සම් 09ක් පළාත් සභා හා පළාත් පාලන අංශය වෙත යොමු කර ඇති අතර එම පෙත්සම් 09ට අදාල පිළිතුරු මහජන පෙත්සම් කාරක සභා කාර්යංශය වෙත යොමු කර ඇත. උපදේශක කාරක සභාව වෙතින් යෝජනා 08ක් ඉදිරිපත් වී ඇති අතර එම සියලු යෝජනා සඳහා ම පිළිතුරු උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇත.

### 2.3. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) පළාත් සභා සහ පළාත් පාලන නිලධාරීන් සඳහා දේශීය පුහුණු/ වැඩමුළු 30

ක් පවත්වා ඇති අතර එම පුහුණු/ වැඩමුළු සඳහා නිලධාරීන් 833 දෙනෙකු සහභාගී වී තිබේ. මීට අමතරව, පළාත් සභා හා පළාත් පාලන අංශයේ විවිධ මට්ටම් නියෝජනය කරන නිලධාරීන් සඳහා දේශීය පුහුණු/ වැඩමුළු 19 ක් පවත්වා ඇති අතර එම පුහුණු/ වැඩමුළු සඳහා නිලධාරීන් 114 දෙනෙකු සහභාගී වී ඇත. විදේශීය පුහුණු 7 ක් පවත්වා ඇති අතර එම පුහුණු සඳහා නිලධාරීන් 9 දෙනෙකු සහභාගී වී ඇත.

***2024 වර්ෂයේදී විදේශ ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය***

| අංකය | ව්‍යාපෘතියේ නම | වර්ෂය තුළ මූල්‍ය ඉලක්කය 2024 (රු.මිලියන) | වර්ෂය තුළ මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | ව්‍යාපෘතියේ සමුච්චිත භෞතික ප්‍රගතියය (%) |
|---|---|---|---|---|
| 1 | මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP) | 2,200.00 | 1,368.00 | 62% |
| 2 | මහකොළඹ ජල හා අපද්‍රව්‍ය ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) අදියර 3 | 2,000.00 | _ | _ |
| | | 3,500.00 | 18.20 | 18% |
| 3 | පළාත් පාලන ආයතන නඟාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක මූල්‍යයනය | 400.00 | 331.33 | 100% |
| 4 | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (අදියර 5) | 7,131.00 | 4,412.27 | 86% |
| 5 | ප්‍රථමික සෞඛ්‍ය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) | 3,600.00 | 3,297.10 | 99.9% |
| 6 | සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණ ව්‍යාපෘතිය (GEM) | 5,015.00 | 4,998.86 | Goods- 73%<br>Works- 85%<br>Services – 92% |
| 7 | නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ( (RIDEP) | 2,500.00 | 1,262.27 | 40% |
| 8 | ප්‍රවාහන සම්බන්ධක සහ වත්කම් ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP-PRDP) | 2,140.87 | 1,882.63 | 97% |
| 9 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) | 7,050.00 | 6,751.33 | 100% |
| | **එකතුව** | **35,536.87** | **24,321.99** | |

**2.4 අභියෝග**

I. විදේශ විනිමය අර්බුදය නිසා ඇතිවූ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ අමුද්‍රව්‍ය විශේෂයෙන් සිමෙන්ති, යකඩ වැනි ද්‍රව්‍යවල හිඟකම සහ මිල ගණන් අධික ලෙස ඉහළ යාම.

II. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ භාණ්ඩවල මිල නිරන්තරයෙන් වැඩිවීම නිසා නැවත ඇස්තමේන්තු සකස් කිරීමට සිදුවීම.

III. ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාම හා හිඟ වීම.

IV. රටේ පවතින ආර්ථික අර්බුදය නිසා ප්‍රමාණවත් ලෙස අයැවය ප්‍රතිපාදන නොලැබීම සහ රාජ්‍ය ආයතනවල වියදම් සීමා කිරීමේ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කිරීමට සිදුවීම.

**2.5 ඉදිරි ඉලක්ක**

1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) යටතේ අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායම් මට්ටම වර්ධනය කරගත හැකි වන පරිදි එම ආයතන බල ප්‍රදේශවල පානීය ජල සම්පාදනය, වෙළෙඳපොල පහසුකම් වැනි පොදු යටිතල පහසුකම් ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2. පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා ''Clean Sri Lanka'' වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

3. ATLAS මෙවලම යොදාගනිමින් දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රේණිගත කිරීම.

4. KOICA ආධාර යටතේ **වව්නියාව** සහ **බදුල්ල** දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකාබද්ධ කසළ කළමනාකරණ ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.

5. JICA ආධාර යටතේ පළාත් පාලන ආයතන මඟින් සිදු කරනු ලබන මළ අපජල කළමනාකරණයේ කටයුතු සඳහා උපදෙස් මාලාවක් සකස් කිරීම සහ මළ අපජල පිරිපහදු පද්ධති මඟින් ඉවත් කරන පාංශු මඟින් කෘෂිකාර්මික වැදගත්කමක් ඇති පොහොර නිෂ්පාදනය සඳහා වූ ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.

6. පළාත්වල නාගරික සහ අපද්‍රව්‍ය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ පිළියෙල කිරීම.

7. අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කිරීම.

8. පවතින කසල කඳු පුනරුත්ථාපනය කිරීම සහ නව කසල කඳු ඇතිවීම වළක්වා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන යොමු කිරීම.

9. මධ්‍යම රජය හා පළාත් සභා අතර විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැගීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා මධ්‍යම රජයේ ආයතන සම්බන්ධ කර ගනිමින් අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව කාර්තුවකට එක බැගින් පැවැත්වීම සහ සමුළුවේදී මතුවන ගැටළු සඳහා පළාත් නවයටම අදාල වන ඒකීය ක්‍රම හඳුන්වා දීම.

10. පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධ කටයුතු.

11. පළාත් පාලන ආයතන නගා සිටුවීම සඳහා සැකසූ කාර්ය සාධන මෙවලම (2.0) යටතේ සියලුම පළාත් පාලන ආයතන ඇගයීම් කර 2025 වර්ෂයේ ජාතික ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීම.

12. පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම හා ගිණුම්ගත කිරීමට තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුන්වා දීම.

13. රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාවේ නිර්දේශ අනුව (PERC) පළාත් පාලන ආයතන වසර 05ක් තුළ ස්වයං උත්පාදන ආදායමින් පමණක් ක්‍රියාත්මක විය හැකි පරිදි ශක්තිමත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය පසුබිම සකසා ක්‍රියාවට නැංවීම.

14. පළාත් පාලන ආයතනවල වරිපනම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා කාලීනව අය කර ගැනීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.

15. පළාත් පාලන ආයතන සඳහා පොදු මානව සම්පත් සංවර්ධන උපාය මාර්ග ක්‍රමයක් හඳුන්වා දීම.

16. පළාත් පාලන ආයතන, විදේශීය පළාත් පාලන ආයතන සමඟ සහෝදර නගර, මිතුරු නගර ගිවිසුම් මඟින් විදේශීය තාක්ෂණය, දැනුම සහ ව්‍යාපෘති පළාත් පාලන ආයතන වෙත හඳුන්වා දීම.

17. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පරිදි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කිරීම.

18. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පරිදි පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම.

19. පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් ආවරණය කරන උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු සෘජුවම පළාත් පාලන ආයතනයේ ගිණුමට යොමුවන පරිදි පළාත් සභා පනතේ ඉදිරි සංශෝධන කටයුතු අවසන් කිරීම.

20. ජලහීතිකාව තුරන්කිරීම අරමුණු කොටගෙන ජලහීතිකා ආඥා පනත සඳහා යෝජිත සංශෝධන.

21. දැනට විසිරුවා හැරී ඇති පළාත් පාලන ආයතනවල සංස්ථාපන නියම පළකිරීම සහ පළාත් පාලන ආයතනවල ධුර කාලය.

22. පළාත් පාලන ආයතනවල ආදායම් රැස්කිරීම විධිමත් සහ කඩිනම් කිරීමට අදාළ සංශෝධන.

23. මහජන සහභාගීත්වය සහිත පළාත් පාලනයක් සහතික කරලීමට අදාළව සිදුකළ යුතු අණපනත් සංශෝධන.

24. තේරීපත්වීමට නියමිත නව පළාත් පාලන ආයතන සභිකයින් දැනුවත්කිරීමේ වැඩසටහන්.

25. සංචාරකයින්ගේ දැඩි ආකර්ෂණයට ලක්ව ඇති ප්‍රදේශයක කණ්ඩලම සංචාරක බංගලාව පිහිටා ඇති හෙයින් එය වැඩිදියුණු කොට මෙම අංශයේ ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත්කිරීම.

26. තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම තුළින් (IT) සහකාර අධ්‍යක්ෂ තනතුරද, තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරද සම්පූර්ණ කර ඇති බැවින්) වඩා කාර්යක්ෂමව හා අතහුරු ක්‍රමයට එහා ගිය ඵලදායිතාවක් අත්කර ගැනීම.

27. Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතියේ මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කිරීම. බස්නාහිර පළාත, දකුණ පළාත, ඌව පළාත යන පළාත් වලද මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා එම පළාත් පාලන ආයතන වල නිලධාරින් පුහුණු කිරිම.

28. අප මෘදුකාංග ක්‍රියාත්මක වන සියළුම පළාත් පාලන ආයතන සඳහා Payment Gateway ලබා දීම.

29. අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම සඳහා මෘදුකාංග පද්ධති සකස් කිරීම.

30. විද්‍යුත් බැංකුකරණය ඔස්සේ ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින් අනවශ්‍ය ප්‍රමාදයන් වැලැක්වීම.

31. Slip ක්‍රමය මඟින් තෝරාගත් ගෙවීම් සිදු කිරීම

32. 2025 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යාමට අපේක්ෂිතය. ඒ අනුව 2025 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කිරීමට අපේක්ෂිතය. එලෙසම 2024 වර්ෂයේ දත්ත පදනම්ව 2024 වාර්ෂික පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කිරීමට අපේක්ෂිතය.

33. පළාත් පාලන ආයතනයන්හි ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම මෙම වර්ෂයේ දී 2024 වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් 2024 වර්ෂයේ පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට 2025 වර්ෂයේ දී සැළසුම් කර ඇත. එලෙසම 2025 වර්ෂයේ අර්ධ වාර්ෂික වාර්තාව සකස් කිරීමට සැලසුම් කර ඇත.

34. පළාත් සභාවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය පදනම් කර ගෙන, පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ (මූල්‍ය) සහ අදාළ පාර්ශව සහභාගිත්වයෙන් රැස්වීම් පැවැත්වීමට ද 2025 වර්ෂයේ දී සැලසුම් කර ඇත.

35. පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා විමංසනය කිරීම.

36. පළාත් පාලන ආයතනවල 2025 වර්ෂයේ අයවැය ලේඛන සහ 2024 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා දත්ත ඇතුළත් දත්ත පදනමක් පවත්වාගෙන යාම.

37. මෙම අමාත්‍යාංශය විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති නමුත් තවදුරටත් එම ආයතන මගින් පවරාගෙන නොමැති වාහන විධිමත් ලෙස පැවරීමට අවශ්‍ය කටයුතු කිරීම.

38. රාජ්‍ය ගිණුම් කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී ඒ සඳහා සහභාගීවීම.

39. අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන සිදු කිරීම.

40. 2025 වර්ෂයට අදාළ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

41. 2024 ට අදාළ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම.

42. ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම.

43. සෙමාවුල් ව්‍යාපෘතියට (Saemaul Project) අදාළ පස් අවුරුදු ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම සෙමාවුල් පදනම සමඟ ඒකාබද්ධව සකස් කිරීම.

44. ශ්‍රී ලංකාවේ සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධ කරගෙන දැනට නිර්මාණය කෙරෙමින් පවතින ජාතික මට්ටමේ දත්ත විශ්ලේෂණ හා දෘෂ්‍යකරණ පද්ධතිය ස්ථාපිතකොට පවත්වාගෙන යාම.

45. නව ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (Need Assessment) හා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.

46. බොරැල්ල, තිඹිරිගස්යාය, විස්ටවයික්, මාළිගාවත්ත යන පොම්පාගාර සම්පූර් ණයෙන්ම සාදා විස්ටවයික් නලය එළීම නිම කර, ඒවායේ ක්‍රියාකාරීත්වය සහ මෙහෙයුම් කටයුතු කොළඹ මහ නගර සභාවේ පාලනය යටතේ පවත්වාගෙන යාමට කටයුතු කිරීමත් සමඟ, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ වැඩ කටයුතු සාර්ථකව අවසන් කිරීම.

47. "කිරුළපන ප්‍රදේශය සඳහා නව ගුරුත්වජ මලාපවහන, පීඩන නල සහ පොම්පාගාර ඉදිකිරීම" කොන්තරාත්තුවේ ශේෂව පවතින ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.

48. "කොළඹ නගරයේ දකුණු දිග කොටසේ අපජල මලාපවාහන පද්ධතිය පුනරුත්ථාපනය කර, පුළුල් කිරීම" කොන්තරාත්තුව ප්‍රදානය කර ඉදිකිරීම් කටයුතු කර ගෙන යාමට සැලසුම් කර ඇත.

49. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ අදියර V යටතේ නිම කිරීමට අපේක්ෂිත පාලම් 162 අවසන් කිරීම.

50. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ (LLDF) ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ විනිවිද භාවයකින් පවත්වාගැනීම සඳහා විධිමත් ඒකාබද්ධ පරිගණක පද්ධතියක් සකස් කර හඳුන්වාදීම.

51. LLDF හි මූල්‍ය ශක්තිය වර්ධනය කරගැනීම සඳහා මූල්‍ය ශක්තිය වැඩිකිරීමට විදේශීය ආයතන සමග කටයුතු කිරීම.

52. LLDF හි ණය ලබාදෙන ක්ෂේත්‍රයන්හි ජාතික සංවර්ධන අවශ්‍යතාවයනට අනුව විවිධාංගීකරණය කිරීම.

53. වැඩි සේවයක් ලැබෙන පරිදි හා වර්තමානයට ගැලපෙන පරිදි LLDF අරමුදල පරිවර්තනය කිරීම සඳහා ආඥාපනත සංශෝධනය කිරීම.

54. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) පළාත් පාලනය, භෞතික සැලසුම් හා තාක්ෂණික, පොදු කළමනාකරණය හා නීති, තොරතුරු තාක්ෂණ හා මූල්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍රවල ධාරිතා සංවර්ධන වැඩසටහන් පළාත් පාලන හා පළාත් සභා නිලධාරීන් සඳහා පැවැත්වීම.

55. SLILG - පළාත් පලාන ආයතන යටතේ ක්‍රියාත්මක වන දින/ සති පොළවල් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය.

56. SLILG - පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන පෙර පාසල් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය.

| | |
|---|---|
| ***57.*** සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ, ***DLI 4- පාසල පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය (School Based Professional Teacher Development – SBPTD*** | කලාපවලින් අවම වශයෙන් 85% ක පාසල් SBPTD ප්‍රතිඵල ලබා ගැනීම |
| ***DLI 5 - නව වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් සංඛ්‍යාව වැඩි කිරීම*** | අමතර වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් 27,500ක් ඇති කිරීම (ඔවුන්ගෙන් අවම වශයෙන් 50%ක් කාන්තාවන් වීම) |
| ***DLI 6 - පාසල් තත්ත්ව සහතික ලබා දීම සඳහා ජාතික පද්ධතියක් ස්ථාපිත කිරීම*** | අවම වශයෙන් පාසල් 3,500ක පාසල් ප්‍රජාව පදනම් කරගත් තත්ත්ව සහතික ස්වයං සමාලෝචන සහ බාහිර සමාලෝචන සම්පූර්ණ කිරීම |
| ***DLI 7 - පාසල් වැඩිදියුණු කිරීම සඳහා, වැඩි දියුණු කරන ලද වැඩසටහන (Enhanced Program for School Improvement - EPSI)*** | කලාපවලින් අවම වශයෙන් 85% ක පාසල් EPSI ප්‍රතිඵල ලබා ගැනීම |

## 2.6. දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල කාර්යසාධනය

### 2.6.1. සංවර්ධන අංශය

**1. අරමුණ**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන්ට එම ආයතනවලින් ප්‍රතිලාභ සැලසෙන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දේශීය අරමුදල් යෙදවීම තුළින් මහජන සේවා සම්පාදනය කාර්යක්ෂම හා ඵලදායී කිරීම සහ ඒ මඟින් අන්තර් පළාත් විෂමතා අවම කිරීමට දායකත්වය ලබා දීම.

**2. ක්‍රියාත්මක කරන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්**

1.පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)

2.ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)

3.බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2009 සිට 2014 දක්වා වන හිඟ බිල්පත් නිරවුල් කිරීම.

- **ඉටු කරනු ලබන අනෙකුත් කාර්යයන්**

පළාත් පාලන ආයතන වල පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත කටයුතු සිදු කිරීම.

1.පළාත් පාලන ආයතනවලට අදාල වන පරිදි සංශෝධිත පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දීම.
2.පුරවැසි ප්‍රඥප්තිය ඇතුලත් මාර්ගෝපදේශ අත්පොත මුද්‍රණය කිරීමට කටයුතු සිදු කිරීම.

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්ය සාධනය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදනය (රු.) | 2024.12.31 දිනට වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) | 384,125,199.00 | 194,533,208.89 | 51% | 98% |
| 2 | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) | 16,000,000.00 | 7,362,313.99 | 46% | 100% |
| 3 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිඟ බිල්පත් නිරවුල් කිරීම | 972,039,928.69 | 972,039,928.69 | 100% | 100% |
| | **එකතුව** | **1,372,165,127.69** | **1,173,935,451.57** | **86%** | **99%** |

එක් එක් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් යටතේ 2024.12.31 දින වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)**

2024 වර්ෂය සඳහා වෙන් වූ රු. මි. 384.12 ක ප්‍රතිපාදනය පහත පරිදි යොදවා ගැනීමට කටයුතු කර ඇත.

- 2021 වර්ෂයේ අනුමත කර අර්ධ වශයෙන් නිම කර ඇති ව්‍යාපෘති අතරින් 40% ට වැඩි භෞතික ප්‍රගතියක් පෙන්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී.
- 2023 වර්ෂයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් ලබා දුන් උපදෙස් පරිදි ක්‍රියාත්මක කල ආදාහනාගාර හා පොදු වැසිකිළි වලට අදාල ව්‍යාපෘතිවල ඉතිරි වැඩ අවසන් කිරීමට ප්‍රතිපාදන වෙන් කරන ලදි.
- 2024 වර්ෂය සඳහා ඉදිරිපත් වී ඇති අත්‍යවශ්‍ය නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන වෙන් කරන ලදි.

මෙම වැඩසටහනට අදාළව 2023 වර්ෂයේ අවිච්ඡේද කල ව්‍යාපෘති 07 ක් සහ 2024 වර්ෂයේ නව ව්‍යාපෘති 85 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කළ අතර 2024 වර්ෂයේ ක්‍රියාත්මක කල මුළු ව්‍යාපෘති ගණන 92 ක් වේ. එයින් ව්‍යාපෘති 76 ක වැඩ 2024.12.31 දින වන විට අවසන් කිරීමට හැකි විය. තවත්

ව්‍යාපෘති 06 ක වැඩ අවසන් අදියරේ පවතී. වසර අග රටෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වය හා අධික වර්ෂාව හේතුවෙන් ඉතිරි ව්‍යාපෘති 10 ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.

| 2024 ප්‍රතිපාදන (රු.) | 2024.12.31 දිනට මුළු වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 384,125,199.00 | 194,533,208.89 | 51% | 98% |



නෙළුව ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සහ බාහිර කටයුතු
නෙළුව ප්‍රා.ස - දකුණු පළාත



කරමැටිය සතිපොළ සඳහා කඩ කාමර ඉදි කිරීම
මීගහකිවුල ප්‍රා.ස - ඌව පළාත

**2. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)**

2024 වර්ෂය සඳහා වෙන් වූ රු. මි. 16 ක ප්‍රතිපාදනය පහත පරිදි යොදවා ගැනීමට කටයුතු කර ඇත.

- 2023 වර්ෂයේ ක්‍රියාත්මක කල ව්‍යාපෘතිවල ඉතිරි වැඩ අවසන් කිරීමට ප්‍රතිපාදන වෙන් කරන ලදි.
- ප්‍රාදේශීය සභාවල දෛනික රාජකාරි කටයුතු කර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය

මෙම වැඩසටහනට අදාළව 2023 වර්ෂයේ අඛණ්ඩ කල ව්‍යාපෘති 02 ක් සහ 2024 වර්ෂයේ නව ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කළ අතර 2024 වර්ෂයේ ක්‍රියාත්මක කල මුළු ව්‍යාපෘති ගණන 19 ක් වේ. එයින් ව්‍යාපෘති 16 ක වැඩ 2024.12.31 දින වන විට අවසන් කිරීමට හැකි වූ අතර එක් ව්‍යාපෘතියක් අවලංගු කිරීමට සිදු විය. වසර අග රටෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වය හා අධික වර්ෂාව හේතුවෙන් ඉතිරි ව්‍යාපෘති 2 ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

| 2024 ප්‍රතිපාදන (රු.) | 2024.12.31 දිනට මුළු වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 16,000,000.00 | 7,362,313.99 | 46% | 100% |



රෝලර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම
ඇණගම්වෙහෙර පා.ස - දකුණු පළාත



කලවාන ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල සහ වාහන නැවතුම් අංගනය අළුත්වැඩියා කිරීම
කලවාන ප්‍රා.ස - සබරගමුව පළාත

**3. බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිඟ බිල්පත් නිරවුල් කිරීම**

බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ 2009-2014 කාලය තුල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවිය යුතුව පවතින හිඟ බිල්පත් ගෙවීම සිදු කර ඇත.

| **2024 ප්‍රතිපාදන (රු.)** | **2024.12.31 දිනට මුළු වියදම (රු.)** | **මූල්‍ය ප්‍රගතිය (%)** | **භෞතික ප්‍රගතිය (%)** |
|---|---|---|---|
| 972,039,928.69 | 972,039,928.69 | 100% | 100% |

4. **පළාත් පාලන ආයතනවල කාර්යය සාධනය ඉහල නැංවීම සඳහා වන කාර්ය පටිපාටි සහ පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම**

- අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය (CDLG), තෝරා ගත් පළාත් පාලන ආයතනවල විවිධ විෂයයන්ට අදාල නිලධාරින් හා පළාත් පාලන ක්ෂේත්‍රයට අදාල විද්වතුන් සම්බන්ධ කර ගනිමින් වැඩමුළු පවත්වා වඩාත් වැදගත් අංශ 30 ක් සඳහා කාර්ය පටිපාටි සකස් කරන ලදි.
- පුරවැසි ප්‍රඥප්තිය ඇතුලත් මාර්ගෝපදේශ අත්පොත් මුද්‍රණය කිරීම.

| පළාත් පාලන ආයතනය | භාෂාව | මුද්‍රණය කර ඇති පොත් ප්‍රමාණය |
|---|---|---|
| මහා නගර සභා/ නගර සභා/ ප්‍රාදේශිය සභා | සිංහල | 530 |
| | දෙමළ | 280 |

## 2.6.2 ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

**1. අරමුණ**

පළාත් පාලන ආයතනයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සහාය වන තාක්ෂණික හස්තය වශයෙන් ක්‍රියාත්මක වෙමින් සාර්ථක ක්‍රම පිළිබඳව තොරතුරු විසුරුවා හැරීමත්, විශේෂිත ස්ථාන සඳහා සුදුසු කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මග පෙන්වීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. ජාතික කසල කළමනාකරණ ප්‍රතිපත්තිය අනුව ඉදිරි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන යොමු කිරීම.
2. පළාත් පාලන ආයතන සඳහා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ වන සුදුසු ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.
3. වැඩ අවසන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිවල බිල්පත් නිරවුල් කිරීම සහ පසුවිපරම් කිරීම
4. අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපනය කර යාවත්කාලීන කිරීම
5. සියළුම පළාත් පාලන ආයතනවල 3R ක්‍රමවේදය ස්ථාපිත කිරීමට අවශ්‍ය උපදෙස් මගපෙන්වීම් ලබාදීම.
6. පළාත් පාලන ආයතනවල පවත්වාගෙන යන කොම්පෝස්ට් අංගනවල නිෂ්පාදන ධාරිතාවය සහ කොම්පෝස්ට් අලෙවිය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
7. පළාත් පාලන ආයතනවල ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ කළමනාකරණය විධිමත් කිරීම.
8. පළාත් මට්ටමේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්ම සකස්කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම සහ තෝරාගත් පළාත් දෙකක අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලසුම් සකස් කිරීම.
9. පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සාර්ථක කරගැනීම සඳහා දේශීය, විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
10. අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ සෙසු පාර්ශවකාර ආයතන විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සාකච්ඡා සඳහා සක්‍රිය දායකත්වය දැක්වීම.
11. පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා පුහුණු අවස්ථා ලබාදීම.
12. වෙරළ ආශ්‍රිතව ජනනය වන කසළ බැහැර කිරීම පිණිස ක්‍රමවේද හඳුනා ගැනීම

13. පවතින කසළ කඳු පුනරුත්ථාපනය කිරීම සහ නව කසළ කඳු ඇතිවීම වළක්වා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන යොමු කිරීම.

14. USAID ආධාර යටතේ දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

2024 වර්ෂය සඳහා ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය වෙත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වෙනුවෙන් පහත වැය විෂයන් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

| අ.අ. | ව්‍යාපෘතියේ නම | 2024 ප්‍රතිපාදන (රු.) | 2024.12.31 දිනට වියදම (රු.) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (130-2-21-016-2504) | 150,000,000.00 | 24,233,854.98 | 88% | 16.1% |
| 2 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම - අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රාදේශීය සභාවල යටිතල පහසුකම් සංවර්ධනය (130-2-21-019-2202) | 136,835,117.83 | 15,022,099.43 | 64.4% සටහන I | 10.9% |
| 3 | Waste to Value ව්‍යාපෘතිය (130-2-21-026-2504) | 275,000,000.00 | 210,800,000.00 | 100% | 76.6% |
| | **එකතුව** | **561,835,117.83** | **250,055,954.41** | **84.1%** | **34.5%** |

**සටහන I :** 130-2-21-019-2202 යටතේ ප්‍රතිපාදන වෙන්වූයේ 2021 වර්ෂයේ අයවැය යෝජනා මඟින් ක්‍රියාත්මක වූ වැඩ අවසන් නොකළ ව්‍යාපෘතිවල භාවිතයට ගැනීමට හැකිවන පරිදි අත්‍යවශ්‍ය ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම සඳහාය. එසේම එම වැඩ අවසන් නොවූ ව්‍යාපෘති තෝරා ගැනීම මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව සිදු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. වැඩ අවසන් කිරීම සඳහා තෝරාගත් ව්‍යාපෘතිවලට අදාළ පෙර ගිවිසුම් අහෝසිකර නොතිබීම හේතුවෙන් මහා භාණ්ඩාගාරයේ අවශ්‍ය එකඟතාවය ලබාගැනීම ප්‍රමාද විය. ඉන්පසු ඉතිරි ප්‍රතිපාදන සඳහා අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානවල සිදුකළයුතු අත්‍යවශ්‍ය නවීකරණ සහ අලුත්වැඩියාවන් සඳහා තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති විය.

ඉහත වැඩසටහන් අතරින් වැය විෂය 130-2-21-016-2504 යටතේ ප්‍රතිපාදන සලසා ඇති ව්‍යාපෘති අතරින් පහත සඳහන් ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ඇත.



ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය පළාත් පාලන ආයතන වෙත භාර දීම - කැස්බෑව



ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ප්ලාස්ටික් හා පෙට් බෝතල් එක් රැස් කිරීම සඳහා විශේෂ දැල් උපකරණ ලබා දීම



පන්නල ප්‍රාදේශීය සභාවේ ගලි අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම

1. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම.
2. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ වැසිකිළිය ඉදි කිරීම.
3. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් නිෂ්පාදන ගොඩනැගිල්ල ඉදි කිරීම.
4. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ කාර්යාල විවේකාගාරය ඉදි කිරීම.
5. පන්නල ප්‍රාදේශීය සභාවේ මළ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතිය ඉදි කිරීම.
6. කොලොන්න ප්‍රාදේශීය සභාවේ නොදිරන ගබඩා මධ්‍යස්ථානයක් ඉදි කිරීම.

මීට අමතරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහයක මධ්‍යස්ථානය විසින් පහත වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

1. KOICA ආධාර යටතේ බදුල්ල, වවුනියාව යන දිස්ත්‍රික්ක සඳහා ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ද්වීපාර්ශ්වික ගිවිසුම අත්සන් කිරීම.
2. JICA ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මළ අපජල පිරිපහදු පද්ධති මඟින් ඉවත් කරන පාංශු කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියෙහි ගිවිසුම අත්සන් කිරීම.
3. පළාත් මට්ටමෙන් සිදු කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා එක් එක් පළාතේ පැවැත්වීමට සූදානම් කර ඇති වැඩසටහන් නැගෙනහිර, දකුණු, වයඹ, සබරගමුව, ඌව පළාත්වල පවත්වා අවසන් කිරීම.
4. පළාත් පාලන ආයතනවලින් නිපදවනු ලබන කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා එක් එක් පළාත්වල කොම්පෝස්ට් අංගන සහිත පළාත් පාලන ආයතනවල සේවක මහත්ම මහත්මීන් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කරන ලද අතර මේ වන විට උතුරුමැද, සබරගමුව, මධ්‍යම, වයඹ, ඌව, බස්නාහිර පළාත්වල වැඩමුළු පවත්වා ඇත.
5. දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රේණිගත කිරීම සඳහා ATLAS මෙවලම භාවිතය සම්බන්ධයෙන් පළාත් විනිශ්වය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන් පළාත් 09හිම පවත්වා අවසන් කිරීම.

### 2.6.3. පළාත් සභා අංශය

**1. අරමුණ**

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා ක්‍රමයක් ඇති කිරීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. මධ්‍යම රජය හා පළාත් සභා අතර විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැගීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා මධ්‍යම රජයේ ආයතන සම්බන්ධ කර ගනිමින් අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව පැවැත්වීම.
2. පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා ඉඩම් අත්පත් කරගැනීම.
3. පළාත් සභා සඳහා අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම.
4. පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා දී ඇති නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා කටයුතු කිරීම.
5. කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 අනුව පළාත් රාජ්‍ය සේවයේ නව තනතුරු ඇති කිරීම.
6. සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම.

7. පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කිරීම.

8. පළාත් පාලන ආයතනවල GIS සහ GPS පද්ධතිය භාවිතා කරමින් භූගෝලීය දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.

9. පළාත් සභාවල කටයුතුවලට අදාලව ලැබෙන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කිරීම.

10. පළාත් සභාවල කටයුතුවලට අදාලව උපදේශක කාරක සභා වෙතින් ලැබෙන ලිපි සඳහා පිළිතුරු යොමු කිරීම.

11. පළාත් සභාවල කටයුතුවලට අදාලව මහජන පෙත්සම් කාරක සභාව වෙතින් ලැබෙන ලිපි සඳහා පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කිරීම.

12. පළාත් සභා සඳහා වාහන මිලදී ගැනීම සම්බන්ධව කටයුතු කිරීම.

13. පළාත් සභාවන්වල කටයුතුවලට අදාලව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ, ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම.

14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.

15. පළාත් සභා ධූරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම.

16. කාර්ය මණ්ඩල සමාලෝචනය පිළිබඳව පළාත් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

## 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය

1. ගරු පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් සමඟ සාකච්ඡා වාර 02ක් පවත්වා ඇත.

2. ඉඩම් අත්කර ගැනීමට අදාලව සියළුම පළාත් වෙතින් ඉල්ලීම් 33ක් මෙම අමාත්‍යාංශය වෙත පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ නිර්දේශය සහිතව යොමු කර ඇති අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 15ක් ඉදිරි කටයුතු සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අඩුපාඩු සහිතව යොමු කර ඇති අයදුම්පත් 11ක් අඩුපාඩු සකස් කර නැවත යොමු කරන ලෙස පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත දැනුම් දී ඇති අතර ඉතිරි ඉල්ලීම් 07 ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

04 වන වගන්තිය ප්‍රකාරව විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව නිලධාරීන් 04 දෙනෙකු පත් කිරීමද, විරෝධතා නොමැති බවට වූ නිර්දේශ 04ක් ඉඩම් අමාත්‍යාංශයට යොමු කිරීම ද, විරෝධතා පරීක්ෂණ වාර්තා අනුව නිර්දේශ 04ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම ද, ඉඩම් අත්පත් අරමුණු සංශෝධනය කිරීම් 01ක් සඳහා නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම ද, 38(අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්කර ගැනීමට අදාලව ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 06ක් ඉදිරිපත් කිරීමද 50(1) වගන්තිය යටතේ අත්හැරීම් 02ක් ද සිදු කර ඇත.

3. පළාත් සභා සඳහා අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල සංදේශ 03ක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

- පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු හතලිස් පහෙන් (45) පසුව ස්ථිර පත්වීි ලද විශ්‍රාම වැටුප් අහිමි සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම.

- පළාත් පාලන ආයතනවල සේවය කරනු ලබන තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගත් සේවකයින් ස්ථිර කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය.

- පළාත් පාලන ආයතන සඳහා කළමනාකරණ සේවාවක් ස්ථාපිත කිරීමේ අමාත්‍ය මණ්ඩල

තීරණය සංශෝධනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම.

4. පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා දී ඇති නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇති අතර ඒ සම්බන්ධව සියලුම පළාත් දැනුවත් කිරීම සඳහා අදාල චක්‍රලේඛ ලිපිය පළාත් වෙත යොමු කර ඇත.

5. පළාත් පාලන ආයතනවල සේවය කරන 2023.08.29 දිනට දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් 8,435කගේ සේවය ස්ථිර කිරීම සඳහා කටයුතු සිදුකර ඇති අතර, පළාත් පාලන ආයතන සඳහා දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු 2,542 ක් ඇති කිරීමට පළාත්වලින් ලද මු.රේ 71 අයදුම්පත් හා සාධාරණීකරන වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. (සබරගමුව පළාත 199, ඌව පළාත 337, නැගෙනහිර පළාත 873, මධ්‍යම පළාත 174, බස්නාහිර පළාත 587, වයඹ පළාත 372) දකුණු පළාතින් හා උතුරු මැද පළාතින් යොමු කර ඇති මු.රේ 71 අයදුම්පත් හා සාධාරණීකරන වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී.

6. සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව පළාත් වලින් ලද අයදුම්පත් 178 අතරින් අඩුපාඩු සහිත අයදුම්පත් 20ක් නැවත පළාත් වෙත යොමු කල අතර නිවැරදි ලෙස යොමු කර ඇති අයදුම්පත් 171ක් (2023 වර්ෂය අවසානයේ ලද අයදුම්පත් 13ක් ද ඇතුලත්ව) නිර්දේශ කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

7. අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීමට අදාලව පළාත්වලින් ගෙන්වා ගන්නා ලද තොරතුරු 2023.06.28 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2024.01.17 දින නැවත පළාත්වලින් නිර්දේශ කැඳවා ඇත. ඒ අනුව මධ්‍යම, සබරගමුව, නැගෙනහිර, දකුණ යන පළාත්වල තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අතර බස්නාහිර, වයඹ, ඌව, සබරගමුව, උතුර හා නැගෙනහිර පළාත්වල යටපත් කළ හැකි තනතුරු පෙන්වා දෙමින් නැවත නිර්දේශ එවන ලෙසට ප්‍රධාන ලේකම් වෙත නැවත ලිපි යවා ඇති අතර උතුරු මැද පළාත් සභාව තුල වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම අනවශ්‍ය බව දන්වා ඇත.

8. පළාත් පාලන ආයතනවල GIS සහ GPS පද්ධතිය භාවිතා කරමින් භූගෝලීය දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ වයඹ පළාත මේ වන විට එම පද්ධතිය නිර්මාණය කිරීමේ වැඩ අවසන් කර ඇති අතර, දකුණ , උතුරු මැද , ඌව , සබරගමුව , උතුර , බස්නාහිර යන පළාත් සිතියම්ගත කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. නැගෙනහිර හා මධ්‍යම යන පළාත් ඉදිරියේදී මේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිතව ඇත.

9. පාර්ලිමේන්තුවෙන් යොමු කර ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න 03න් පාර්ලිමේන්තු ප්‍රශ්න 01ක් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇති අතර, යොමු කල එක් ප්‍රශ්නයක් සාකච්ඡාව සඳහා නොගන්නා බව දැනුම් දුන් බැවින් ඒ සඳහා පිළිතුරු යොමු කර නොමැත. එක් ප්‍රශ්නයක් 2024 වසර අවසානයේ ලද අතර ඒ සඳහා පළාත් වෙතින් තොරතුරු කැඳවා ඇත.

10. උපදේශක කාරක සභා වෙත ඉදිරිපත් කර ඇති යෝජනා 03ක් සම්බන්ධව පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවීම සිදු කර ඇති අතර යෝජනා 02ක් සම්බන්ධව පිළිතුරු උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇති අතර ඉතිරි යෝජනාව සම්බන්ධව පළාතින් තොරතුරු ලද පසු උපදේශක කාරක සභාව වෙත පිළිතුරු යොමු කිරීමට කටයුතු කරනු ලබයි.

11. මහජන පෙත්සම් කාරක සභා ව විසින් එවා ඇති මහජන පෙත්සම් 09කට මෙම

අමාත්‍යාංශයේ නිර්දේශය මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කර ඇත.

12. පළාත් සභා සඳහා අවශ්‍ය වාහන ලබා ගැනීම සම්බන්ධව පළාත් වෙතින් යොමු කල අයදුම් පත් 05ක් නිර්දේශ කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත.

13. පළාත් සභාවන්වල කටයුතුවලට අදාලව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි හා අභියාචනා 126ක් සම්බන්ධව අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

14. පළාත් සභා ධුරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම සිදු කර ඇත.

15. කාර්ය මණ්ඩල සමාලෝචනය පිළිබඳව පළාත් මට්ටමින් පුහුණු වැඩමුළු පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර මේ වන විට වයඹ, දකුණු යන පළාත්වල වැඩසටහන් පවත්වා ඇත.

### 2.6.4. පළාත් පාලන අංශය

**1. අරමුණ**

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්ය සාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ එක් කිරීම මගින් සීග්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහිකිරීමට කටයුතු කිරීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. පළාත් පාලන ආයතන පද්ධතියෙහි අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය.

2. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය, සීමා මායිම් නිර්ණය කිරීම සහ ව්‍යුහය තීරණය කිරීමට අදාළ කටයුතු.

3. සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය යටතේ විදේශ රාජ්‍ය සමඟ ගිවිසුම්වලට එළඹීමේ දී අවශ්‍ය සහය ලබා දීම හා මාර්ගෝපදේශකත්වය ලබා දීම.

4. පළාත් පාලන ආයතන සඳහා අණපනත් හා නීති සම්බන්ධ අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබා දීම.

5. රාජ්‍ය ගිණුම්කාරක සභා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම හා සහභාගීත්වය.

6. පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව හා උපදේශකකාරක සභාවලින් ඉදිරිපත් වන ගැටලු සඳහා පිළිතුරු ලබා දීම.

7. පළාත් පාලන ආයතන සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබා දීම.

8. පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳව ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත කෙටුම්පත් ඉදිරිපත් කිරීම.

9. පළාත් පාලන ආයතන සඳහා කාර්ය සාධන මෙවලම හඳුන්වා දී ඒ අනුව පළාත් පාලන ආයතන ඇගයීමට ලක් කර ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීම.

10. රේඛීය අමාත්‍යාංශය ලෙස අවශ්‍ය අවස්ථාවල දී පළාත් පාලන කොමසාරිස්වරුන් හා සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් සම්බන්ධීකරණය කිරීම.

11. පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ කටයුතු හා සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.

12. පළාත් පාලන ආයතනවල කාර්යය හා කටයුතු ඒකීය ක්‍රමයකට පවත්වා ගැනීම උදෙසා අවශ්‍ය මඟ පෙන්වීම.

13. පළාත් පාලන ආයතන මධ්‍යම රජයේ ආයතන සමඟ සිදු කරන කටයුතුවල දී මැදිහත් වීම සහ සම්බන්ධීකරණය.

14. පළාත් පාලන ආයතන සම්බන්ධව ඉදිරිපත්වන අධිභාර අභියාචනා කමිටු පැවැත්වීම.

15. පළාත් පාලන ආයතන සඳහා පොදු මානව සම්පත් සංවර්ධන උපාය මාර්ග ක්‍රමයක් හඳුන්වා දීම.

16. පළාත් පාලන ආයතන ස්වයං මූලනය කිරීම සඳහා ක්‍රමෝපාය හඳුන්වා දීම.

17. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

18. මහජන පැමිණිලි සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා දීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ පළාත් ප්‍රධාන ලේකම්/ පළාත් පාලන කොමසාරිස්/ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීම.

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

**1. රාජ්‍ය ගිණුම්කාරක සභා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කිරීම.**

පළාත් පාලන ආයතනවල විගණන කටයුතු සම්බන්ධයෙන් නිසි මඟපෙන්වීමක් සිදු කරනු ලබයි.

**ප්‍රගතිය :**

2021 වර්ෂයේ පැවති ගිණුම්කාරක සභා රැස්වීම් නියෝග පරිදි සියලුම පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් හඳුන්වා දීමට අදාළව මේ වන විට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් යොමු කරන ලද කෙටුම්පත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතරතුර 2024/11/25 දිනැති ගැසට් නිවේදනය මඟින් භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනය කිරීමට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයක් සහ ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාශයට පත් කර ඇති බැවින් ඒ අනුව සියලුම පළාත් පාලන ආයතන සඳහා සැකසීමට නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඉදිරි සංශෝධන කටයුතු සිදු කර එය සැකසීමට නියමිතයි.

**2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජනතාව විසින් පාර්ලිමේන්තුව වෙත යොමු කරනු ලබන ගැටලු**

- **පාර්ලිමේන්තු ප්‍රශ්න**

පළාත් සභා හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමන් වෙතින් පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ගැටලු අදාල පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කර පළාත් වලින් ලබා ගන්නා නිරීක්ෂණ මත අදාල පිළිතුරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**ප්‍රගතිය :**

2024 වර්ෂය සඳහා ඉදිරිපත් වූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන 05ක් වන අතර, එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයා ඇත.

- **මහජන පෙත්සම් කාරක සභාව/අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

පළාත් පාලන ආයතන වෙතින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකි වන ඇතැම් පුද්ගලයන් හා කණ්ඩායම් විසින් මහජන පෙත්සම් කාරක සභාව සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මඟින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා අදාල පළාත් වෙතින් තොරතුරු ලබා ගෙන එම පුද්ගලයන්ට සහන සැලසිය හැකි පරිදි මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබයි.

**ප්‍රගතිය :**

2024 වර්ෂය සඳහා මහජන පෙත්සම් කාරක සභාව වෙතින් පෙත්සම් 09ක් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර එම පෙත්සම් 09ට අදාල පිළිතුරු මහජන පෙත්සම් කාරක සභා කාර්යංශය වෙත යොමු කර ඇත.

උපදේශක කාරක සභාව වෙතින් යෝජනා 08ක් ඉදිරිපත් වී ඇති අතර එම සියලු යෝජනා සඳහා ම පිළිතුරු උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇත.

**3. මහජන පැමිණිලි විමර්ශනය කිරීම.**

මහ නගර සභා 24, නගර සභා 41 හා ප්‍රාදේශීය සභා 276 ක් ලෙස පිහිටුවා ඇති පළාත් පාලන ආයතන වලින් මහජනතාව හා විවිධ ආයතන වෙත සපයන සේවා සම්බන්ධයෙන් අතෘප්තියට පත් වුවහොත් එවැනි අවස්ථාවක ඒ සම්බන්ධව මෙම අමාත්‍යාංශය වෙත මහජනතාව හා විවිධ ආයතන විසින් පැමිණිළි යොමු කරනු ලැබේ. එලෙස යොමු කරනු ලබන පැමිණිළි සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා දීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාල පළාත් ප්‍රධාන ලේකම්/ පළාත් පාලන කොමසාරිස්/ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කරනු ලැබේ.

| පළාත | ලැබු පැමිණිලි සංඛ්‍යාව | ගත් ක්‍රියා මාර්ගය |
|---|---|---|
| බස්නාහිර | 1256 | පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. |
| මධ්‍යම | 1074 | |
| දකුණු | 217 | |
| උතුරු | 33 | |
| නැගෙනහිර | 52 | |
| වයඹ | 249 | |
| උතුරු මැද | 163 | |
| ඌව | 310 | |
| සබරගමුව | 196 | |
| පොදු | 105 | අදාළ ආයතනවලට යොමු කිරීම. |
| **එකතුව** | **3655** | |

**4. අධිහාර සම්බන්ධ කටයුතු**

පළාත් පාලන ආයතන වල ගිණුම් විගණනය කිරීමේදී නීතියට පටහැනි සෑම ගිණුම් විෂයක්ම විගණකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කර එම කරුණු සම්බන්ධයෙන් බලය දෙන තැනැත්තන් විෂයෙහි අධිහාර පැනවීම සිදු කරනු ලැබේ.

එසේ අධිහාර කරනු ලබන අධිහාරකරුවන්ට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්ති ප්‍රකාරව දින 30 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක. තවද නගර සභා ආඥා පනතේ 255 අධිකාරය ප්‍රකාරව දින 30 ක් ඇතුළත හා මහ නගර සභා ආඥා පනතේ 252 අධිකාරය ප්‍රකාරව දින 14 ක් ඇතුළත රේඛීය විෂය භාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රගතිය :**

එලෙස මෙම අමාත්‍යාංශය වෙත ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් අභියාචනා කමිටුවක් මඟින් තීරණ ලබා දීමේ කටයුතු සිදු කරනු ලැබේ. මෙම වසර තුළ ලැබී තිබූ අභියාචනා 40 න් 30 ක් සඳහා මේවන විට තීරණ ලබා දී ඇත.

**4. පළාත් පාලන ආයතන ඩිජිටල්කරණය කිරීම**

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්ය සාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ එක් කිරීම මඟින් සීඝ්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහි කිරීමට කටයුතු කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. මේ සඳහා රු.මි. 30 ක් වෙන්කර ඇත.

**ප්‍රගතිය :**

පළාත් පාලන ආයතනවල මහජන සේවාවන් හා ගෙවීම් මාර්ගගතව පවත්වා ගෙන යාමට හා පළාත් පාලන ආයතන තුළ ආදායම් රැස් කිරීමට අදාළ ගිණුම් කටයුතු සඳහා නිර්මාණය කරන මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම සඳහා පුහුණු වැඩසටහන් පළාත් පාලන ආයතන 136ක පවත්වා ඇති අතර දැනට මෙම පද්ධතිය පළාත් පාලන ආයතන 74ක භාවිතා කරයි. තව ද දකුණු පළාතේ පළාත් පාලන ආයතන 49ක් සඳහා මෙම මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීමට නියමිත ය. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය රු.මි. 15.98 කි.

**6. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - 2024 අයවැය යෝජනා**

මෙමඟින් සංචාරක සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් මෙහෙයවීම හා නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය අරමුදල් සපයාගත හැකිවන ලෙස ආදායම් වර්ධනය කිරීම, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව ඇති සෘජු හා වක්‍ර ජීවනෝපාය මාර්ග වර්ධනය කිරීම හා එමඟින් ක්ෂේත්‍රයේ ආදායම් මට්ටම ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

**ප්‍රගතිය :**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වෙන් වූ මිලියන 1000ක මුදලින් ව්‍යාපෘති 92ක් අනුමත කර ඇති අතර ව්‍යාපෘති 48ක වැඩ අවසන් වී ඇත. ඒ අනුව 2024.12.31 වන දිනට භෞතික ප්‍රගතිය 84.44%ක් වේ. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය රු.මි. 453.10 කි. දෙසැම්බර් මස අගදී රු.මි. 150 ක ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතියකට මාරු කර ඇත.

**7. ස්වර්ණපුරවර සම්මාන උළෙල - 2023**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනතාවට කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීම මෙහි අරමුණයි. මේ සඳහා රු.මි. 5 ක් වෙන්කර ඇත.

**ප්‍රගතිය :**

සියලුම පළාත් පාලන ආයතන අනුකූලතාවය, කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය, සියලු කණ්ඩායම්වල ඇතුළත්භාවය හා නවෝත්පාදනය යන ක්ෂේත්‍ර යටතේ ලබා ගත් ලකුණු අනුව ශ්‍රේණිගත කර අවසන් කර ඇත. ඉහළම කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලද පළාත් පාලන ආයතන සඳහා සම්මාන ප්‍රදානය සිදු කරන ලදී. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.9 කි.

**පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**



**තිරුවිල් උද්‍යානය - වැල්වෙටිතුරායි**



**කච්තරිමුනායි සංචාරක ස්ථානය - පූනගරි**








**ස්වර්ණපුරවර සම්මාන උළෙල - 2023**

## 2.6.5. නීති අංශය

**1. අරමුණ**

රටේ සමස්ත ජනතාවගේ පොදු අපේක්ෂාවන් මුදුන්පත්වන ආකාරයට, ඵලදායීවූද , කාර්යක්ෂමවූද ජනතාවාදී ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යාම සහතික කරලීම සඳහාත්, සමානාත්මතාවයෙන් යුතු තිරසර මානව සංවර්ධනයක් ලඟා කර ගැනීම සඳහාත් පහසුකම් සළසාලීම සහ උපදෙස් ලබා දීම පිණිස අමාත්‍යාංශයේ නීති අංශය ස්ථාපිත කර ඇත.

**2. ප්‍රධාන කාර්යයන්**

1. පළාත් පාලනය සහ පළාත් සභාවලට අදාළ ජාතික මට්ටමේ නීති සම්පාදන කාර්යය.
2. ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේදී අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

3. පළාත් පාලන ආයතන/ පළාත් සභාවලට අදාළ අනු නීති සම්පාදන කටයුතුවලදී අවශ්‍යතාවය මත මාර්ගෝපදේශ සැපයීම් සහ සම්පත් දායකත්වය.

4. පළාත් පාලන ආයතන සංස්ථාපන ගැසට් නිවේදන ඇතුලු මධ්‍යම රජයේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් නිකුත් කළ යුතු නියෝග සම්බන්ධ කටයුතු.

5. අමාත්‍යාංශයට අදාළ ගිවිසුම් පරීක්ෂා කිරීම හා අදාළ නෛතික ගැටලුවලට උපදෙස් ලබාදීම

6. පාර්ලිමේන්තු තේරීම් කාරක සභා/ උපදේශක කාරක සභා ආංශික අධීක්ෂණ කමිටුවලදී අමාත්‍යාංශය නියෝජනය කිරීම.

7. අමාත්‍යාංශය හා සම්බන්ධ නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය/ පහළ අධිකරණ කටයුතු සම්බන්ධව අමාත්‍යාංශය වෙනුවෙන් පෙනී සිටීම. (මානව හිමිකම්/ ඔම්බුඩ්ස්මන් පැමිණිලි ඇතුලුව)

## 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්ය සාධනය

**1. මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම**

නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන ඇතුළත් කොට සකස් කරනු ලැබූ මහා නගර සභා සහ ප්‍රාදේශීය සභා අවසන් පනත් කෙටුම්පත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති වෙත යොමුකොට ඇත.

**2. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය මත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කිරීම.**

2023 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවන ලද නාමයෝජනා ආපසු කැඳවීම සහ නව නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලසීම සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (විශේෂ විධිවිධාන ) පනත් කෙටුම්පතක් සකස් කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා 2024/12/01 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර ඇත.

ඒ සඳහා ලද තීරණය අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත 2024.12.20 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලන ලදී. අනතුරුව එකී අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද තීරණය අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති වෙත යොමු කර ඇත.

**3. රජයේ අයවැය යෝජනා අනුව යෝජිත නව පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාළ ගැසට් නිවේදන පිළියෙල කිරීම.**

අයවැය පරාජයවීම හේතුවෙන් ආණ්ඩුකාරවරයා විසින් විසිරුවා හැර ඇති ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කර , එම ප්‍රාදේශීය සභාවේ ධුර කාලය 2024.11.05 දින ආරම්භ විය යුතු බවට නියම කරමින් හිටපු ගරු අග්‍රාමාත්‍යතුමිය/ අමාත්‍යතුමිය විසින් 2024.11.01 දිනැති අංක 2408/14 දරන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කර ඇත.

**4. පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී ඇති නව ගිණුම් ක්‍රමයට අදාළ රීති සකස් කිරීමේ වැඩසටහන.**

අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනලද විද්වත් කමිටුවක නිර්දේශ පරිදි සකස්කරන ලද පළාත් පාලන ආයතන සඳහා වූ මූල්‍ය හා පරිපාලන රීති සහ නියෝග සංග්‍රහයේ මෘදු පිටපත, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමඟ කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 289, නගර සභා ආඥා පනතේ 193 සහ

194, ප්‍රාදේශීය සභා පනතේ 171 සහ 184 වගන්තිවල ප්‍රතිපාදන ප්‍රකාර එක් එක් පළාතේ ක්‍රියාත්මක විය යුතු අනු නීති ලෙස ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශ කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරවරුන් සහ ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමුකර ඇත. එකී රීති මඟින් ප්‍රතිපාදන සලසා ඇති, පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදීමට නියමිත නව ගිණුම්ක්‍රමය ක්‍රියාත්මක කළ යුතු ආකාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක් ආසියානු පදනමේ සහයෝගීත්වයෙන් පළාත් නවය ආවරණය කරගනිමින් කොළඹ, අනුරාධපුරය සහ අවසාන වැඩසටහන 2024.12.17 දින ඔහිය දී පවත්වන ලදී.

**5. ජලභීතිකා ආඥා පනතේ සංශෝධන කටයුතු අවසන් කිරීම.**

අවසන් පනත් කෙටුම්පත සකස්කොට නීතිපතිගේ සහතිකය ලබා ගැනීම සඳහා යොමු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් නීතිපති විසින් සංශෝධන කිහිපයක් යෝජනා කර ඇත. එකී යෝජිත සංශෝධන ඇතුළත් කොට නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද කෙටුම්පත නිර්දේශ ලබා ගැනීම සඳහා 2024.11.26 දින කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.





### 2.6.6. පාලන හා පුහුණු අංශය

**1.අරමුණ**

මානව සම්පත් කළමනාකරණය හා ධාරිතාවන් සංවර්ධන කිරීමට කුසලතාවයන් සපිරි නිලධාරී පිරිසක් බිහි කිරීම සහ පවත්නා භෞතික සම්පත් උපරිම ඵලදායිතාවයෙන් යොදා ගනිමින් අමාත්‍යාංශයේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට සම්පත් මෙහෙයවීම.

**2. ප්‍රධාන කාර්යයන්**

- ***මානව සම්පත් කළමනාකරණය***

✓ අනුමත කාර්යය මණ්ඩලය යාවත්කාලීන කිරීම.
✓ අවශ්‍යතාවය අනුව නව තනතුරු ඇති කිරීම.
✓ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම, නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ කටයුතු, ස්ථාන මාරුවලට අදාළ කටයුතු.
✓ ගරු අමාත්‍යතුමන්ලාගේ තාවකාලික කාර්යය මණ්ඩලය පත්කිරීමට අදාළ කටයුතු.

- ***මානව සම්පත් සංවර්ධනය***

✓ දේශීය හා විදේශීය පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- **සාමාන්‍ය පරිපාලන කටයුතු**

✓ උපයෝගී සේවාවන් සපයා ගැනීමට (ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා) අදාළ කටයුතු.
✓ අමාත්‍යාංශයේ සියලුම වාහනවල ලියාපදිංචි කිරීම්, අනුයුක්ත කිරීම්, රක්ෂණය, නඩත්තුව, ඉන්ධන සම්බන්ධ කටයුතු හා සංචිත වාහන සැපයීමට අදාළ කටයුතු.
✓ තැපැල විධිමත්ව පවත්වාගෙන යාම.
✓ යන්ත්‍රෝපකරණ නඩත්තුව.
✓ තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතු
භාෂා පරිවර්තනයට අදාළ කටයුතු
✓ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතන කටයුතුවලට අදාළ අමාත්‍ය

මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත යොමු කිරීම සහ අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධ නිරීක්ෂණ සැපයීම.

- ✓ රජයේ නිලධරයන් ආණ්ඩුවට අමතර සේවා ඉටුකිරීම වෙනුවෙන් වන දීමනා සම්බන්ධ කටයුතු , අතිකාල දීමනා, නිවාඩු දින වැටුප් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 අනුව හදිසි අනතුරු වන්දි සම්බන්ධයෙන් වන කටයුතු, නිල ඇඳුම් හා විවිධ ගෙවීම් වලට අදාළ කටයුතු.
- ✓ නිවාඩු, ගමන් වියදම්, දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර, ගිවිසුම් හා බැඳුම්කර, රාජ්‍ය සේවක ණය යෝජනා ක්‍රම, අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ආදී පරිපාලන කටයුතු.
- ✓ රාජ්‍ය සේවයෙන් පරිබාහිර තනතුරු සඳහා මුදා හැරීමට අදාල කටයුතු.
- ✓ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාදීමට අදාල කටයුතු
- ✓ මාණ්ඩලික නිලධාරී රැස්වීම් පැවැත්වීම හා ශ්‍රවනාගාරය වෙන්කිරීම් වලට අදාළ කටයුතු.
- ✓ ලේඛනාගාරය පවත්වා ගැනීමට අදාළ කටයුතු.
- ✓ අමාත්‍යාංශ විමසීම් කවුළුව සහ දුරකථන හුවමාරුව විධිමත්ව පවත්වාගෙන යාම.

**3. කාර්යය මණ්ඩලය**

2024.12.31 දිනට යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු පහත පරිදි වේ.

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | | |
| 1 | අතිරේක ලේකම් | පාලන හා පුහුණු | විශේෂ | 1 | 0 | 1 |
| 2 | අතිරේක ලේකම් | සංවර්ධන | විශේෂ | 1 | 1 | 0 |
| 3 | අතිරේක ලේකම් | පළාත් සභා හා පළාත් පාලන | විශේෂ | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ ජනරාල් | ක්‍රමසම්පාදන | විශේෂ | 1 | 1 | 0 |
| 5 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | - | විශේෂ | 1 | 1 | 0 |
| 6 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පාලන හා පුහුණු | 1 | 1 | 1 | 0 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පළාත් පාලන | 1 | 1 | 1 | 0 |
| 8 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පළාත් සභා | 1 | 1 | 1 | 0 |
| 9 | ප්‍රධාන ගණකාධිකාරි | - | 1 | 1 | 1 | 0 |
| 10 | ගණකාධිකාරි | - | 1 | 1 | 1 | 0 |
| 11 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | 1 | 1 | 1 | 0 |
| 12 | අධ්‍යක්ෂ | ඉංජිනේරු/ සංවර්ධන | 1 | 1 | 0 | 1 |
| 13 | අධ්‍යක්ෂ | ඉංජිනේරු/ ජා.ස.අ.ක.ස.ම | 1 | 1 | 1 | 0 |

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 14 | අධ්‍යක්ෂ | ක්‍රමසම්පාදන | 1 | 1 | 0 | 1 |
| 15 | ප්‍රධාන නීති නිලධාරි | - | 1 | 1 | 0 | 1 |
| 16 | සහකාර ලේකම් | පාලන හා පුහුණු | 111/11 | 1 | 1 | 0 |
| 17 | සහකාර ලේකම් | පළාත් සභා | 111/11 | 1 | 0 | 1 |
| 18 | සහකාර ලේකම් | පළාත් පාලන | 111/11 | 1 | 1 | 0 |
| 19 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ජා.ස.අ.ක.ස.ම | 111/11 | 1 | 1 | 0 |
| 20 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ව්‍යාපෘති | 111/11 | 1 | 0 | 1 |
| 21 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | - | 111/11 | 2 | 3 | 0 |
| 22 | අභ්‍යන්තර විගණක | - | 111/11 | 2 | 0 | 2 |
| 23 | ගණකාධිකාරි | ගෙවීම් | 111/11 | 1 | 1 | 0 |
| 24 | ගණකාධිකාරි | සැපයුම් | 111/11 | 1 | 1 | 0 |
| 25 | ඉංජිනේරු | ඝන අපද්‍රව්‍ය | 111/11 | 1 | 1 | 0 |
| 26 | ඉංජිනේරු | සංවර්ධන | 111/11 | 1 | 0 | 1 |
| 27 | නීති නිලධාරි | - | 111/11 | 1 | 1 | 0 |
| 28 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 111/11 | 1 | 1 | 0 |
| **තෘතීය මට්ටම** | | | | | | |
| 29 | පරිපාලන නිලධාරි | - | අධිශ්‍රේණි | 1 | 0 | 1 |
| 30 | භාෂා පරිවර්තක | - | 1/ විශේෂ | 2 | 1 | 1 |
| 31 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | - | 11/1 | 1 | 1 | 0 |
| **ද්විතීය මට්ටම** | | | | | | |
| 32 | සංවර්ධන නිලධාරි | - | 111/11/1 | 82 | 72 | 10 |
| 33 | තාක්ෂණ නිලධාරි | - | 111/11/1 | 1 | 1 | 0 |
| 34 | කළමනාකරණ සේවා නිලධාරී | - | 111/11/1 | 40 | 20 | 20 |
| 35 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | - | 111/11/1 | 1 | 1 | 0 |
| 36 | නිශ්චල ඡායාරූප ශිල්පී | - | 111/11/1 විශේෂ | 1 | 1 | 0 |
| 37 | කැමරා ශිල්පී | | 111/11/1 විශේෂ | 1 | 1 | 0 |

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| **ප්‍රාථමික මට්ටම** | | | | | | |
| 38 | විදුලි කාර්මික | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 39 | රියදුරු | - | 111/11/1/විශේෂ | 18 | 14 | 4 |
| 40 | සංචාරක බංගලා භාරකරු/ ප්‍රධාන සුපවේදි | - | 111/11/1/විශේෂ | 2 | 2 | 0 |
| 41 | කාර්යාල කාර්ය සහායක | - | 111/11/1/විශේෂ | 21 | 18 | 3 |
| 42 | අත් උදවුකරු | | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 43 | සංචාරක බංගලා සහායක කණ්ඩලම සංචාරක බංගලාව | - | 111/11/1 | 1 | 1 | 0 |
| **එකතුව** | | | | **204** | **158** | **48** |

**ව්‍යාපෘති කළමණාකරණ ඒකකය**

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක ලේකම් | ව්‍යාපෘති අධීක්ෂණ | විශේෂ | 1 | 1 | 0 |
| 2 | ප්‍රසම්පාදන විශේෂඥ | ව්‍යාපෘති | (කොන්ත්‍රාත් පදනම) | 1 | 0 | 1 |
| 3 | උපදේශක ඉංජිනේරු | ව්‍යාපෘති | (කොන්ත්‍රාත් පදනම) | 1 | 0 | 1 |
| 4 | සංවර්ධන නිලධාරි | - | 111/11/1 | 7 | 7 | 0 |
| 5 | කළමනාකරණ සේවා නිලධාරී | - | 111/11/1 | 2 | 2 | 0 |
| 6 | රියදුරු | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 7 | කාර්යාල කාර්ය සහයක | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| **එකතුව** | | | | **14** | **12** | **2** |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 (1) යටතේ දෙපාර්තමේන්තුගත පත්වීම් ලෙස බඳවාගෙන ඇතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර නොමැති නිලධාරීන්

| | |
|---|---|
| කළමනාකරණ සහකාර | 20 |
| රියදුරු | 12 |
| කාර්යාල කාර්ය සේවක | 11 |
| **එකතුව** | **43** |

**4. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

| අ.අ. | කාර්යය / වියදම | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | වැයකළ මුදල (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01 | යන්ත්‍රෝපකරණ නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 3,500,000.00 | 3,337,170.60 | 95% |
| 02 | වාහන නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 22,000,000.00 | 19,370,107.69 | 88% |
| 03 | දේශීය හා විදේශීය පුහුණු (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 2,500,000.00 | 302,000.00 | 12% |
| 04 | ඉන්ධන ලබාදීම් (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 12,000,000.00 | 11,316,056.37 | 94% |
| 05 | ගොඩනැගිලි නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 24,000,000.00 | 437,190.00 | 2% |
| 06 | ජල හා විදුලි බිල්පත් ගෙවීම් (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 15,000,000.00 | 14,692,217.09 | 98% |
| 07 | තැපැල් හා සන්නිවේදන ගාස්තු (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 5,500,000.00 | 4,049,655.09 | 74% |
| 08 | බාහිර සේවා ලබාගැනීම් - සනීපාරක්ෂක සේවා → | 11,000,000.00 | 10,132,598.16 | 92% |
| | - ආරක්ෂක සේවා → | 4,300,000.00 | 3,118,386.19 | 73% |
| 09 | කාර්යය මණ්ඩලයේ වැටුප් වර්ධක ගෙවීම්, උසස් කිරීම්/ විශ්‍රාම ගැන්වීම් කටයුතු | - | - | 100% |
| 10 | කාර්යය මණ්ඩලවලට අදාළ රාජකාරී | - | - | ස්ථාන මාරුවීම් ලැබීගිය නිලධාරීන් සංඛ්‍යාව = 17<br>ස්ථාන මාරුවීම් ලැබී පැමිණි සංඛ්‍යාව = 12 |
| 11 | අමාත්‍ය කාර්ය මණ්ඩල පත්කිරීම් හා අදාළ කටයුතු | - | - | 100% |
| 12 | නිලධාරීන්ගේ පෞද්ගලික සුබසාධනය හා දුක්ගැනවිලි කළමනාකරණය සම්බන්ධ කටයුතු | - | - | පවතින සීමාවන් තුළ හැකි උපරිම අන්දමින් ඉටුකර ඇත. |
| 13 | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම | - | - | 100% |
| 14 | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ කටයුතු | - | - | 100% |

- **ජ්‍යෙෂ්ඨතාවයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.**

| **2024.12.31** වන විට තොරතුරු | | |
|---|---|---|
| තනතුර | දේශීය නිවාඩු ලබාගත් නිලධාරීන් ගණන | විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් ගණන |
| සංවර්ධන නිලධාරි | 01 | 06 |
| තාක්ෂණික නිලධාරි | - | 01 |
| කළමනාකරණ සේවා නිලධාරි | 01 | - |
| කළමනාකරණ සහකාර | 03 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 | - |
| රියැදුරු | 01 | 02 |
| **එකතුව** | **07** | **10** |

✠ ***තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට අදාළ තොරතුරු***

**1. අරමුණ**

පළාත් පාලන ආයතනවලින් සපයන මහජන සේවාවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සපයමින් මහජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට කටයුතු කිරීම හා තොරතුරු තාක්ෂණය භාවිතයෙන් අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු පහසු කිරීමට සහය වෙමින් කඩදාසිවලින් තොර පරිසරයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. භාවිතා කරන්නන්ට අදාළ තොරතුරු නිකුත් කිරීම සඳහා සතිපතා අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
2. දත්ත හා තොරතුරු රැස්කර දත්ත පද්ධතියක් සකස් කිරීම.
3. අමාත්‍යාංශයේ දැනට පවතින සම්බන්ධතා ජාල පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
4. අමාත්‍යාංශයේ අංශ සඳහා විවිධ තොරතුරු සඳහා තාක්ෂණ සහය ලබා දීම.
5. LGN 2.0 ව්‍යාපෘතිය සුපරීක්ෂාව හා සම්බන්ධීකරණය කිරීම.
6. අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම.
7. අමාත්‍යාංශයේ සියලුම කාර්යය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
8. විවිධ අංශවල අවශ්‍යතාවය අනුව මෘදුකාංග නිර්මාණය කිරීම හා එමඟින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළනැංවීම.

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

<table>
<tr><th>කාර්යයන්</th><th>ප්‍රගතිය</th></tr>
<tr><td>පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමට සකස් කරන ලද Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතිය</td><td>

මෙම ව්‍යාපෘතියට වෙබ් අඩවි දෙකකින් යුත් මෘදුකාංග පද්ධතියක් අයත්වේ.




මහජනතාවට elgservices.lk මගින් පළාත් පාලන ආයතනවලට කරන ගෙවීම් (වරිපනම්, කඩකුලී ආදිය) හා වෙන්කරගැනීම් මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවසේ සිටම ඉටුකර ගතහැකි පරිදි සකස් කර ඇත.

apps.elgservices.lk පළාත් පාලන ආයතනවල සියලුම ගිණුම් කටයුතු සඳහා සකස් කර ඇති අතර මෙමගින් පාරිභෝගිකයින් සඳහා ලදුපත් නිකුත් කිරිමේ සිට අවසාන ගිණුමට අවශ්‍ය වාර්තා ලබා ගැනිම දක්වා කාර්යයන් සිදුකළ හැක.

දැනට පළාත් 3ක ක්‍රියාත්මක වන මෙම පද්ධතිය මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන 40කත් සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 28කත් නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 19කත් වශයෙන් දිවයින පුරා පළාත් පාලන ආයතන 87 ක ක්‍රියාත්මක වේ.




තවද elgservices.lk වෙබ් අඩවිය මගින් මාර්ගගත ගෙවීම් ලබා ගැනීම සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ Payment Gateway සම්බන්ධ කර ඇත.




තවද මේ වන විට මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන 35කට හා සබරගමු පළාතේ පළාත් පාලන ආයතන10 කට මාර්ගගත ගෙවිම් ලබා ගැනීම සඳහා Payment Gateway පහසුකම බැංකු සමහ සම්බන්ධ වී ලබා දී ඇත.

</td></tr>
</table>




තවද, මෙම මෘදුකාංගය CAT2020 මෘදුකාංගයට සමාන කාර්යයන් ඉටු කරන බැවින් CAT2020 මෘදුකාංගය මිලදී ගැනීමේදී එක් පලාත් පාලන ආයතනයකට වැයවන රු. ලක්ෂ 11.5 යන මුදල මෙම මෘදුකාංගය මඟින් රජයට ඉතිරි කර දේ. ඒ අනුව ඉහත සඳහන් පලාත් පාලන ආයතන 87 තුළ මෙම මෘදුකාංගය ස්ථාපිත කිරීමෙන් මේවනවිට රු. මිලියන 100ක (87 x 11.5) මුදලක් රජයට ඉතිරිකර දී ඇත.

තවද, CAT2020 මෘදුකාංගය සඳහා වාර්ෂිකව නඩත්තු ගාස්තු ලෙස ලක්ෂ 2.5 ක පමණ මුදලක් වැයවන අතර එම මුදල ද මෙමඟින් ඉතිරි වී ඇත. ඒ අනුව 87 x 2.5 = රුපියල් ලක්ෂ 217.5 මුදලක් රජයට වාර්ෂිකව ඉතිරි කර දීමට හැකියාව ලැබී ඇත.

තවද මෙම පද්ධතිය මඟින් එක් එක් පලාත් පාලන ආයතනය ලබා ගන්නා ආදායම් විස්තර අමාත්‍යාංශයට නිරීක්ෂණය කල හැකි වීම. දැනට පළාත් පාලන ගිණුම් ක්‍රම සඳහා යොදා ගැනෙන නව ගිණුම් ක්‍රමය හා පැරණි ගිණුම් ක්‍රමය යන ගිණුම් ක්‍රම දෙකම මෙම මෘදුකාංගයට ඇතුලත් කර ඇත.

පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමට සකස් කරන ලද ව්‍යාපෘතියට අදාලව සිදුකරන ලද වැඩමුළු පහත පරිදි පවත්වා ඇත.

2024.01.19 දින යාපනය උතුරු පළාත් සභාවේදී
2024.01.30 දින අනුරාධපුර උතුරු මැද පළාත් සභාවේදී
2024.02.06 දින නැගෙනහිර පළාත් සභාවේදී
2024.03.05 දින රත්නපුර සබරගමුව පළාත් සභාවේදී
2024.04.04 දින Zoom තාක්ෂණය ඔස්සේ මධ්‍යම පළාත් සභාව සමඟ
2024.06.18 හා 2024.06.19 යන දෙදින නැගෙනහිර පළාත් සභාවේදී
2024.07.02 දින රත්නපුර සබරගමුව පළාත් සභාවේදී

පළාත් පාලන ආයතන මඟින් එක් රැස් කරනු ලබන වරිපනම් ආදායම ගණනය කිරීමට අදාලව මෘදුකාංග වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දත්ත විශ්ලේෂණය හා තොරතුරු රැස්කිරීම සඳහා වැඩමුලුවක් 2024.09.03 දින මාතලේ මහානගර සභාවේදී පැවැත්විය.

වරිපනම් ආදායම් ගණනය කිරීමට අදාලව වැඩි දියුණු කරන ලද මෘදුකාංගය පිලිබඳ සමාලෝචනය කිරීම සඳහා වැඩමුලුවක් 2024.10.30 දින නවයාලතැන්න පළාත් පාලන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විය.

පළාත් පාලන ආයතනවල ඇති ගැටලු නිරාකරණය කිරීම හා නව මෘදුකාංග නව පහසුකම් හඳුන්වාදීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහනක් 2024.09.10 දින ස්වදේශ කටයුතු අංශයේ දී පැවැත්විය.

තවද ඉහත පළාත් සඳහා මෙම මෘදුකාංගය භාවිතා කිරීම පිළිබඳ විවිධ විමසීම් හා ගැටළු ඉදිරිපත් කිරීමටත්, විවිධ උපදෙස් ලබාදීමටත් WhatsApp Group 3 ක් සකස් කර ඇති අතර එමගින් මේ වන විට 1,000කට අධික ගැටලු ප්‍රමාණයක් සඳහා පිළිතුරු සපයා ඇත.

| | |
|---|---|
| දෘඪාංග සහ මෘදුකාංග ගැටළු ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත කරුණු සඳහා සහය වීම | නඩත්තු කටයුතු සිදු කරන ලද පරිගණක සංඛ්‍යාව - 88<br>නඩත්තු කටයුතු සිදු කරන ලද මුද්‍රණ යන්ත්‍ර සංඛ්‍යාව - 12<br>නඩත්තු කටයුතු සිදු කරන ලද Scanner යන්ත්‍ර සංඛ්‍යාව - 01<br>**එකතුව 101**<br><br>එමගින් රජයට ඉතිරි කර දුන් මුදල = රු.1,086,500.00 |
| අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම | තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත.<br><br> |
| අමාත්‍යාංශයේ ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම | තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත.<br><br> |
| අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම | a) ලේඛණාගාරය සඳහා මෘදුකාංග පද්ධතියක් සකස් කර ඉදිරි කටයුතු සඳහා පාලන අංශය වෙත භාර දීම.<br>b) තොග කළමනාකරණ පද්ධතිය සකස් කිරීම හා හඳුන්වා දීම |
| Zoom රැස්වීම් සඳහා යොමු සකස් කිරීම හා තාක්ෂණික සහය ලබා දීම. | a) සකස් කරන ලද zoom යොමු ගණන = 280<br>b) සහභාගී වූ zoom / භෞතික රැස්වීම් ගණන = 302 |

### 2.6.7. මූල්‍ය අංශය

**1. අරමුණ**

පළාත් සභා හා පළාත් පාලන අංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයා දීම හා දේශීය සහ විදේශීය අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගනිමින් මහජන මුදල් පිළිබඳව විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. විසර්ජන පනත මගින් වෙන්කරනු ලැබූ මුදල් හා විදේශ ව්‍යාපෘති යටතේ වෙන්කරන ලද මුදල් එම වෙන්කරන ලද කාර්යයන් සඳහාම යොදවා ගනිමින් ද එසේ වෙන්කරන ලද මුදලේ අතිරික්තයක් වේ නම් වෙනත් අවශ්‍ය කාර්යයක් සඳහා මාරුකිරීම තුළින් සියලුම මුදල් ඵලදායීව වියදම් කර ඒ පිළිබඳ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු අවසාන ගිණුම (මූල්‍ය ප්‍රකාශන) නියමිත දිනට ඉදිරිපත් කිරීම.
2. පළාත් සභා සහ පළාත් පාලන අංශයේ අරමුණු හා ඉලක්ක සපුරාගැනීම පිණිස අවශ්‍ය භෞතික සම්පත් ප්‍රමාදයකින් තොරව ලබාදීම හා සියලුම වත්කම් නිසි පරිදි කළමනාකරණය කිරීම.
3. දේශීය සහ විදේශීය ව්‍යාපෘතිවල ගිණුම් වාර්තා, මාසිකව, කාර්තුමය සහ වාර්ෂික වශයෙන් භාණ්ඩාගාරයට නිසි වේලාවට ඉදිරිපත් කර කලට වේලාවට අරමුදල් ලබා ගැනීම.
4. අත්තිකාරම් බී ගිණුම යටතේ වෙන්වන ප්‍රතිපාදන මගින් රජයේ නිලධාරීන්ට ප්‍රමාදයකින් තොරව අවශ්‍ය ණය හා අත්තිකාරම් මුදල් ලබාදීමට කටයුතු කිරීම සහ ඒ සඳහා වූ ගිණුම් නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීම.
5. පළාත් සභා සහ පළාත් පාලන අංශයට අවශ්‍ය වන භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීමේදී මෙන්ම පළාත් පාලන බල ප්‍රදේශවල සංවර්ධන හා යටිතල පහසුකම් සැපයීමේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදී ඒ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිද භාවයකින් හා කාර්යක්ෂමව ඉටු කිරීම.
6. විගණකාධිපතිගේ විගණන විමසුම්වලට සහ අභ්‍යන්තරික වශයෙන් පැන නැගුණ විගණන විමසුම්වලට අප්‍රමාදව ප්‍රතිචාර දැක්වීම හා අනාවරණය කෙරෙන අඩුපාඩු නිවැරදි කරගැනීමට අප්‍රමාදව කටයුතු කර තිබීම සහ රාජ්‍ය ගිණුම්කාරක සභා අවස්ථාවට අවශ්‍ය අවස්ථාවන්හි දී පෙනී සිටීම.
7. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන කටයුතු සහ සේවාවන් සඳහා අප්‍රමාදව මුදල් නිදහස් කිරීම.
8. සිවිල් කොන්ත්‍රාත්තු, උපදේශන සේවා ඇතුළු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවලට අවශ්‍ය මූල්‍ය උපදෙස් ලබාදීම.

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**






### 2.6.8. වියදම් විමංසන අංශය

**1. අරමුණ**

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංසනය කිරීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. පළාත් සභා වෙත මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම හා පළාත් සභා හා පළාත් පාලන ආයතන වල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා ගැටළු සමාලෝචනය.
2. පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා විසින් උපයනු ලබන ආදායම් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීම් කිරීම හා වාර්තාකරණය.
3. පළාත් පාලන ආයතන වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් හා එම ආයතන විසින් උපයනු ලබන ආදායම් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීම් කිරීම හා වාර්තාකරණය.
4. පළාත් පාලන ආයතන සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය විමංසනය.
5. ආමාත්‍යාංශය විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති වාහන පැවරීම හා ඒ හා සම්බන්ධිත වෙනත් කාර්යයන් ඉටු කිරීම හා සම්බන්ධීකරණය.
6. විවිධ රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා බාහිර ආයතන හා පාර්ශවයන් විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඉල්ලුම් කරන දත්ත හා තොරතුරු ලබා දීම.
7. පළාත් පාලන ආයතන සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය විමංසනය.

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

1. 2024 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යනු ලබයි. 2024 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තුව සඳහා පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කර අවසන් කර ඇත. එලෙසම 2023 වර්ෂයේ දත්ත පදනම් කරගෙන 2023 වාර්ෂික පළාත් සභා මූල්‍ය කාර්යසාධන වාර්තාව සකස් කර අවසන් කර ඇත.
2. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පද්ධතිය 2024 වර්ෂය සඳහා යාවත්කාලීන කර ඇත.
3. පළාත් පාලන ආයතනයන්හි වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය 2024 වර්ෂයට අදාලව වාර්ෂිකව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යය සාධනය සම්බන්ධ 2023 වාර්ෂික වාර්තාව සහ 2024 අර්ධ වාර්ෂික වාර්තාව සකස් කර සියලුම

**පළාත් සභා හා පළාත් පාලන ආයතන මූල්‍ය කාර්යසාධන වාර්තා**







පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවා ඇත. පළාත් පාලන ආයතන වන මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වල පොදු පහසුකම් පිළිබඳ තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

4. මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

5. පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම,

6. පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක පාසල් පෝෂණ වැඩසටහන සඳහා පළාත් සභා සහ මහා භාණ්ඩාගාරය සම්බන්ධීකරණය කර ගෙවීම් කටයුතු සිදු කිරීම

7. පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය, දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා ඒකාබද්ධව විමංසනය කිරීම.

### 2.6.9. අභ්‍යන්තර විගණන අංශය

**1. අරමුණ**

අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේදී භෞතික හා මානව සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වන සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රම පවතින්නේද යන්න ඇගයීම හා එම පාලන ක්‍රමයයන්වල අගය එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහාවන මාර්ගෝපදේශ සැපයීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. විගණන සැලැස්ම අනුව විගණන අවධානම් ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන විගණන කටයුතු සිදු කිරීම.
2. මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
3. අභ්‍යන්තර විගණනය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා ඒ අනුව මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
4. කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම.
5. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම

අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් ගෙන්වාගත් දත්ත සමාලෝචනයකර 2023 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා මූල්‍ය සමාලෝචන කාර්තු වාර්තා සකස් කර අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කර ඇත. එලෙසම 2024 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු වාර්තා සහ 2024 තුන්වන කාර්තුව සඳහා පළාත් කිහිපයකට අදාළව මූල්‍ය සමාලෝචන වාර්තා සකස් කර අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කර ඇත.

4. අමාත්‍යාංශය මගින් පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති වාහන, පළාත් මට්ටමින් පැවරීම් කිරීම.

9. පළාත් පාලන ආයතනවල 2024 වර්ෂයේ අයවැය ලේඛන සහ 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා දත්ත ඇතුළත් දත්ත පදනමක් පවත්වාගෙන යාම

6. අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
7. අමාත්‍යාංශය යටතේ පවත්නා විදේශාධාර ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
8. රාජ්‍ය ගිණුම් කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී ඒ සඳහා සහභාගීවීම.
9. අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන සිදු කිරීම.
10. දේශීය ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
11. ඉදිරි වර්ෂය (2025) සඳහා විගණන සැලැස්ම පිළියෙල කිරීම
12. ඉදිරි වර්ෂය (2025) සඳහා අභ්‍යන්තර විගණනය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම

**3. 2024.01.01. සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

1. මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
2. 2024 වර්ෂය සඳහා සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කිරීම.
3. 2024 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනය අංශයේ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම.

4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2024.12.31 දක්වා මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
5. කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.
6. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් වාර 03 ක් පැවැත්වීම. (IV වන කාර්තුවට අදාළ රැස්වීම 2025.01.23 පැවැත්වීමට සැලසුම් කර ඇත.)
7. අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
8. අමාත්‍යාංශ ලේකම් විසින් පවරන ලද විශේෂ විගණන 03 ක් සිදු කිරීම.
(i) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නිවාඩු
(ii) අමාත්‍යාංශයේ ලේඛනාගාරයේ Software මෘදුකාංගය පවත්වාගැනීම
(iii) දේශීය ණය සහ සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් සිදු කිරීම.
9. 2025 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීම ආරම්භ කිරීම.
10. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව විගණනයන් සිදු කිරීම.

**වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රගතිය:-**

| අනු අංකය | විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය (%) |
|---|---|---|
| **1 වන කාර්තුව** | | |
| 01 | පුද්ගලික ලිපිගොණු පවත්වාගෙන යාම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 02 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 03 | ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තාව, අයවැය කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව, ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණනය | 100 |
| 04 | ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 05 | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 06 | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (පළාත් මාර්ග ව්‍යාපෘතිය) සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 (ව්‍යාපෘති අවසන් කිරීම හා වත්කම් පවරාගැනීමට අදාළව විගණනය කළ යුතු බැවින් විගණනය 4වන කාර්තුවේ සිදු කිරීමට නියමිතය) |
| **2 වන කාර්තුව** | | |
| 08 | සේවා ගිවිසුම් හා නඩත්තු කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 09 | වත්කම් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 10 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 11 | ගෙවීම් වවුචර් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 12 | පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංශනය කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 13 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන හා පුනරාවර්තන) සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 14 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 15 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපාතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 16 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |

| අනු අංකය | විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය (%) |
|---|---|---|
| **3 වන කාර්තුව** | | |
| 17 | අමාත්‍යාංශයේ වාහන පරිපාලන සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 18 | රාජ්‍ය නිලධාරීන්ගේ ඇප තැබීම, ඇප ලේඛන නඩත්තු කිරීම හා පුද්ගල ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 19 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 20 | ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 21 | තැම්පත් ගිණුම් ක්‍රියාකාරකම් සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 22 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2023 සහ 03/2023 මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි 2021 වර්ෂයේ ආරම්භ කළ නමුත් වැඩ අවසන් කිරීමට නොහැකි වූ කසල කළමනාකරණ ව්‍යාපෘතිවල වැඩ නිම කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණනය | 100 |
| 23 | පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදීමට නියමිත නව රීති, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 24 | පළාත් පාලන ආයතන සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 25 | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP) මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීමේ වැඩසටහන - 3 කොටස (GCWWMIP) ව්‍යාපෘති මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 3 කොටස (GCWWMIIP) ව්‍යාපෘති | 100 |
| **4 වන කාර්තුව** | | |
| 26 | මූල්‍ය කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 27 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 28 | ගෙවීම් වවුචර් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 29 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) විගණනය | 100 |
| 30 | පළාත් ආණ්ඩුකාර සමුළුව, අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව පැවැත්වීම හා විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම විගණනය | 100 |
| 31 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය විගණනය | 100 |
| 32 | සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය විගණනය | 100 |
| 33 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |

## 2.6.10. ක්‍රමසම්පාදන අංශය

### 1. අරමුණ

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අදාළ සැලසුම්, මාර්ගෝපදේශ හා ක්‍රමෝපායන් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම මෙන්ම සමාජ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ප්‍රතිපත්ති/ උපායමාර්ග/ සැලසුම්/ වැඩසටහන්/ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම හා ඊට අදාළ සෙසු කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ සෙසු අංශවලට අවශ්‍ය සහයෝගය ලබා දීම.

### 2. ප්‍රධාන කාර්යයන්

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම
2. කාර්යසාධන වාර්තාව සැකසීම
3. 2025 අයවැය කාරක සහා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන වාර්තාව සැකසීම
4. ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම
5. තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම
6. පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය (CDLG) යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ආසියානු පදනමේ තාක්ෂණික හා මූල්‍ය ආධාර මත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
7. නව විදේශීය ව්‍යාපෘතිවල ප්‍රාරම්භක කටයුතු සිදු කිරීම

### 3. 2024.01.01. සිට 2024.12.31 දක්වා කාර්යසාධනය

1. පළාත් සභා හා පළාත් පාලන අංශයේ 2024 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එය අවශ්‍ය පරිදි යාවත්කාලීන කර ඇත.

- ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ ඒ අංශ හා ආයතනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය කාර්තුමය වශයෙන් ලබා ගැනීම හා එම වාර්තා අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත.
- පළාත් සභා හා පළාත් පාලන අංශයේ 2025 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ආරම්භ කර ඇත.

2 අමාත්‍යාංශයේ 2023 වසරට අදාළ කාර්යසාධන වාර්තාව සකස් කර අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත.

3. අමාත්‍යාංශයේ 2025 වර්ෂයේ අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන 2024.12.31 දිනට අදාළ ප්‍රගතිය හා 2025 ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව සකස්කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

4. අමාත්‍යාංශයේ ආයතනික ප්‍රතිඵල රාමුව සකස්කර අවසන්ව ඇත.

5. අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන ඇති අතර අදාළ ආයතනවලට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත.

6. සැලසුම් ඒකකය යටතේ සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දත්ත විශ්ලේෂණ සහ දෘශ්‍යකරණ ඒකකය පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. අදාළ කළමනාකරණ දත්ත පද්ධතියේ සංවර්ධන කටයුතු නිමවෙමින් පවතී. ආසියානු පදනම විසින් එහි සංවර්ධන කටයුතු නිමකොට අමාත්‍යාංශය වෙත බාර දීමට කටයුතු කෙරෙමින් පවතී.

7. අමාත්‍යාංශය මගින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ පශ්චාත් ඇගයීමක් සිදු කර වාර්තාව එළිදක්වා ඇත.

8. කළමනාකරණ හා ඇගයීම් ක්ෂේත්‍රය ඇතුලු විවිධ ක්ෂේත්‍ර සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 22 ක් පවත්වා ඇති අතර ඒ සඳහා සහභාගිත්වය පන්සිය දෙනෙකු වේ.

9. අමාත්‍යාංශයේ පරිගනක හා මුද්‍රණ යන්ත්‍ර නඩත්තුව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන උපකරණ කට්ටල (Tool Kit) හා අමාත්‍යාංශයේ ප්‍රධාන ශ්‍රවනාගාරය සඳහා ස්මාර්ට් පුවරුවක් (Smart board) ලබා දී ඇත.

10. Capacity Building for Sustainable Management of Rural Water Supply Schemes under PS Managing Model (CapWass) - මෙම වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් අවසන් කර ඇත. ඒ අනුව අදාළ උප ව්‍යාපෘති නඩත්තු කිරීම සඳහා ඒ ඒ පාර්ශව අතර ගිවිසුම අත්සන් තබා ඇත.

11. සෙමාවුල් ව්‍යාපෘතිය (Saemaul Project) - පස් අවුරුදු සංවර්ධන වැඩසටහනෙහි සංකල්ප පත්‍රිකාව සකස්කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කිරීම. කොරියානු රජය වෙනුවෙන් සෙමාවුල් පදනම (Saemaul Foundation), මෙම අමාත්‍යාංශය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එක්ව ඇති කරගෙන ඇති ත්‍රයිපාර්ශවික ගිවිසුම යටතේ 2026 - 2031 කාලයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත පස් අවුරුදු ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන (ඇ.ඩො.මිලියන 10) සඳහා වන සංකල්ප පත්‍රිකාව සකස්කර එයට ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන ඇත.

12. සෙමාවුල් ව්‍යාපෘතියට (Saemaul Project) අදාළව ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමක් පවත්වා ඇත.

## 2.6.11. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

### 1. අරමුණ

විවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතන මඟින් ලබාදෙන ණය හා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති මනා අධීක්ෂණයකින් යුක්තවත් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකිවන ලෙසත් මෙහෙයවීම සිදු කිරීම.

### 2. ප්‍රධාන කාර්යයන්

1. විදේශාධාර ව්‍යාපෘති මෙහෙයවීමේ විධායක ආයතනය ලෙස විදේශාධාර ආයතන සම්බන්ධීකරණය (Doner Coordination) හා ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් එම ආයතන සමඟ සාකච්ඡා කිරීම. (Doner Negotiation).
2. ව්‍යාපෘති ගිවිසුම් පරීක්ෂා කිරීම, එම ගිවිසුම් ජාතික ප්‍රතිපත්තීන්ට අනුව නැවත සකස් කිරීම, අදාළ අනුමැතීන් ලබා ගැනීම හා ගිවිසුම්වලට එළඹීම.
3. ව්‍යාපෘති කාර්ය මණ්ඩල සේවා දිගු ලබා දීම ආදී මානව සම්පත් කළමණාකරණය.
4. විදේශාධාර ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පහසුකම් සැපයීම.
5. ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම සංවිධානය කිරීම හා ඉන් හඳුනාගන්නා ගැටළු විසඳීම සඳහා මැදිහත්වීම.
6. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, වාර්තා පිළියෙල කිරීම හා ඉන් නිරීක්ෂණය කරන දුර්වලතා / ගැටළු සම්බන්ධයෙන් මැදිහත්වීම.
7. විවිධ ආයතන මඟින් ඉල්ලුම් කරන වාර්තා සකස් කිරීමට අදාළ විශ්ලේෂණයන් සිදු කිරීම හා එම වාර්තා සකස් කිරීම.
8. ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, අනුමැතිය ලබා ගැනීම හා තීරණ ක්‍රියාත්මක කිරීම.
9. දූත මණ්ඩල රැස්වීම් (Mission) හා අනෙකුත් රැස්වීම් (Kick off Meeting, Wrap up Meeting, etc...) සඳහා සම්බන්ධවීම.
10. විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවය කරන විදේශ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට වීසා නිකුත් කිරීමේ කටයුතුවලට අදාළ සම්බන්ධීකරණය සිදු කිරීම.
11. ව්‍යාපෘතිවලට අදාළව මුදල් අමාත්‍යාංශය ඇතුළු විවිධ ආයතන මඟින් කැඳවනු ලබන රැස්වීම්වලට අදාළ ලේඛන සකස් කර ඉදිරිපත් කිරීම හා සහභාගී වීම.
12. සේවා යෝජකයා වශයෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ විවිධ ගැටළු හේතුවෙන් Dispute Board, බේරුම්කරණ මණ්ඩල (Arbitration) හා නඩු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

### 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය

1. 2024 වර්ෂයේ විදේශාධාර ව්‍යාපෘති සඳහා වෙන් වු රු.මිලියන 35,536.87 ක ප්‍රතිපාදන ඒ ඒ ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවා ඇති අතර දෙසැම්බර් මස අවසානය වන විට රු.මිලියන 24,321.99 ක මුදලක් උපයෝජනය කර ඇත.

2. පහත සඳහන් සියළුම ව්‍යාපෘතිවලට අදාළව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ ව්‍යාපෘති අධීක්ෂණ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සිදු කර ඇත.
   a) පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම)
   b) ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය- අදියර 5
   c) 1)මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
   2)මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන (කොටස 3)
   d) පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
   e) නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
   f) ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය
   g) සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය
   h) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය

3. මෙම ව්‍යාපෘති අතුරින් පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම), පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හා ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යන ව්‍යාපෘති මේ වන විට අවසන්ව ඇත.

4. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ පළාත්වලට අදාළ මූල්‍ය කළමනාකරණ, ප්‍රසම්පාදන සහ පාරිසරික හා සමාජ ආරක්ෂක කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහය සැපයීම හා අදාළ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කර ඇත.

5. විදේශාධාර ව්‍යාපෘතිවල සේවා දිගු ලබා දීම ඇතුළු අනෙකුත් ව්‍යාපෘති පරිපාලනමය කාර්යයන් ඉටු කර ඇත. ඒ අනුව, 2024 වර්ෂයේ සේවා කාලය සම්පූර්ණ වී ඇති තනතුරු සඳහා සේවා දිගු 125 ක් ලබාදී ඇත.

6. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශ ආධාර ව්‍යාපෘති වලට අදාල ප්‍රගතිය විශ්ලේෂණය හා පැන නැගී ඇති ගැටළු විසඳීම ඉලක්ක කර ප්‍රගති සමාලෝචන රැස්වීම් 15ක් හා ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 07 ක් මෙම වසර තුළ පවත්වා ඇත. එමඟින් ව්‍යාපෘතිවල ගැටලු නිරාකරණය සඳහා අදාළ මැදිහත්වීම් සිදු කර ඇත.

7. "ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය, පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය" යන ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ 08 ක් සකස් කර ඇති අතර එම අමාත්‍ය මණ්ඩල සංදේශ 08 සඳහාම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත.

8. 2024 වසරේ දෙසැම්බර් මස දක්වා දූත මණ්ඩල රැස්වීම් 14 ක් සඳහා අනුමැතිය (Mission Clearance) ලබා දීමට කටයුතු කර ඇත.

9. එමෙන්ම මෙම වසර තුල විදේශාධාර ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩලවල සේවය කරන විවිධ නිලධාරීන් හා ඔවුන්ගේ යැපෙන්නන් 229 ක් සඳහා වීසා පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.

10. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියට අදාළව සහ මේ වන විට වසා දැමූ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළව ද නඩු කටයුතු 04 ක්, Arbitration 03ක් හා Dispute Board 03 ක් පවතින අතර ඊට අදාළ නෛතික ලේඛන සැකසීම, අදාළ පරීක්ෂණ (hearings) සඳහා සහභාගී වීම, නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡා සඳහා සහභාගී වීම ආදී කටයුතු සිදු කර ඇත.

## 2.7. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන වැඩසටහන් හා ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

### 2.7.1. පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන)/ පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 13,500 (USD 67.84 Mn) |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ආසියානු සංවර්ධන බැංකුව - 12,190 – (USD 60 Mn) |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 6 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2017 / 2023<br>*මෙම ව්‍යාපෘතිය අවසන්ව ඇත. |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ<br>(පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | බස්නාහිර, වයඹ, දකුණු, ඌව, මධ්‍යම, උතුරු මැද පළාත් |

**5. ව්‍යාපෘතියේ අරමුණ**

ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම

**6. මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2024 වර්ෂය සඳහා වෙන් කිරීම | 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 13,500.00 | 13,107.34 | 97% | 400.00 | 331.33 | 82% | 13,438.67 | 99.5% |

**7. 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

2023.09.30 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ සියළුම භෞතික කටයුතු 100% ක් අවසන් කර ඇත.

### 2.7.2. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය (අදියර V)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි ) | 14,112 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | නෙදර්ලන්තය 14,112 |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | අවුරුදු 3 මාස 11<br>ජූලි 2021 සිට 2025 ජූලි 05 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | දිවයින පුරා |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. ජාතික ආර්ථික වර්ධනය අරමුණු කර ගනිමින් ග්‍රාමීය ජනතාවගේ ගමනාගමන පහසුව සහ ජීවන තත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම.
2. ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම.
3. ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.
- දැනට ආයතනයට අනුයුක්තව සිටින නිලධාරීන් සියලුදෙනා වෙතම විෂයානුබද්ධ හා ආයතනික කාර්යභාරය සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම මගින් එම නිලධාරියාගේ කාර්යන්ට නිවැරදි හා අවබෝධාත්මක කාර්යයක් ලබා ගැනීමට ඇති හැකියාව මත ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට අවකාශ ලැබෙනු ඇත.

- පුහුණුව හා සංවර්ධනයේ ඇති වැදගත්කම පිළිබඳ කතාබහ කිරීමේදී එය ප්‍රධාන කරුණු කිහිපයක් යටතේ පෙළ ගැස්විය හැකිය.

1) දුර්වලතා හඳුනා ගැනීම.
2) කාර්යන් ඉටු කිරීමේ ඵලදායිතාව හා ගුණාත්මකභාවය වැඩි කිරීම.
3) නව ක්‍රමෝපායන් සහ නිෂ්පාදන නවෝත්පාදනය.
4) අඩු සේවක පිරිවැටුම
5) සේවක තෘප්තිය හා විශ්වාසය රඳවා ගැනීම.

# 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.4 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | - | - |
| 2.5 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රිගත ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.8 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.9 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.10 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව විගණකාධිපතිගෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසුව වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කරන ලදි. | අනුකූල වේ. | - | - |
| 6.2 | සියළු අභ්‍යන්තර විගණන වාර්තාවලට මසක් තුළ පිළිතුරු සපයා ඇත. | අනුකූල නොවේ. | නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන විමසුම් 33 ට අදාළව<br><br>මසක් ඇතුළත විගණන විමසුම් 21 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.<br><br>විගණන විමසුම් 06 කට ප්‍රමාදවී පිළිතුරු සපයා ඇත.<br><br>විගණන විමසුම් 06 කට පිළිතුරු සපයා නැත. (ඉන් 02 ක් සඳහා දින දීර්ඝ ලබා දී ඇති අතර මේවන විට එක විමසුමක් සඳහා පිළිතුරු ලබා දී ඇත.) | විගණන විමසුම් හා වාර්තා සඳහා පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී දැනුවත් කිරීම<br><br>සිහි කැඳවීම් ලිපි යැවීම<br><br>දුරකථන මාර්ගයෙන් දැනුම් දීම |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (14) උප වගන්තිය ප්‍රකාරව සියළු අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ. | - | - |
| 6.4 | සියළු අභ්‍යන්තර විගණන වාර්තා මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ. | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 1/2019 අනුව වර්ෂය තුළ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් 04 ක් පවත්වා ඇත. | අනුකූල වේ. (IV වන රැස්වීම 2025.01.23 දින පවත්වන ලදී) | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්රෝමලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබද තොරතුරු කොම්ප්ට්‍රෝලර්ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ. | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ. | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | දෛනික ධාවන සටහන් සහ සංචිත වාහන පිළිබඳ මාසික සාරාංශ සකස් කළ අතර නියමිත දිනයේ දී විගණකාධිපති වෙත භාර දෙන ලදී . | අනුකූල වේ. | - | - |
| 9.2 | අභාවිත වාහන එම තත්ත්වයට පත්වී සය මසක් ගතවීමට පෙර අපහරණය කරන ලදී . | අනුකූල වේ. | ගර්හිත වාහන නොමැත. | - |
| 9.3 | වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගන්නා ලදී . | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.4 | සෑම රිය අනතුරක් සම්බන්ධයෙන් ම මු .රෙ.103,104,109 සහ 110 ප්‍රකාරව පියවර ගන්නා ලදී. | අනුකූල වේ. | - | - |
| 9.5 | 2016.12.29 දිනැති 30/2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන භාවිතය නැවත පරීක්ෂා කරන ලදී. | අනුකූල වේ. | - | - |
| 9.6 | කල් බදු පදනම මත මිලදී ගත් වාහන වල ලොග් පොත් වල පූර්ණ අයිතිය කල්බදු කාලසීමාව අවසන් වීමෙන් පසු පවරන ලදී. | අනුකූල වේ. | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ. | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ. | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ. | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ. | හිඟ ණය ශේෂ පහත පරිදි වේ<br>1. එම්.ටී.එස්.ගුනවංශ මයා හිඟ ණය ශේෂ - 143,200/- - නීතිපති දෙපාර්තමේන්තුවේ කොළඹ දිසා අධිකරණයේ DMR 4680/2019 අංකය යටතේ නඩු පවරා ඇත.<br><br>2. H.P.S.S. පතිරණ මයා හිඟ ණය ශේෂ - රු.10,476/- මාසිකව ණය ශේෂ නිරවුල් කරනු ලබයි. | නඩු තීන්දුවට අනුව ඉදිරි පියවර ගනු ලැබේ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබීම | අනුකූල වේ. | - | - |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | - | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදයමට බැර කර තිබීම. | - | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම | - | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත සේවක සංඛ්‍යාව අනුව කාර්ය මණ්ඩලය වෙත ගෙවීම් සිදු කරන ලදී | අනුකූල වේ. | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් වෙත ලිඛිතව රාජකාරි ලැයිස්තුවක් නිකුත් කරන ලදී | අනුකූල වේ. | - | - |
| 16.3 | 2017.09.20 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනතෙහි රෙගුලාසි අනුව තොරතුරු නිලධාරියෙක් පත්කර ඇති අතර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත් කාලීන කර පවත්වාගෙන යනු ලැබේ | අනුකූල වේ. | - | - |
| 17.2 | වෙබ් අඩවිය මඟින් ආයතනික තොරතුරු මහජනතාව වෙත සපයා ඇති අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ. | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | ආයතනය විසින් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ අංක 05 /2008 සහ 05/2008(1) ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ | අනුකූල වේ. | - | - |
| 18.2 | චක්‍රලේඛයෙහි 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සැකසීම සහ ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස්කර තිබේ | අනුකූල වේ. | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ඇමුණුම 02 අනුව මානව සම්පත් සැලැස්මක් සකස්කර තිබේ | අනුකූල වේ. | - | - |
| 19.2 | ඉහත මානව සම්පත් සැලැස්මෙහි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහා ම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සලසා තිබේ | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන අත්සන්කර තිබේ | අනුකූල නොවේ. | 2023.11.30 දිනැති රා.ප.ච.අංක 02/2018(1) හි 03 ඡේදය අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ. | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර ඔහු වෙත මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ වගකීම පවරන ලදී | අනුකූල වේ. | - | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | - | - |

## 1.4. අමාත්‍යාංශයීය සංවිධාන සටහන

**ඇමුණුම 01**

සංවිධාන ව්‍යුහය



## 3.9. විගණන වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/B/MPA/02/2024/10 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 30 දින

ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

පී.එම්.ආර්. පතිරාජ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩබලන විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/B/MPA/02/2024/10 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 30 දින

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරිම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 ආදායම්

අග්‍රිම ගැළපුම් ගිණුමට හර කර තිබූ අමාත්‍යාංශය වෙනුවෙන් වෙනත් ආයතන විසින් රැස් කරනු ලබන ආදායම, භාණ්ඩාගාර පරිගනක මුද්‍රිත හා සැසඳීමේදී රු.12,655ක වෙනසක් පැවතුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දෙසැම්බර් 31 දිනට පැවැති මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.14,373,881,123ක් වුවද සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට එහි වටිනාකම රු.14,332,949,202ක් ලෙස දක්වා තිබීමෙන් රු.40,931,921ක වෙනසක් විය. එමෙන්ම, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම් රු.15,717,369,276ක් සඳහා විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ඉදිකිරීම්වලින් පසුව 2024 මාර්තු 14 දින සිට උපයෝජනය සඳහා ලබාදී තිබුණු ගම්පහ නිල පියස ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වියදම රු.588,332,550ක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත නොකර නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි.

(ඇ) අමාත්‍යාංශයට අයත් බංගලා නිවාස 30ක හා සමූළු නිවාස 65ක ඉඩම් වටිනාකමද, බංගලා නිවාස 13ක හා සමූළු නිවාස 15ක ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමද, මූල්‍ය නොවන වත්කම් සඳහා ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ආරුගම්බේ සංචාරක බංගලාව හා එහි ඉඩම ස්වදේශ කටයුතු අංශයට පවරාගෙන තිබුණද එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ස්වදේශ කටයුතු අංශය සතුව පවතින වාහන 06ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) රජයේ ගොඩනැගිලි හා නිවාස වැනි වත්කම්වලින් උපයන කුලී ආදායම් 20.02.01.01 දරන ආදායම් සංකේතාංකයට බැර කළයුතු වුවද, එසේ කුලී ආදායම් ලබාගන්නා ගොඩනැගිලි හා නිවාස මොනවාද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නොපවතින බැවින් සම්පූර්ණ ගොඩනැගිලි හා නිවාස කුලී නිවැරදිව ගිණුම්ගත කර ඇති බව තහවුරු නොවුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ගොඩනැගිලි කුලිය රු.346,512,987ක් වූ අතර එය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී රු.59,167,654කින් හෙවත් සියයට 21කින් වැඩිවී තිබීමෙන් හිඟ කුලිය කාලීනව අයකර ගැනීම දුර්වල මට්ටමක පැවැතුණි. මෙම හිඟකුලී මුදලින් රු.168,499,955ක් 2021 වර්ෂයට පෙර සිට අයවිය යුතුව පැවතුණි. තවද, මෙම හිඟකුලී මුදලින් රු.30,383,153ක් මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුනි.

(i) 2017-2019 කාල පරිච්ඡේදය තුළ අවස්ථා 122කදී අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය සතු නිවාඩු නිකේතන 07කින් අයවිය යුතුව තිබුණු රු.2,102,450ක ආදායමක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) 2015-2018 කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.1,478,227ක් වූ ශේෂ 19ක් ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිටපු ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් 37 දෙනෙකුගෙන් රු.2,714,701ක හිඟ නිවාස කුලී මුදලක් අයවිය යුතුව පැවැතුණි.

(iii) සමුළු නිවාස 27කින් 2012 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළව අයනොවී පවතින හිඟ කුලී රු.2,158,417ක් ද ජයවඩනගම නිවාස 15කින් 2012 සිට 2021 දක්වා කාලයට අදාළව අයනොවී පවතින හිඟ කුලිය රු.8,767,895ක්ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම අයකර ගෙන නොතිබුණි.

(iv) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා නිවාසයකින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.6,837,470ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

(v) 2009-2016 කාලපරිච්ඡේදය තුළ ජනාධිපති ආරක්ෂක අංශයේ නිලධාරීන් වෙත ලබාදීමට ජනාධිපති කාර්යාලය වෙත ලබාදී තිබූ නිවාස 10කින් අදාළ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 වියදම් කළමනාකරණය

(අ) මූලධන වැය විෂයන් 06 ක් සඳහා රු. 6,050,000ක් හා පුනරාවර්තන වැය විෂයන් 10ක් සඳහා රු.16,850,000ක් වූ ප්‍රතිපාදන උපයෝජනය නොකර සම්පූර්ණයෙන් ඉතිරිව පැවතුණි.

(ආ) මූලධන වැය විෂයන් 09ක් සඳහා රු.240,900,000ක් වූ ප්‍රතිපාදනවලින් රු.163,266,450ක් හෙවත් සියයට 68ක් පමණද පුනරාවර්තන වැය විෂයන් 27ක් සඳහා රු.6,406,950,000ක ප්‍රතිපාදනවලින් රු.5,772,954,235ක් හෙවත් සියයට 90ක් පමණද අපේක්ෂිත කාර්යයන් සඳහා වැය නොකර ඉතිරිව පැවතුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 05කට මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ප්‍රතිපාදනද ඇතුළුව සලසා දී තිබුණු රු.147,500,000ක ප්‍රතිපාදනවලින් රු.114,170,019ක් හෙවත් සියයට 77ක් ද, ආයතන 02ක් සඳහා පුනරාවර්තන වැය විෂයයන් 03ක් යටතේ සලසා දී තිබුණු රු.41,000,000ක ප්‍රතිපාදනවලින් රු.34,399,957ක් හෙවත් සියයට 84ක් ද අපේක්ෂිත කාර්යයන් සඳහා වැය නොකර ඉතිරිව පැවතුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයන් 04ක් සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරුකරගෙන තිබූ එකතුව රු.4,692,500ක ප්‍රතිපාදනවලින් සියයට 38ත් සියයට 100ත් අතර පරාසයක වන පරිදි රු.1,941,884ක් ද, මූලධන වැය විෂයන් 04ක් සඳහා මාරුකර ගෙන තිබූ එකතුව රු.157,258,876ක ප්‍රතිපාදනවලින් සියයට 70ත් සියයට 100ත් අතර පරාසයක වන පරිදි රු.148,479,715ක් ද, 2016-2020 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කර තිබුණු පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහනෙහි බැරකම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු බිල්පත් පියවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මාරුකර තිබූ රු.124,383,923ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ද ඉතිරිව තිබුණි.

(ඉ) මු.රෙ. 66/69 යටතේ, ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක, විදේශ ණය මගින් මූල්‍යනය කරනු ලබන වැය විෂයයකින් රු.195,951,724ක ප්‍රතිපාදනයක් එම ව්‍යාපෘතියෙහි විදේශ ප්‍රදාන මඟින් මූල්‍යනය කරනු ලබන වැය විෂයයකට මාරු කර වැය කර තිබුණි. තවද ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක, විදේශ ණය මගින් මූල්‍යනය කරනු ලබන වැය විෂයයකින් රු.1,297,490,915ක ප්‍රතිපාදනයක් එම ව්‍යාපෘතියෙහිම විදේශ ප්‍රදාන මඟින් මූල්‍යනය කරනු ලබන වැය විෂයයකට මාරු කර වැය කර තිබුණි.

(ඊ) 2022 මාර්තු-ජූලි කාලය තුළ පැවැති ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 35 දෙනෙකුගේ වංවල දේපළවලට සිදුවී තිබූ හානි හේතුවෙන් රු.177,533,984ක් වන්දි ගෙවා තිබුණු අතර, ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොගෙන ඒ සඳහාම රු.216,146,000ක පරිපූරක ප්‍රතිපාදනයක් මගින් අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. මෙහිදී අවශ්‍ය ලියකියවිලි සම්පූර්ණ කිරීමට අපොහොසත් වූ මන්ත්‍රීවරුන් 06 දෙනෙකුගේ හානි වූ දේපළ වෙනුවෙන් රු.38,600,610ක මුදලක් බැරකම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(උ) පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 05ක් සඳහා සලසාගෙන තිබූ එකතුව රු.56,900,000ක මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය සියයට 339 කින් එනම් රු.193,055,725කින් වැඩිවී තිබුණි. එම එක් එක් වැය විෂයයන්හි මූලික වියදම් ඇස්තමේන්තුව සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය සියයට 142ත් සියයට 374ත් අතර පරාසයක පැවැතීමෙන් මුදල් රෙගුලාසි 50 අනුව ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කර නොතිබුණි.

### 3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2024 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ගෙවිය යුතු රු.20,281,657ක් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ බැරකමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XIX පරිච්ඡේදයේ 1.1 හා 1.2 වගන්ති | තනතුරු සඳහා නිවාස ඉදිකර, උපලේඛනගත කළ හැකි අතර 2003 ඔක්තෝබර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් දක්වා ඇත්තේ මෙම අමාත්‍යාංශයේ පාලනය යටතේ යම් අමාත්‍යාංශ හෝ |

දෙපාර්තමේන්තු හෝ නිලධාරීන් වෙනුවෙන් උපලේඛනගත නිවාස නොමැති බවයි. එසේ වුවද අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පොදු නිවාස 06ක් හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පොදු නිවාස 16ක් උපලේඛනගත කර ලබාදී තිබුණි.

(ii) XIX පරිච්ඡේදයේ 4.3.3

අමාත්‍යාංශය යටතේ පවතින රජයේ නිවාස ලබාදීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු වහාම පොරොත්තු ලේඛනගත කර නිවාස ලබාදීමට කටයුතු කලයුතු වුවත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2022 සැප්තැම්බර් 15 දිනැති අංක 20/22 දරණ චක්‍රලේඛය අනුව 2023 හා 2024 වර්ෂවලදී අයදුම්පත් කැඳවා තෝරාගත් නිලධාරීන්ට සමුළු නිවාස ලබාදී තිබුණි. තවද ගම්පහ නිල පියස නිවාස සංකීර්ණයේ නිවාස 32ක් අයදුම්පත් කැඳවා 2024 මාර්තු 14 දින නිලධාරීන්ට ලබා දී තිබුණද එම නිවාස සම්බන්ධයෙන්ද පොරොත්තු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

මුදල් රෙගුලාසි 756

අමාත්‍යාංශයට පමණක් සීමා වන පරිදි 2013 දෙසැම්බර් 13 දින ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදී තිබූ අනුමැතිය මත දිගින් දිගටම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම වෙනුවෙන් විශේෂ දීමනාවක් ගෙවා තිබූ අතර 2022, 2023, 2024 වර්ෂවලදී පිළිවෙලින් රු.358,000ක්, රු.225,000ක් සහ රු.283,500ක් වශයෙන් එය ගෙවා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක **30/2016** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

මාස 06කට වරක් වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතු වුවත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අංශ සතු වාහන 70ක එම පරීක්ෂාව කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඇ) | 2020 ඔක්තෝබර් 13 දිනැති අංක අමප/20/1432/303/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ (II) (ආ) | නිල මැදුර ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සඳහා අභ්‍යන්තර නඩත්තු ඒකකයක් ස්ථාපනය කරනු ලබන තෙක් සුදුසු ආයතනයක් තෝරා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද එවැනි ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. |

### 3.5 අවිධිමත් ගනුදෙනු

(අ) 2023 හා 2024 වර්ෂයන්හි අමාත්‍යාංශයෙන් බාහිර ආයතන 52ක මූලික විමර්ශන 56ක් පැවැත්වීම සඳහා සංවර්ධන නිලධාරීන් 21දෙනෙකුට සුදුසු දීමනාවක් ගෙවන ලෙස දන්වමින් නම් කර යැවීමට විමර්ශන අංශය කටයුතු කර තිබුණු අතර ආයතන 04ක විමර්ශන 04ක් පැවැත්වීම වෙනුවෙන් නිලධාරීන් 06 දෙනෙකු රු.530,800ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන හා 2014 මැයි 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2014 හි විධිවිධාන ප්‍රකාරව නිත්‍ය රාජකාරී යටතට නොගැනෙන මූලික විමර්ශනයක් පැවැත්වීම වෙනුවෙන් දීමනාවක් ලැබිය හැකි වුවත් එම විධිවිධානවලට පටහැනිව රාජකාරී වේලාව තුළ බාහිර ආයතනවල විමර්ශන පැවැත්වීම වෙනුවෙන් විවිධ චක්‍රලේඛයන්, විවිධ රේටයන් අනුව ගණනය කරන ලද ඉල්ලීම් අනුව දීමනා ලබාගෙන තිබුණු අතර එවැනි දීමනා ලබාගැනීමට නිලධාරියෙකුගේ ඉල්ලීමක් ආයතන ප්‍රධානියෙකු ප්‍රතික්ෂේප කර තිබූ අවස්ථාවක්ද පැවතුණි.

(ආ) 2022 නොවැම්බර් 28 දින ජනාධිපති කාර්යාලය වෙත පවරා දී තිබුණද, එහි නීත්‍යානුකූල අයිතිය අමාත්‍යාංශය සතු බෙන්ස් වර්ගයේ මෝටර් රථයක් රියදුරු විසින් පෞද්ගලික අවශ්‍යතාවක් සඳහා කොළඹ සිට ගාල්ල දිසාපති කාර්යාලයට යාමේදී 2023 දෙසැම්බර් 19 දින අධිවේගී මාර්ගයේදී අනතුරකට පත්ව තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකර රාජකාරී කටයුතු අතරතුර දී හදිසි අනතුරකට පත් වී ඇති බව සඳහන් කරමින් මිල ගණන් කැඳවීමකින් තොරව සේවා සැපයුම්කරුවකු තෝරාගෙන රක්ෂණාවරණය මත රු.13,000,000ක් අලුත්වැඩියාව සඳහා ගෙවා තිබුණි. අනතුර සිදුවීමෙන් මාස 09කට ඒ සඳහා ගෙවීම් කර තිබුණු අතර අලුත්වැඩියාවෙන් මාසයකට වැඩි කාලයක් රථය ගරාජයේ පැවති බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

### 3.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානවලට අනනුකූලව අදාල කාර්යය අවසන් කර දින 10ක් තුළ ලබාගත් අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 13කදී නිලධාරීන් 12 දෙනෙකු වෙත ලබා දී තිබූ රු.883,700ක් කාර්යය නිම කිරීමෙන් පසු පියවීමට දින 19- දින 53ත් අතර කාලයක් ගතකර තිබුණු අතර ලබාගත් කාර්යය සඳහා වැය නොකර සම්පූර්ණයෙන් ඉතිරිව තිබූ රු. 100,000ක් පියවීමට දින 15ක් ද ගතකර තිබුණි. තවද, ස්වදේශ කටයුතු අංශය විසින් අවස්ථා 14ක දී නිකුත් කර තිබූ රු. 457,740ක් වූ අත්තිකාරම් දින 10 ඉක්මවා දින 14 - 33 ත් අතර කාල පරාසයදී පියවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) 1993 සැප්තැම්බර් 21 දිනැති අංක 22/93 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වන්දි ලබා ගැනීම සඳහා වන්දි මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් 2023, 2024 වර්ෂවලදී අමාත්‍යාංශයට ලැබී තිබුණු වන්දි ඉල්ලුම්පත් 24ක් අතුරින් 11ක් අමාත්‍යාංශයට ලැබුණු දින සිට දින 119- 1297 අතර කාලයක් ගතවී තිබුණද, වන්දි මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ලබා දීමට නොහැකිව තිබුණු අතර තවත් ඉල්ලුම්පත් 05ක් වන්දි මණ්ඩලයට ඉදිරිපත් කිරීමට දින 60ත් දින 217ත් අතර කාලයක්ද එම ඉල්ලුම්පත්, අමාත්‍යාංශයට ලැබුණු දින සිට තීරණයක් ලබා දීම සඳහා දින 203-1008ත් අතර කාලයක්ද ගතව තිබුණි. වන්දි ඉල්ලුම්පත් 08ක් සම්බන්ධව ලබාදී තිබුණු වන්දි මණ්ඩල තීරණ අදාල පාර්ශව වෙත දැනුම් දීමට තීරණ දිනයේ සිට දින 28- 42 අතර කාලයක් ගතකර තිබුණි.

(ආ) පොළොන්නරුව නිල නිවාස සංකීර්ණය ඉදිකිරීමට අදාළව 2020 වර්ෂයේ වැය කර තිබුණු රු.125,863,728ක් මූල්‍ය නොවන වත්කම්වල නොනිමි වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණද, ඉදිකිරීමේ ඉදිරි කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.

### 4.2. විදේශ ආධාර ව්‍යාපෘති

(අ) යාපනයේ ඉන්කියුබේටර් (**Incubator**) සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ විදේශ ප්‍රදාන මගින් රු.50,000,000ක් ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.15,000,000ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද උපයෝජනය කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දිය රජය හා ශ්‍රී ලංකා රජය අතර වසර 04කට පෙර එළඹ තිබු අවබෝධතා ගිවිසුම 2022 පෙබරවාරි 21 දිනෙන් අවසන්ව තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මහ කොළඹ ජලය සහ අප ජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ යුරෝපීය ආයෝජන බැංකු ණය මගින් රු.3,000,000,000ක් හා විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.500,000,000ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, යුරෝපීය ආයෝජන බැංකුව වෙතින් අරමුදල් නොලැබීම හේතුවෙන් එම ප්‍රතිපාදන ඉතිරිව තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ වෙන්කරගෙන තිබුණු ප්‍රතිපාදනවලින් රු.18,256,008ක් පමණක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂ 02 තුළදී ද සළසාගෙන තිබුණු රු.1,977,034,807 ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව එක්ව ක්‍රියාත්මක කර තිබූ මහ කොළඹ ජලය සහ අප-ජලය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන 03 කොටස ක්‍රියාත්මක කිරීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ දේශීය අරමුදල් මඟින් සලසාගෙන තිබුණු රු.2,000,000,000ක සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

(ඈ) නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජයිකා ණය යටතේ රු.2,000,000,000ක් ද පරිපූරක ප්‍රතිපාදන යටතේ ප්‍රතිපූර්ණය කළහැකි විදේශ ණය රු.2,000,000,000ක් ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු. 500,000,000ක් ද වශයෙන් රු.4,500,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, රු.1,262,270,284ක් පමණක් වැයකර තිබීමෙන් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 72ක් වූ රු. 3,237,729,716ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ඉ) ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා එක්සත් රාජධානියේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.200,000,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිව තිබුණි. ඉකුත් වර්ෂයේදී ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සලසාගෙන තිබුණු රු.200,000,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

## 4.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

(අ) පළාත් පාලන ආයතන හරහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සලසා දී තිබූ රු.150,000,000ක ප්‍රතිපාදනවලින් රු 125,766,145ක් හෙවත් සියයට 84ක් ඉතිරිව තිබුණි. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සහා අරමුදල් භාවිතයෙන් ව්‍යාපෘතිය සිදුකර තිබීමත්, අනෙකුත් සභාවල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ආ) පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ සංවර්ධන වැඩසටහන සඳහා සලසාගෙන තිබුණු රු.600,000,000ක ප්‍රතිපාදනයෙන් රු.390,444,692ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය ඉටුකිරීමට කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉතිරිව තිබුණු අතර ඉන් රු. 79,039,683ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරුකර වැයකර තිබුණි.

(ඇ) "ඊ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සලසාගෙන තිබුණු රු.1,150,000,000ක් වූ ප්‍රතිපාදනවලින් ඉතිරිව තිබුණු සියයට 90ක එනම්, රු.1,032,579,107 ක ප්‍රතිපාදනවලින් රු.124,383,923ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර වැයකර තිබුණි. ව්‍යාපෘතියේ නියමු අදියර යටතේ රු.59,940,000ක් වැය කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක නිමකළ ව්‍යාපෘතීන් සම්පූර්ණයෙන් අක්‍රිය වී ඇති අතර එහි දෙවන අදියර ලෙස දිස්ත්‍රික්ක 07ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 95ක ආරම්භ කර ඇති ව්‍යාපෘති සඳහා 2024 වන විට රු.355,436,458ක් වැයකර තිබුණද අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) පළාත් පාලන ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සලසාගෙන තිබුණු රු.1,000,000,000ක මූලධන ප්‍රතිපාදනවලින් රු.150,000,000ක ප්‍රතිපාදන වෙනත් මූලධන වැය විෂයකට මාරුකර තිබුණු අතර, රු.396,893,978ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. ඒ අනුව, සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 55කට වැඩියෙන් එනම්, රු.546,893,978ක් වැය විෂයයේ අරමුණුගත කාර්යය ඉටුකිරීම සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඉ) 2023 නොවැම්බර් 14 දිනැති අංක 23/විවිධ(057) දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රජයේ ආයතන සතු නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා, සංචාරක කර්මාන්තයටද යොදාගත හැකි වන පරිදි උපරිම ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කිරීමට අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතුව සය පුද්ගල කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුවෙ නිර්දේශ මත අමාත්‍යාංශයේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නිවාඩු නිකේතන සංවර්ධනය සඳහා රු.600,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ඉන් අමාත්‍යාංශ යටතේ පවතින සංචාරක බංගලා 12ක් සංවර්ධනය කිරීම සඳහා වෙන්කර තිබුණු

රු.330,152,110ක ප්‍රතිපාදනවලින් රු.4,550,679ක් ද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා 09ක් සංවර්ධනය කිරීම සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු .64,282,884ක් ද පමණක් වැයකර තිබීමෙන් සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 89ක් වූ රු.531,166,437ක් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි.

**(ඊ) පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිවල ප්‍රගතිය**

(i) පුලතිසි අධ්‍යාපන විද්‍යා පීඨයේ ගුරු නේවාසිකාගාරය

රු.75,330,000ක වියදමින් ඉදිකල කාමර 72කින් සමන්විත පිරිමි ගුරුවරුන් සඳහා වන තෙමහල් නේවාසික ගොඩනැගිල්ලේ කාමර 41ක් ම නේවාසිකයින් නොමැතිව 2019 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

**(ii) අත්තනකඩවල මහා විද්‍යාලයේ ශ්‍රවනාගාරය ඉදිකිරීම**

2019 වර්ෂයේදී රු.18,200,000ක ඇස්තමේන්තු වටිනාකමක් යටතේ රු.27,050,000ක වියදමක් දරමින් ඉදිකර වැඩ අවසන් කර තිබුණද, අනෙකුත් උපකරණ අවශ්‍යතා සම්පූර්ණව නොතිබීමෙන් 2024 වර්ෂය අවසන් වන විටත් ශ්‍රවනාගාරය භාවිතයට ගෙන නොතිබුණි.

**(iii) පහල ඇල්ලේවැව මෙත්කුසුම්ගම ගම්මානය සඳහා ජල ටැංකියක් ඉදිකිරීම**

2018 වර්ෂයේ රු.2,320,196ක් වූ ඇස්තමේන්තු වටිනාකමක් යටතේ මෙත්කුසුම්ගම ගම්මානය සඳහා ලීටර් 40,000 ක ජල ටැංකියක් ඉදිකිරීමට රු.866,848ක් වැයකර කොන්ක්‍රීට් කණු පමණක් ඉදිකිරීමෙන් පසුව ඉදිකිරීමේ කටයුතු අතරමග නතර වී තිබුණි

**4.4 වත්කම් කළමනාකරණය**

(අ) 2024 සැප්තැම්බර් 27 දිනට අමාත්‍යාංශයේ භාවිතයේ නොතිබුණු සහ පොත්පත්,ලේඛන හා ලිපිගොනු තුළින් තොරතුරු සනාථ කර ගැනීමට නොහැකි වූ වාහන 80ක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණි. ඉන් වාහන 61ක් ඒවා භාවිතයට ගනු ලබන ආයතන වෙත විධිමත් පරිදි පවරා දීමට කටයුතු කර නොතිබුණු බව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් ලබාගෙන ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වාර්තා විය. ඉතිරි වාහන 19ක් සම්බන්ධව තොරතුරු නොතිබුණි. තවද, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නමින්

ලියාපදිංචි වාහන 76ක ලියාපදිංචි සහතික අමාත්‍යාංශය භාරයේ නොතිබුණු අතර ඉන් වාහන 19ක් පිළිබඳව ද තොරතුරු නොතිබුණි.

(ආ) 2010 වසරේදී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට රැගෙන එන ලද ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි වෙඩි නොවදින වාහනයක් අලුත්වැඩියාව සඳහා 2014 වර්ෂයේදී නියෝජිත ආයතනය වෙත භාර දී තිබුණු අතර, අලුත්වැඩියාව සඳහා වූ රු. 3,237,079ක බිල්පත ගෙවා වාහනය නිදහස් කර ගන්නා ලෙස දැනුවත් කර තිබුණද වාහනය පිළිබඳව ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් නියෝජිත ආයතනයට අයත් ඉඩමක ගාල් කර තිබුණි.

(ඇ) ස්වදේශ කටයුතු අංශය වෙනත් දෙපාර්තමේන්තු සතු වාහන හතරක් භාවිතා කරමින් තිබුණද එම අංශයේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන අංශය සතු නිවාඩු නිකේතන 07ක හා ස්වදේශ කටයුතු අංශය සතු සංචාරක බංගලා 35ක ඉඩම් අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) සිගාස් දත්ත පද්ධතියට අනුව ස්වදේශ කටයුතු අංශයේ වායුසමීකරණ යන්ත්‍ර 46 ක් හා විදුලි ජනක යන්ත්‍රයක් පැවති නමුත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එම වත්කම් භෞතිකව නොතිබුණි.

## 4.5 අනාර්ථික ගනුදෙනු

සෞඛ්‍යාරක්ෂිත ආපන ශාලාවක් හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.654,900කින්, රු.233,640ක් වැයකර මිලදී ගත් සෞඛ්‍යාරක්ෂිත ආහාර ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ සංඥා ප්‍රදර්ශන පුවරුවක් ද ව්‍යාපෘති යෝජනාවේ ඇතුළත්ව නොතිබුණු නමුත්, රු.365,092ක් වැයකර මිලදී ගත් අභල් 55 රූපවාහිනී යන්ත්‍රයක් හා නෙස්කැෆේ යන්ත්‍රයක්ද ආපන ශාලාවේ ස්ථාපිත කර තිබුණු අතර සවිකිරීමේ දෝෂ හේතුවෙන් ගැලවී වැටී තිබූ රූපවාහිනී යන්ත්‍රය ආපන ශාලාවෙන් ඉවත්කිරීමටද කටයුතු කර තිබුණි.ව්‍යාපෘති යෝජනාවේ ඇතුළත් සතියේ දින 05 සඳහා උදේ, දිවා සහ සවස සැපයිය යුතු සෞඛ්‍යාරක්ෂිත ආහාර වට්ටෝරු ආපන ශාලාව තුළ සපයා නොතිබීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

## 4.6 කළමනාකරණ දුර්වලතා

(අ) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 247 ඡේදයේ සඳහන් අරමුණු ඉටුවන ආකාරයෙන් ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කර නොතිබුණු අතර අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් නිලධාරීන් සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) එකම සේවා ස්ථානයක වසර 06කට වැඩි සේවා කාලයක් සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගෙන් ස්ථානමාරුවීම් සඳහා අයදුම්පත් යොමුකර තිබූ නිලධාරීන් පිළිවෙලින් 222ක්, 275ක් හා 75ක් වුවද ස්ථාන මාරු කිරීම් සිදුකර තිබුණේ නිලධාරීන් 80ක්, 91ක් හා 32ක් පමණි. එමෙන්ම, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ස්ථානමාරු කළහැකි නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) 2024 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක නිලධාරීන් 130,989කින් එකම සේවා ස්ථානයක වසර 05කට වැඩි කාලයක් සේවයේ යෙදී සිටි නිලධාරීන් 45,966කින් නිලධාරීන් 16,531ක්, 2025 වර්ෂයේ දී ස්ථානමාරු සඳහා අයදුම්කර තිබුණද, ඉන් 5,069ක් සඳහා පමණක් ස්ථානමාරු නියෝග ලබාදී තිබුණි. තවද, අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටින ඒකාබද්ධ සේවා නිලධාරීන් 157 දෙනෙකු වසර 05-10ත් අතර කාලයක්ද, තවත් නිලධාරීන් 44දෙනෙකු වසර 10-31ත් අතර කාලයක්ද ස්ථාන මාරු නොලබා අඛණ්ඩව එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී සිටිති.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 144,139ක් හා එහි තථ්‍ය සේවක සංඛ්‍යාව 130,989ක් ද වූ ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක නිලධාරීන්ගේ පත්වීම්, උසස්කිරීම් සහ මාරුකිරීම් පිළිබඳ බලධාරියා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වුවද ද, මෙම නිලධාරීන් පුහුණු කිරීම සම්බන්ධයෙන් සැලසුම් සහගත විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය සේවා පුහුණු ආයතනය වසා දැමීමෙන් පසු එම කාර්ය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැවරී තිබුණද අමාත්‍යාංශය හෝ එම ආයතනය මෙම නිලධාරීන් පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ 2008 වර්ෂයේ ලියාපදිංචි කරන ලද රාජ්‍ය සේවකයින් හා විශ්‍රාමික රාජ්‍ය සේවකයින් සාමාජිකත්වය දරන සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය, අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබයි. එහි ව්‍යවස්ථාවට අනුකූලව අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බලතල හා රාජ්‍ය සේවකයින් සම්බන්ධයෙන් අමාත්‍යාංශය සතු වගකීම් ප්‍රකාරව රාජ්‍ය පරිපාලන නීතිරීතිවලට සංගමය අවනත විය යුතු බව අමාත්‍යාංශය අවධාරණය කර තිබුණද වර්තමානයේදී රාජ්‍ය නොවන ආයතනයක් ලෙස මෙම ක්‍රීඩා සංගමය අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරව ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන්ම 2009 වර්ෂයේ අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණු පොල්හේන්ගොඩ පිහිටි හෙක්ටයාර 0.2437ක් වූ ඉඩම පවරාදීමේ කොන්දේසිවලට පටහැනිව 2010 වර්ෂයේදී ක්‍රීඩා සංගමයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා ලිඛිතව භාර දී තිබුණු අතර වසර 14කට අධික කාලයක් තිස්සේ ඉඩම හා එහි පවතින ගොඩනැගිලිවල අයිතිය, පැවැත්ම හා ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීමද ඉඩම තක්සේරු කර ගිණුම් ගත නොකිරීමද යාබද පදිංචිකරුවන්ගේ අනවසර අත්පත් කරගැනීම්ද නිරීක්ෂණය විය. මෙම සංගමයට, 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මත්පැන් බලපත්‍රයක්ද නිකුත් කර තිබුණු අතර සංගමයේ මතභේදාත්මක කටයුතු සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම අමාත්‍යවරයා හා ලේකම්වරයා දැනුවත් කර තිබුණි.

(ඈ) කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්තවීම මත යාපනය පොලිස් අධිකාරිවරයාගේ ඉල්ලීමකට අනුව පොලිස් නිලධාරීන් නිරෝධායනය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා කාමර 24කින් යුත් අමාත්‍යාංශය සතු යාපනය නිවාඩු නිකේතනය කිසිදු නෛතික එකඟතාවයකින් තොරව 2020 වර්ෂයේදී වසරක කාලයක් සඳහා යාපනය පොලිස් අධිකාරිවරයා වෙත ලබා දී තිබුණි. භාර දී මාස 05කට පසු නිවාඩු නිකේතනයට සිදුවී තිබුණු අලාභහානි හේතුවෙන් සියළු අලුත්වැඩියාවන් සිදුකර යථා තත්ත්වයට පත්කර නැවත භාර දෙන ලෙස අවස්ථා ගණනාවකදී අමාත්‍යාංශය විසින් යාපනය පොලිස් අධිකාරීවරයාට, පොලිස්පතිවරයාට සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුවත් කර තිබුණද, නිවාඩු නිකේතනය අලුත්වැඩියා කර නොතිබුණි. මෙම නිවාඩු නිකේතනයෙන් 2016- 2019 කාලපරිච්ඡේදය තුළදී රු.11,734,000ක ආදායමක් උපයා තිබුණද ඉන් පසු මේ දක්වා වසර 04කට අධික කාලයක් තුළ කිසිදු ආදායමක් උපයා නොතිබුණු අතර, සේවක වැටුප්, ජල ගාස්තු හා විදුලි ගාස්තු ගෙවීම සඳහා පමණක් රු.7,931,039ක් වැයකර තිබුණි.

(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ අනුමත උපරිම පෞද්ගලික කාර්යය මණ්ඩල නිළධාරීන් සංඛ්‍යාව 06ක් වන පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනෙකුගේ පෞද්ගලික කාර්යය මණ්ඩල නිලධාරීන් 1231ක් සඳහා වැටුප් ගෙවීමට වැයකර තිබුණු රු.508,015,904කින්

රු.11,741,387ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 85 දෙනෙකුගේ පෞද්ගලික කාර්යය මණ්ඩල නිලධාරීන් 142 දෙනෙකුට පත්වීම් දිනය හා වැඩ භාරගත් දිනය අතර කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් ගෙවීමට වැය කර තිබුණි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්යය මණ්ඩල නිලධාරීන්ට වැටුප් ගෙවීම සම්බන්ධව සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂාවකට අනුව, මෙම නිලධාරීන් වැටුප් ලබාගත්තද, ඒ බවට මු.රෙ. 238(5) ප්‍රකාරව වැටුප් ලේඛණවල අත්සන් කර නොතිබීම හා දිගින් දිගටම ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් වෙත වැටුප් ගෙවීම කර තිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

ආයතන සංග්‍රහයේ 13.3 ඡේදයට අනුව, වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණකාලීන නිලධාරියකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම නොපමාව කළයුතු බවත්, එසේ අවශ්‍ය නොවේ නම් තනතුරක රාජකාරී කටයුතු දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරීන් අතර බෙදා දිය හැකි බවත් දැක්වේ. එසේ වුවද, පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා සහ සේවයට නොපැමිණෙන නිලධාරීන්ගේ කාර්යයන් ඉටුකිරීම සඳහා වැඩ බැලීමේ පදනම මත 2023-2024 වර්ෂවලදී පත්කර තිබූ විධායක ශ්‍රේණියේ නිලධාරීන් 19දෙනෙකුට හා විධායක නොවන සේවාවල නිලධාරීන් 46දෙනෙකුට වැඩ බැලීමේ දීමනා වශයෙන් රු.4,748,892ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන් තනතුරු දෙකෙහිම සම්පූර්ණ රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර තිබුණි. මීට අමතරව, අමාත්‍යාංශයේ අනුමත ඉංජිනේරු, කාර්මික නිලධාරී සහ කාර්මික සහකාර තනතුරු සඳහා නිලධාරීන් බඳවා නොගෙන සතියකට දින කිහිපයක් වන පරිදි වැඩ බැලීමේ පදනම මත පත්කර තිබූ වෙනත් ආයතනවල නිලධාරීන්ට රු.559,898ක් ද, සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) තනතුර සඳහා 2018 වර්ෂයේ සිට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබූ සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරියෙකුට 2022 ජූලි 01 දක්වා රු.219,369ක් ද දීමනා වශයෙන් ගෙවා තිබුණි.

pm Rpm

පී.එම්.ආර්. පතිරාජ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩබලන විගණකාධිපති වෙනුවට.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව